# නියමුවා

ජනතා විමුක්ති පෙරමුණේ මධ්‍යම පුවත්පත

ISSN 1391 - 1031
2019 මැයි
25 වෙළුම 01 කලාපය

ආධාරය රු 40/=

පුවත්පතක් වශයෙන් ශ්‍රී ලංකාවේ ලියාපදිංචි කරන ලදී


*"ජනතාව සමග සම්බන්ධකම් ඇතිව සසංගත ලෙස වැඩ කිරීම සඳහා තහවුරු වීමෙහි සමත් වන පක්ෂයක්, දියුණු පංතියේ පෙරමුණු බල ඇණිය සංවිධානය කිරීමට සමත් වන එම පංතියේ පක්ෂයක්, නිර්ධන පංති ජීවයේ සෑම ලක්ෂණයක්ම කෙරෙහි සමාජ - ප්‍රජාතන්ත්‍රවාදී ජීව ගුණයෙන් බලපාන ආකාරයට ස්වකීය බලවේගයන් මෙහෙයවන පක්ෂයක් ජයගනු ඇත. කුමක් සිදු වුවත්, එවැනි පක්ෂයක් ජයගනු ඇත."*

**ලෙනින්**
**තෝරාගත් කෘති,**
**3වැනි වෙළුම,**
**170වැනි පිටුව**

# අන්තවාදී උමතුව පරාජය කිරීමට එක්ව නැගී සිටිමු!

ලේ කඳුළු, ගංගා ගලා ගියා වූ අතීතයක් පිළිබඳව රටේ අපමණ අත්දැකීම් ඇති බවද කිසිවෙකුටත් නැවතත් එවැනි පොළොවක් අවශ්‍ය නොවන බවද අන්තවාදී දේශපාලනය රට දීර්ඝ කාලීනව බෙදවාචකයකට ඇද දැමිය හැකි බවද පෙන්වා දුන් ජනතා විමුක්ති පෙරමුණේ නායක අනුර දිසානායක සහෝදරයා, පක්ෂයක් ලෙස ජ.වි.පෙ. සියලු සංවිධාන යාන්ත්‍රණ හසුරුවමින් තිබෙන්නේ ගම් මට්ටමින් ජනතාවගේ ආරක්ෂාව සඳහා කටයුතු කිරීමට බවත් මේ මොහොතේ සියලු භේද පසෙකලා මෙම අන්තවාදී උමතුව පරාජය කිරීමට එක්ව කටයුතු කරන ලෙස සියලුම ජනතාවගෙන් ඉල්ලා සිටියේය.

අනුර දිසානායක සහෝදරයා මෙම අදහස් පළ කළේ පසුගිය 26වැනි දින ජ.වි.පෙ. ප්‍රධාන කාර්යාලයේ පවත්වන ලද මාධ්‍ය සාකච්ඡාවකදීය. එහිදී වැඩිදුරටත් අදහස් දැක්වූ ඔහු මෙසේද කියා සිටියේය.

"21වැනිදා ප්‍රහාරය ඉස්ලාම් අන්තවාදී ම්ලේච්ඡ ප්‍රහාරයක් බව ඉතාම පැහැදිලියි. දැන් කළ යුතුව තිබෙන්නේ ඉස්ලාම් අන්තාවදී මතවාදය, ඊට හවුල් පුද්ගලයින්, සංවිධාන මුළුමනින්ම පරාජය කිරීම සඳහා කටයුතු කිරීමයි. මෙම ඉස්ලාම් අන්තවාදී මතවාදය තීරණාත්මකව පරාජයට පත් නොකොට රට යළි යථා තත්වයට පත් කළ නොහැකියි. මෛත්‍රීපාල සිරිසේන මහතා ජනාධිපතිවරයා ලෙසත් රනිල් වික්‍රමසිංහ අගමැතිවරයා ලෙසත් රටට, ජනතාවට වගකිවයුතු ආකාරයෙන් කටයුතු කරනු වෙනුවට බලය ලබාගත් දා සිට ඔවුන් ක්‍රියාත්මක වුණේ ශ්‍රීල.නි.ප. නායකයා ලෙස හා එ.ජා.ප. නායකයා ලෙස පමණයි. තමන්ගේ බල වුවමනාවන් වෙනුවෙන් කුළල් කා ගැනීම්, යටිකූට්ටු දේශපාලන කුමන්ත්‍රණ වෙනුවෙන් කාලය ගත කරමින් ඔවුන් රටේ ජාතික ආරක්ෂාව අනතුරක හෙළුවා. ඔවුන් දෙදෙනාම ක්‍රියාත්මක වුණේ තමන්ගේ වගකීමෙන් නිදහස් වෙමින් වෙනත් කෙනෙකු වෙත වගකීම පවරමින් තමන්ගේ බල දේශපාලන න්‍යායපත්‍රය ක්‍රියාත්මක කර ගැනීමටයි. ආණ්ඩුව ලෙස සිදුකළ ප්‍රකාශ ඉතාම පරස්පර, අසත්‍ය, ළදරු, අපරිණත ප්‍රකාශ බවට පත්වුණා. රටකට වැදගත් ජාතික ආරක්ෂාව සම්බන්ධයෙන් වගකීම බාර ගැනීමට තබා ඔවුන් සමුපකාරයක මුරකරු රස්සාවකටවත් නුසුදුසු පුද්ගලයින් බව ඔප්පු කළා.

මෙම සිදුවීමෙන් පසුව ජනතා විමුක්ති පෙරමුණේ ප්‍රවේශය වුණේ බොරදියේ මාළු බාමින් මෙම සිදුවීම දේශපාලන බල න්‍යාය පත්‍රයේ කොටසක් ලෙස ගෙන ඉන් වාසි ලබාගැනීම නොවේ. **02 වැනි පිටුවට**




ජ.වි.පෙ. ප්‍රධාන කාර්යාලයේ පැවති 2019 මැයි දින සැමරුමෙන්

## අන්තවාදයට එරෙහි ප්‍රබලතම සටන් පාඨය ගොඩනැගිය හැක්කේ වැඩකරන ජනතා සමගියෙන්



අගතිගාමී, අන්තවාදී මතවාදයන් පරාජයට පත් කළ හැක්කේ වැඩකරන ජනතාවට බවත් කවර හෝ ආගමික ජාතිවාදී ප්‍රවණතාවයන්ට රැකියාව කරන තැන යටත් වීමට ඉඩ නොදිය යුතු බවත් අවධාරණය කළ ජනතා විමුක්ති පෙරමුණේ නායක අනුර දිසානායක සහෝදරයා ආගමික අන්තවාදයට ජාතිවාදයට එරෙහි ප්‍රබලතම සටන් පාඨය ගොඩනැගිය හැක්කේ වැඩකරන ජනතාවගේ සමගියෙන් පමණක් බව ප්‍රකාශ කළේය.

වැඩිදුරටත් අදහස් දැක්වූ අනුර දිසානායක සහෝදරයා මෙසේද පැවසීය.

"අපේ රටේ තීව්‍රතම දේශපාලනය බවට පත්වී තිබෙන්නේ ජාතිවාදය සහ ආගම්වාදයයි. දෙමළ ජනතාව තුළ ජනප්‍රියතම දේශපාලනය දෙමළ ජාතිවාදයයි. මුස්ලිම් ජනතාව තුළත් ජනප්‍රියතම දේශපාලනය මුස්ලිම් ජාතිවාදය සහ අන්තවාදයයි. සිංහල ජනතාව තුළ **02 වැනි පිටුවට**

## අන්තවාදය පරාජය කිරීමට නව සමාජවාදී සමාජ ක්‍රමයක් අවශ්‍යයි



ධනවාදය තුළ විද්‍යාව වෙනුවට මිත්‍යාව වපුරන බවත් මිනිසුන් ආගමික අන්තවාදයන්ට ගොදුරු වී මරාගෙන මැරෙන තත්වයට පත්වෙන බවත් අධිරාජ්‍යවාදය ලෝකය එවැනි තත්වයකට පත්කර ඇති බවත් පෙන්වා දුන් ජනතා විමුක්ති පෙරමුණේ ප්‍රධාන ලේකම් ටිල්වින් සිල්වා සහෝදරයා ධනවාදී සමාජ ක්‍රමය අවසන් කර අන්තවාදය පරාජය කළ හැකි නව සමාජවාදී සමාජයක් බිහිකිරීම වෙනුවෙන් වැඩකරන ජනතාව ඇතුළු සියලු දෙනා සටන් කළ යුතු බව අවධාරණය කළේය.

වැඩිදුරටත් අදහස් දැක්වූ ටිල්වින් සිල්වා සහෝදරයා මෙසේද පැවසීය.

"ජනතා විමුක්ති පෙරමුණ තමයි මේ රටේ ජාත්‍යන්තර කම්කරු දිනය සමරන ආකාරය වෙනස් කරපු පක්ෂය. විනයක් **11 වැනි පිටුවට**

## අර්බුදයට විසඳුම වැඩකරන පංති නායකත්වය ඇති ජනතා පාලනයක් ගොඩනැගීමයි



රටක් අරාජිකත්වයට පත් කළ පාලකයන්ගෙන්ම ජනතාව විසින් නැවත ජීවිතවලට සහ දේපළවලට වගකිව හැකි රාජ්‍යයක් ඉල්ලා සිටීම මිථ්‍යාවක් බව කියා සිටි ජනතා විමුක්ති පෙරමුණේ දේශපාලන මණ්ඩල සභික කේ.ඩී. ලාල්කාන්ත සහෝදරයා මේ අර්බුදයට වැඩකරන පංති නායකත්වය යටතේ ජනතාවට වගකියන සහ ප්‍රතිලාභ ලැබෙන පාලනයක් ගොඩනැගීම හැර වෙනත් විසඳුමක් නොමැති බව අවධාරණය කළේය.

වැඩිදුරටත් අදහස් දැක්වූ ලාල්කාන්ත සහෝදරයා මෙසේද කීය.

"රටේ ඇතිවෙලා තියෙන තත්වය තුළ අපේ පක්ෂයේ ප්‍රධාන කාර්යාලයේ ප්‍රධාන ශාලාවේ මැයි දිනය සැමරීම අමුත්තක් හැටියට සලකන්න අවශ්‍ය නැහැ. අපේ ඉතිහාසයේ අලුත් තත්වයන්ට මුහුණ දීලා මේ වගේ මැයි දින සැමරුම් කර තිබෙනවා. **02 වැනි පිටුවට**


**03 ධනවාදයේ අර්බුදය...**



ධනවාදය තුළ මිනිසුන් තුළ මතුවන අසහනය හා ප්‍රතිවිරෝධයත් අන්තවාදයන් ඔස්සේ පුපුරා...

**04 එන වේගයට වඩා වැඩි...**



අප සාකච්ඡාවට ලක් කළ ආයෝජන දර්ශකයේ වත්මන් ස්වභාවය අනුවද ඉතා පැහැදිලි වන්නේ...

**07 ඉතිහාසය තුළ...**



දේපළවල පෞද්ගලික අයිතිය ඇතිවන විට එහි අයිතිය අත්පත් කරගත්තේ වංශය තුළ සිටි....

**08 අලි - මිනිස් ගැටුමේ...**



අලි මිනිස් ගැටුම අවම කිරීම සඳහා දියුණු සංවර්ධන ක්‍රියාදාමයන් සහිත පරිසර ප්‍රතිපත්තියක්...

සංවාදය.................. 05
ආවර්ජනා.................. 06
වේදිකාව.................. 09
විශේෂ.................. 10


**යුක්තිගරුක දේශයක්! සාධාරණ සමාජයක්!! නිවහල් මිනිසෙක්!!!**

# ජනතා විමුක්ති පෙරමුණේ මැයි දින පණිවිඩය 2019

මැයි මස 1වැනිදාට යෙදී ඇති ජාත්‍යන්තර කම්කරු දිනය ලොව පුරා වැඩකරන ජනතාව ඇතුළු පීඩිත ජනතාව විසින් මහත් අභිමානයෙන් යුතුව සමරනු ලබන දිනයකි. මැයි දිනය යනු වැඩකරන ජනතාවගේ ශක්තිය, සමගිය හා සටන්කාමීත්වය විදහා පෙන්වන හා සිය අයිතිවාසිකම් හා නව සමාජයක් වෙනුවෙන් සටන් කිරීමේ ආදර්ශය පෙන්වන දිනය වේ. ජාත්‍යන්තර කම්කරු දිනය නිර්මාණය වූයේ මෙයට වසර 133කට පෙර 1886දී ධනවාදයේ පීඩනයට හා සූරාකෑමට එරෙහිව පැය 08ක වැඩ දිනයක් ඉල්ලා චිකාගෝ නුවර කම්කරුවන් විසින් දියත් කළ අරගලය පදනම් කර ගනිමිනි. එම අරගලයේදී දිවි පිදූ කම්කරු නායකයන් සිහිකිරීම වෙනුවෙන්, මැයි 01 ජාත්‍යන්තර කම්කරු දිනය ලෙස නම් කරන ලද්දේ, 1889 පැරිසියේදී රැස්වූ දෙවන ජාත්‍යන්තරයේ පළමු සමුළුව විසිනි. එබැවින් මැයි දිනය යනු කම්කරු පංතිය ප්‍රමුඛ වැඩ කරන ජනතාවටත් වමේ ව්‍යාපාරයටත් අයිති දිනයකි.

මෙවර ලාංකේය වැඩකරන ජනයා ප්‍රමුඛ පීඩිත ජනතාවට මැයි දිනය සැමරීමට සිදුව ඇත්තේ, පසුගිය අප්‍රේල් 21වැනිදා සිදුවූ මහා මිනිස් ඝාතනයක කම්පනය මැදය. ඒ නිසාම මෙවර මැයි දින සැමරුම, පෙළපාළිය හා විශාල රැලිවලින් තොර සීමිත අවකාශයක පැවැත්වීමට සිදුව තිබේ. ධනවාදයේ අර්බුදයත් ධනපති ආණ්ඩුවේ අසමත්කමත් වගකීම් විරහිතභාවයත් තුළ අනාරක්ෂිත තත්වයකට ඇද දැමූ රටක මෙවැනි තත්වයන්ට මුහුණ දීමට සිදුවීම පුදුමයක් නොවේ.

කෙසේ වෙතත් 2019 ලෝක කම්කරු දිනය සමරන මේ මොහොත වන විට අධිරාජ්‍යවාදයත් ලෝකය පුරා ධනවාදයත් ධනපති සමාජ ආර්ථික ක්‍රමයත් තම අසාර්ථකත්වය සහ දුෂ්ටත්වය වඩ වඩාත් වැඩියෙන් පෙන්වමින් සිටී. චිකාගෝ කම්කරු සගයින් දිවි පුදා සටන් කොට දිනාගත් පැය 08 වැඩ දිනයද අහෝසි කරමින් සිටින ඔවුහු විවිධ නීති මගින් එම පැය 08ක වැඩ දිනයේ අයිතිය පවා යළි උදුරා ගැනීමට කැස කවමින් සිටිති. ධනවාදය තුළ තවදුරටත් වැඩකරන ජනතාව ඇතුළු පීඩිත ජනතාවගේ අයිතීන් රැකගත නොහැකි බවත් දිනා ගත් අයිතිය පවා ධනපති ක්‍රමය තුළ අහෝසි වෙමින් තිබෙන බවත් භාවිතයෙන් ඔප්පු වී අවසන්ය. එබැවින් ධනවාදය ලෝක පරිමාණයෙන් පරදා නව සමාජයක් වෙනුවෙන්, වැඩකරන ජනතාවගේ පාලනයක් වෙනුවෙන් සංවිධානය වීම හැර අන් විකල්පයක් දැන් වැඩකරන ජනයා ප්‍රමුඛ පීඩිත ජනයාට ඉතිරි වී නැත.

මේ මොහොත වන විට ලෝකයේත් ලංකාවේත් ධනපති ක්‍රමය පවතින්නේ, විසඳිය නොහැකි අර්බුදයකය. දිනෙන් දින උග්‍රවන ධනවාදයේ අර්බුදය විසින් වැඩකරන ජනතාව මත මහා බරක් පටවනු ලැබ තිබේ. ඔවුන් මත බදු බර පැටවීමත් රැකියා අහිමි කිරීමත් වැටුප් ඇතුළු අයිතීන් කප්පාදු කිරීමත් දිගටම සිදු වේ. ඉන් වැඩකරන ජනයා ඇතුළු පීඩිත ජනතාව විශාල දුෂ්කරතාවන්ට ලක්ව සිටියි.

අනෙක් අතට ඇමරිකා එක්සත් ජනපදය ප්‍රමුඛ අධිරාජ්‍යවාදීහු ලෝකයේ රටවල සම්පත් කොල්ලකෑම සඳහා විශේෂයෙන් මැදපෙරදිග තෙල් සම්පත කොල්ලකෑම සඳහා මෙන්ම එම රටවලට යුද අවි වෙළඳාම් කිරීම සඳහා එම රටවල් එකිනෙකා කොටවීම, ඒවා ආක්‍රමණය කිරීම, තර්ජනය කිරීම දිගටම කරගෙන යමින් සිටිති. ඒ සඳහා විවිධ අන්තවාදී කල්ලි පෝෂණය කරමින් සැබැවින්ම ත්‍රස්තවාදයේ නියැලෙන අධිරාජ්‍යවාදීහු ඒ අතරම ත්‍රස්තවාදය මැඩලීමට යයි පවසමින් වෙනත් රටවලට බලහත්කාරයෙන් කඩා වදිමින් ධනවාදී ලෝකය යළි ම්ලේච්ඡත්වය වෙත රැගෙන යමින් සිටිති. ධනපති ක්‍රමයේ පීඩාව විසිනුත් අධිරාජ්‍යවාදයේ දුෂ්ට අරමුණු විසිනුත් නිර්මාණය කර ඇති විවිධ ආගමික වාර්ගික උමතු අන්තවාදී කල්ලිවල ම්ලේච්ඡ ඝාතන නිසා පීඩාවට පත්වන්නේ ලොව පුරා ජීවත්වන අහිංසක නිරායුද ජනතාවය. මෙය ලොව පුරාම දැකිය හැකි තත්වයක්ව තිබේ. පසුගියදා ලංකාව තුළ මතුවූයේද එම අන්තවාදීන්ගේ ම්ලේච්ඡත්වයමය. ඉන් පීඩාවට පත්වූයේද වැඩකරන ජනතාව ඇතුළු පොදු ජනතාවමය. මෙම ම්ලේච්ඡ ප්‍රහාරවල අවසන් වාසි ලබාගන්නේ අධිරාජ්‍යවාදීනුත් ධනපති පාලක කණ්ඩායම් හා විවිධ අන්තවාදී හා ප්‍රතිගාමී කණ්ඩායම්ය. වැඩකරන ජනතාව මේ පිළිබඳව වඩාත් වගකීම් සම්පන්නව කටයුතු කළ යුත්තේ ඒ නිසාය.

මේ තත්වය තුළ අධිරාජ්‍යවාදයටත් අන්තවාදයේ ම්ලේච්ඡත්වයටත් එරෙහිව සමාජ ප්‍රගතිය සඳහා පෙරමුණ ගැනීමේ වගකීම පැවරී ඇත්තේ, වැඩකරන ජනතාව ප්‍රමුඛ පීඩිත පංතියටය. අධිරාජ්‍යවාදයත් ධනවාදයත් පරදා සමාජවාදය වෙනුවෙන් වන අරගලයට නව පණක් දීම හැර ධනවාදී ලෝකය මුහුණදී ඇති අර්බුදයෙන් මිදීම සඳහා ලෝක වැඩකරන ජනතාව ඉදිරියේ අන් විකල්පයක් නැත. මෙම මැයි දිනයේ ලොව පුරා වැඩකරන ජනයාගේ අදිටන විය යුත්තේ එයය.

මේ වනවිට ලංකාවද දැවැන්ත මූල්‍ය අර්බුදයකට ලක්ව ඉන් ගොඩ ඒමට නොහැකිව ඒ තුළම ගිලෙමින් තිබේ. රට මත ගොඩගැසී ඇති දැවැන්ත ණය කන්දරාවත් විදේශ වෙළඳාමේ පාඩුව හා විදේශ වත්කම් විශාල ලෙස පහළ වැටීමත් නිසා රුපියල පවා බාල්දුවෙමින් විශාල අර්බුදයකට මඟ විවර කර තිබේ. කොල්ලකාරී බංකොලොත් නව ලිබරල්වාදය තුළට ගමන්කරන වත්මන් පාලනය රටේ සම්පත් විකුණමින් හා අධිරාජ්‍යවාදීන් සමඟ විවිධ ගිවිසුම් ඇතිකර ගනිමින් රටේ ඉඩම් ඇතුළු සම්පත් ඔවුනට අවශ්‍ය ලෙස පරිහරණය කිරීමට අවශ්‍ය තත්වයන් නිර්මාණය කරමින් සිටිති. එසේම ඔවුන් එක්සත් ජනපදය සමඟ ආරක්ෂක ගිවිසුම් ඇතිකර එක්සත් ජනපද හමුදාවන්ට යුද කටයුතු සඳහා ලංකාවේ භූමිය යොදා ගැනීම සඳහා ඉඩ විවරකර දෙන්නේද රටේ ස්වාධීනත්වය ඩොලර් මිලියන කිහිපයකට පාවා දෙමිනි. එපමණක් නොව ආර්ථික අර්බුදයේ සමස්ත බර ජනතාව මත පටවා ඇති ආණ්ඩුව වැඩකරන ජනයාගේ අයිතීන්ද කප්පාදු කරමින් සිටී. වතු කම්කරු ජනතාවගේ දිනක වැටුප රු. 1000ක් කරන ලෙස ඉල්ලා කරන සාධාරණ ඉල්ලීමට පවා ඇහුම්කන් නොදෙන පාලකයෝ රටේ මහජන මුදල් කෝටි ගණනින් තම පැවැත්ම වෙනුවෙන් නාස්ති කරමින් සිටිති.

රට තුළ පැවති ධනවාදී ආර්ථික අර්බුදය දැන් දේශපාලන අර්බුදයක් දක්වාද වර්ධනය වී තිබේ. ආණ්ඩුව තුළ ඇත්තේ බරපතළ ගැටුමකි. පසුගිය වසරේ ඔක්තෝබර් වල ආණ්ඩු බලය ඇල්ලීම සඳහා මෛත්‍රී-මහින්ද දෙදෙනා කළ කුමන්ත්‍රණය අසාර්ථක වීමෙන් පසු ආණ්ඩුවේ ප්‍රතිවිරෝධය උත්සන්න වී තිබේ. දැන් ආණ්ඩුවක් නැති තත්වයක් පවතී. මරාගෙන මැරෙන ම්ලේච්ඡ බෝම්බ ප්‍රහාර පිළිබඳ තොරතුරු තිබියදීත් ඒවා වළක්වා ගැනීමට නොහැකි වී ඇත්තේ මෙම තත්වය නිසා බව පැහැදිලිය. මින් පෙන්වන්නේ රටේ කිසිදු ප්‍රශ්නයකට විසඳුම් ලබාදීමට හෝ අඩුම ගණනේ ජනතාවගේ ආරක්ෂාව තහවුරු කිරීමට පවා ධනපති ආණ්ඩු අසමත් බවය.

ලංකාව තුළ මේ මොහොතේ මතුව ඇති අතිශය බරපතළ සමාජ, ආර්ථික, දේශපාලන හා සංස්කෘතික අර්බුදය විසින් හා වසර 71ක තට්ටුමාරු දේශපාලනයේ අභිමිරි අත්දැකීම් විසින් ඉල්ලා සිටින්නේ කුමක්ද? ඒ, අන් කිසිවක් නොව ලංකාවේ ධනවාදයට මෙරට ජනතාව වෙනුවෙන් කිසිවක් අලුතින් නිර්මාණය කළ නොහැකි බවත් මෙම දුබල ධනපති ක්‍රමය වෙනස් කළ යුතු බවත්ය. බංකොලොත් ධනවාදය වෙනුවට නවීන සමාජවාදී සමාජයක් සඳහා නව සමාජ පරිවර්තනයක අවශ්‍යතාවය මේ මගින් යළි යළිත් අවධාරණය කෙරෙමින් තිබේ. ධනවාදයේ වත්මන් අර්බුදයට සැබෑ විසඳුම් සෙවීමට හෝ රටට ආර්ථික සංවර්ධනය හෝ ප්‍රගතිය ගෙන ඒමට එජාපයටත් ශ්‍රී ලංකා නිදහස් පක්ෂයටත් වෙනත් කුඩා කල්ලි කණ්ඩායම්වලටත් නොහැක. ඒ සඳහා කම්කරු පංතිය ප්‍රමුඛ වැඩකරන ජනතාවත් පීඩිත ජනතාවත් පෙරමුණ ගත යුතුය.

එබැවින් බංකොලොත් හා අර්බුදයට ගිය ධනවාදී ක්‍රමයත් බංකොලොත් ධනපති පක්ෂත් පරදවා ඒ වෙනුවට සමාජ සාධාරණත්වය, ජාතික සමගිය ජනතාවගේ ආරක්ෂාව ගොඩනගන ජනතාවාදී පාලනයක් හෙවත් නව සමාජවාදී සමාජයක් ගොඩනැගීම සඳහාත් එය ඉලක්ක කරගත් පුළුල් සමාජ පරිවර්තනයක් සඳහාත් ජනතා විමුක්ති පෙරමුණේ නායකත්වයෙන් වැඩකරන ජනතාව පෙරටු කොටගත් දැවැන්ත ජනතා බලයක්, ජනතා ව්‍යාපාරයක්, ජනතා මධ්‍යස්ථානයක් ගොඩනැගිය යුතුය. දැනටමත් ගොඩනැගෙමින් තිබෙන එම ජනතා ව්‍යාපාරය වඩාත් සවිමත් කළ යුතුය. ඒ වෙනුවෙන් අධිෂ්ඨානයෙන් යුතුව, කැපවීමෙන් යුතුව ක්‍රියාත්මක විය යුතුය. කම්කරු පංතිය ප්‍රමුඛ පීඩිත පංතියේත් සියලු ප්‍රගතිශීලී ජනතා බලවේගවලත් අයිතීන් දිනාගත හැක්කේත් ජනතාව සඳහා වඩා හොඳ හෙටක් නිර්මාණය කළ හැක්කේත් වමේ බලවේගත් ප්‍රගතිශීලී, ප්‍රජාතන්ත්‍රවාදී බලවේගත් එක්ව ගොඩනගන එවැනි ජනතා බලයක් මගිනි. එම ජනතා බලය ජයග්‍රහණය කිරිම මගිනි; එමගින් නව සමාජ පරිවර්තනයක් කිරීම මගිනි.

එබැවින් ධනවාදය පරදා නව සමාජයක් ගොඩනැගිය හැකි එවන් ජනතා පාලනයක් සඳහා පෙරට එන ලෙසත් සටන් වදින ලෙසත් ජාතිවාදී ගැටුම්වලට, ඒකාධිපතින් බිහිකරන දේශපාලන වංචාකාරයන්ට, ම්ලේච්ඡ අන්තවාදී ක්‍රියාවන්ට ඉඩ නොතබා ඒවා පරාජය කරන ලෙසත් ඒ සඳහා ජනතා විමුක්ති පෙරමුණ වටා ඒකරාශී වන ලෙසත් මෙරට කම්කරු පංතිය ඇතුළු වැඩකරන ජනතාවගෙන්, ගොවි ජනතාවගෙන්, ධීවර ජනතාවගෙන්, තරුණයන්ගෙන්, කාන්තාවන්ගෙන්, ශිෂ්‍යයන්ගෙන්, වෘත්තීයවේදීන්ගෙන්, උගතුන්ගෙන් හා බුද්ධිමතුන්ගෙන්, සාහිත්‍ය කලාසූරීන්ගෙන් පරිසරවේදීන්ගෙන්, මාධ්‍යවේදීන්ගෙන් සියලු මානව හිතවාදීන්ගෙන්, ප්‍රගතිශීලීන්ගෙන්, ප්‍රජාතන්ත්‍රවාදීන්ගෙන් හා සිංහල, දෙමළ, මුස්ලිම් සියලු ජනතාවන්ගෙන් මේ මැයි දිනයේදී අපි ඉල්ලා සිටිමු.

**දේශපාලන මණ්ඩලය**
**ජනතා විමුක්ති පෙරමුණ**
**2019 මැයි 01**

01 වැනි පිටුවෙන්

## අන්තවාදී උමතුව...

ජනතා විමුක්ති පෙරමුණට ඕනෑ තරම් දේශපාලන සටන්පාඨ තිබෙනවා. මෙම බේදවාචකය දේශපාලන වුවමනාවන් වෙනුවෙන් අපි පාවිච්චි කළේ නැහැ. අපේ ප්‍රවේශය වුණේ රටේ ජාතික ආරක්ෂාවත් ජනතාවගේ ආරක්ෂාවත් ප්‍රමුඛව මුල්තැනට ගෙන කටයුතු කිරීමයි. මෙම ඉස්ලාම් අන්තවාදී ම්ලේච්ඡ ප්‍රහාරයේ මතවාදී හවුල් කණ්ඩායම්, විවිධ සංවිධාන, පුද්ගලයින් මුළුමනින්ම පරාජයට පත්කළ යුතු බව අපි අවධාරණය කරනවා. මෙම සිදුවීමේ වගකීම ආණ්ඩුවට අත්හැරිය නොහැකි වගකීමක්. ඒ සඳහා වේගවත් මැදිහත්වීමක් අවශ්‍යයි. මේ මොහොතේ ආණ්ඩුව ඉස්ලාම් අන්තවාදය පරාජයට පත්කිරීමට ඍජු අධිෂ්ඨානයකින් යුතුව පියවර ගත යුතුව තිබෙනවා. ඒ වගේම අනෙකුත් ආගමික අන්තවාදයන් හිස එසවීමට ඉඩ නොදිය යුතුව තිබෙනවා.

මෙම ඉස්ලාම් අන්තවාදය පැරදවීමට රටේ මහජනතාවට ඉතාම සුවිශේෂී වූ වගකීමක් තිබෙනවා. ඉස්ලාම් අන්තවාදීන් ආරක්ෂා වෙන්නේ මුස්ලිම් ජන සමාජය ඇතුළේ. ඉස්ලාම් අන්තවාදී මතවාදය ප්‍රචාරය කරන්නේ මුස්ලිම් ජන සමාජය ඇතුළේ. එම නිසා විශේෂයෙන් මුස්ලිම් සමාජයට විශේෂ වගකීමක් තිබෙනවා මෙම ඉස්ලාම් අන්තවාදය පරාජයට පත් කිරීම සඳහා. අන්තවාදයට විරෝධය පළ කිරීමෙන් ඔබ්බට ගොස් එම මතවාදී යාන්ත්‍රණය පරාජය කිරීමට, එයට සම්බන්ධ පුද්ගලයින් සංවිධාන තීරණාත්මකව පරාජය කිරීමට සක්‍රීය මැදිහත්වීමක් කළ යුතුව තිබෙනවා. අපි සියලුම ජනතාවගෙන් ඉල්ලනවා, මෙම ඇතිවෙලා තිබෙන තත්වය තුළ අන්තවාදයක් පෝෂණය වීමට ඉඩ දෙනවා වෙනුවට පොදු මනෝභාවයකින් කටයුතු කරන්න කියලා. දේශපාලන පක්ෂ, පොදු ජනතාව ඒ වගේම ආණ්ඩුව එක්ව කටයුතු කළොත් මෙම ඉස්ලාම් අන්තවාදය පරාජයට පත්කළ හැකියි. දේශපාලන බෙදීම්, ආගමික බෙදීම්, ජනතාවගේ බෙදීම් ඇතිකරගතහොත් අපි සියලු දෙනාට එකට වැළලෙන්න පුළුවන්. එසේ නොමැතිව දේශපාලන භේද, ආගම් භේද සහ අනෙකුත් බෙදීම් පසෙක ලා එක්සත්ව කටයුතු කළොත් අන්තවාදය පරාජයට පත්කර අපිට නැගී සිටින්න පුළුවන්. අපි තීරණය කළ යුතුයි, බෙදී වැනසෙනවාද, එක්ව නැගී සිටිනවාද කියලා.”

මෙම අවස්ථාව සඳහා ජ.වි.පෙ. ප්‍රචාරක ලේකම් විජිත හේරත් සහ දේශපාලන මණ්ඩල සභික ලාල්කාන්ත යන සහෝදරවරුද එක්ව සිටියහ.

## අන්තවාදයට එරෙහිව...



ජනප්‍රියතම දේශපාලනය සිංහල ජාතිවාදයයි. මේ තත්වය යටතේ අප සිටගත යුත්තේ කොතනද? කුමන අසීරුතා තිබුණත්, කුමන අවලාද මඩ ගැසීම්, ප්‍රහාරයන් මධ්‍යයේ වුවත් අපි නිවැරදිව සිටිය යුතු වන්නේ සියලුම ජාතිවාදයන්ට හා සියලුම ආගමික අන්තවාදයන්ට එරෙහිවයි. ඒක මේ මොහොතේදී ටිකක් අසීරු කරුණක් වෙන්න පුළුවන්. ලෝකය පුරාමත්, අපේ රටේත් අත්විඳිමින් සිටින්නේ ධනපති පන්තියේ අසාර්ථකභාවයයි. එය සැඟව සිටින්නේ ආගමික අන්තවාදයේ සහ ජාතිවාදයේ. තක්කඩියාගේ අවසාන නවාතැන්පොළ ජාතිවාදයත්, ආගමික අන්තවාදයත් වෙනවා.

ආගමික අන්තවාදයක් තවත් ආගමික අන්තවාදයකින් පරාජය කළ නොහැකි බවත්, ධනපති රාජ්‍ය යාන්ත්‍රණය ශක්තිමත් කිරීමෙන් එය පරාජයට පත්කළ නොහැකි බවත් අපි සියලු දෙනා තේරුම් ගත යුතුයි. මේ මොහොත ධනපති පන්තිය සෑම ක්ෂේත්‍රයකම අසාර්ථකත්වයට පත්වී ඇති මොහොතක්. එම නිසා නව දේශපාලන ගමනක් පිළිබඳව ජනතාව තුළ විශාල සංවාදයක් ගොඩනැගෙමින් තිබුණා. ජනතාවට වෙනසක් ඕනෑ වෙලා තිබුණා. වෙනස මේ දෙගොල්ලම නොවෙයි කියලා මුළු සමාජයම කතා වෙමින් තිබුණා.

ඒ නිසා ජාතික සමගිය රටේ ආරක්ෂාව ජනතාවගේ ආරක්ෂාව ප්‍රමුඛ ලෙස සලකන ගමන් අපේ ආර්ථිකය ප්‍රජානතන්ත්‍රවාදය යහපත් දේශපාලනය වගේම යහපත් ආණ්ඩුකරණය සහ දේශපාලන ශිෂ්ටත්වය පිළිබඳ පොර පිටියක් අපේ රටේ ඇති කළ යුතු වෙනවා. අසීරුතම මොහොතක වුණත් ඒ තත්වය නිර්මාණය කිරීම සඳහා අදිටනින් යුතුව කටයුතු කළ යුතු වෙනවා. ජනතාව යම් අසරණභාවයකට, අනාරක්ෂිතභාවයකට, තැතිගැන්මකට ලක්වී තිබෙන මොහොතක ඉතාමත් වැරදි අගතිගාමී දේශපාලන මතයක් පැළ කරන්න පුළුවන් වටපිටාවක් සමාජයේ නිර්මාණය වී තිබෙනවා. අගතිගාමී මතයන් පෝෂණය කරන්න බොහෝ අය කටයුතු කරන බව පේනවා.

වැඩකරන ජනතාව සමගි සම්පන්න වීමකින් තොරව උතුරේද, දකුණේද, නැගෙනහිරද, බස්නාහිරද වතුකරයේද කවර තැනකදී වුවද අන්තවාදය පරාජය කළ නොහැකියි. අද මෙතනට එක්රැස්වී සිටින්නේ වැඩකරන ජනතාවට නායකත්වය දෙන පිරිසක්. එළඹෙමින් තිබෙන එම අනතුරු පරාජයට පත්කරන්න වැඩකරන ජනතාව සමඟ ජ.වි.පෙ. වෘත්තීය සමිති ව්‍යාපාරය නායකත්වය ලබාදෙනවා. මේ අසාර්ථකත්වයේ කෙළ පැමිණි පාලක පන්තිය වෙනුවට නව ජනතා මධ්‍යස්ථානයක් ගොඩනැගිය යුතුයි. ඒ වෙනුවෙන් ස්ථිර අදිටනින් යුතුව මෙම මැයි දින සැමරුම යොදාගත යුතුයි.”

## අර්බුදයට විසඳුම...



වැඩකරන පන්තියේ අයිතීන් ගැන අපි දිගටම කතා කරල තියෙනවා. ඒ වගේම සටන් කරලා තියෙනවා. දැන් සටන් කරමිනුත් ඉන්නවා.

අපි ඉන්නේ ධනපති රාජ්‍යයක් තුළ. කුමන රාජ්‍යයක වුණත් ප්‍රධාන වගකීම තමයි ඒ රටේ වැසියන්ගේ ජීවිත සහ දේපළ ආරක්ෂා කිරීම. නිර්ධන පන්තියේ රාජ්‍ය වේවා ධනේශ්වර පන්තියේ රාජ්‍ය වේවා මූලික වගකීමක් ඒක. බෙලහීන, දූර්වල මේ ධනේශ්වර රාජ්‍යයටත් එහි පාලකයන්ටත් මේ රටේ ජනතාවගේ ජීවිත සහ දේපළ ආරක්ෂා කරන්නවත් අද බැරිවෙලා තිබෙනවා. මේ තත්වයට උත්තර විදිහට ධනේශ්වර රාජ්‍යය ශක්තිමත් කිරීමේ සාකච්ඡාව ගෙනත් තිබෙනවා. ජාතිවාදීන්ගේත් ආගම්වාදීන්ගේත් වෙනත් විවිධ බලවේගවලත් උත්තරය බවට දැන් ප්‍රකාශයට පත්වෙන්නේ දූර්වල, ධනේශ්වර රාජ්‍යය ශක්තිමත් කිරීමයි. මානව අයිතීන් යටපත් කරමින්, ප්‍රජාතන්ත්‍රවාදී අයිතීන් යටපත් කරමින්, ධනේශ්වර ශක්තිමත් රාජ්‍යයක් හදන්න කතා කරනවා. ඒවත් ධනේශ්වර පාලකයන්ට කරගන්න බැරි නම්, විදේශ බලවේග ඇතුල් කරගෙන හෝ මේ දේ කරගතත යුතුයි කියලා සමාජ මතයක් දැන් ඇතිවෙමින් තිබෙනවා. මේක ඉතාම බරපතළ තත්වයක්. මේ පාලකයන්ට කවදාවත් අපේ රටේ පොදු ජනතාවගේ දේපොළ, ජීවිත ආරක්ෂා කරන්න බැහැ.

මේ අර්බුදයට තිබෙන උත්තරය වැඩකරන පන්තියේ නායකත්වය යටතේ ජනතාවට වගකියන සහ ප්‍රතිලාභ ලබාදෙන විසඳුමක් පමණයි. වෙන උත්තරයක් නැති බව ජනතා විමුක්ති පෙරමුණ විදිහට අපි මේ වෙලාවේදී අවධාරණය කරනවා. කොච්චර අමාරු වුණත්, කොච්චර කැපකිරීම් කරන්න වුණත්, වැඩකරන ජනතාවගේ පාලනයක් පිහිටුවීම හැර වෙනත් විසඳුමක් නැහැ. කොපමණ අමාරු වුණත් අපි ඒ වෙනුවෙන් කැපවෙන බව, අවධාරණය කරනවා.”

නියමුවා
ජනතා විමුක්ති පෙරමුණේ මධ්‍යම පුවත්පත
464/20. පන්නිපිටිය පාර පැලවත්ත. බත්තරමුල්ල දුර. 0112-785612 Email: niyamuwanews@gmail.com

## ආගමික උන්මාදය මගින් එන ම්ලේච්ඡත්වය පරදවමු!

350කට අධික සංඛ්‍යාවකට ජීවිත අහිමිකරමින් පසුගිය 21දා සිදුවූ බෝම්බ පිපිරීම් මාලාවෙන් පසු මුළු රටම දැන් පවතින්නේ අවිනිශ්චිතභාවයක හා භීතියකය. මෙය ජන සමාජයකට දරාගත නොහැකි තත්වයකි. 21දා පිපිරීම් සිදුවූ මොහොතේ කා තුළත් ඇති වූයේ සිදුවීම් පිළිබඳ කම්පනයක් හා විපතට පත්වූවන් පිළිබඳව සංවේගයකි. එහෙත් මේ වන විට එය රට පුරාම භීතියක් දක්වාත්, කෝපයත් දක්වාත් වර්ධනය වෙමින් තිබේ. මෙම තත්වය වහාම පාලනය කර, ජන ජීවිතය සාමාන්‍ය තත්වයට පත්කිරීමේ වගකීම ආණ්ඩුව සතු වුවත් එය ඉටුකිරීමට ආණ්ඩුව සමත්ව නැත. එසේම වගකීමෙන් තොරව කටයුතු කරන සමහර ජාතිවාදී හා අන්තවාදී දේශපාලන කණ්ඩායම් මෙම සිදුවීම සිය දේශපාලන න්‍යාය පත්‍රය සඳහා යොදා ගැනීමට දරන උත්සාහය නිසාද, එසේම වගකීමෙන් තොර පුද්ගලයන් විසින් සිදුකරන කටකතා පැතිරවීම් නිසාද ජනතාව නිතර නිතර බියට පත්ව සිටියි. මෙය වහාම පරාජය කොට ජන ජීවිත යළි යථා තත්වයට පත් කළ යුතුය. එය කාගේත් වගකීමය. විශේෂයෙන් ආණ්ඩුවේ වගකීමය.

ආගමික උමතුවකින් පෙළෙන මෙවැනි අන්තවාදී කණ්ඩායම්වල ම්ලේච්ඡ ප්‍රහාරවලින් වාසි ලබාගන්නේ ඔවුන් පමණක් නොවේ. මෙවැනි ම්ලේච්ඡ ප්‍රහාර සියලු ප්‍රතිගාමීන්ට හා අන්තවාදීන්ට වාසිදායකය. පොදු ජනතාව මේ පිළිබඳව වඩාත් විමසිලිමත් විය යුත්තේ ඒ නිසාය.

පසුගිය 21දා එල්ල කළ මරාගෙන මැරෙන බෝම්බ ප්‍රහාර ජාත්‍යන්තර ආගමික අන්තවාදී ක්‍රියා සමගද සම්බන්ධ ඉස්ලාමීය ආගමික අන්තවාදීන්ගේ ප්‍රහාරයක් බව දැන් තහවුරු වී තිබේ. ෂීෂී නැමති අන්තවාදී සංවිධානය මෙහි වගකීමද බාරගෙන තිබේ.

කෙසේ වුවද මෙම ප්‍රහාරයෙන් ලංකාව තුළ වාසි සැලසී ඇත්තේ කාටද? ඒ සිංහල, දෙමළ, මුස්ලිම්, බර්ගර්, මැලේ පොදු ජනතාවට නොවේ. මෙම ප්‍රහාරය වැළැක්වීමට නොහැකි වීම වර්තමාන බංකොලොත් ආණ්ඩුවේ දුබලකම හා වගකීම් විරහිතභාවය පෙන්වන කරුණක් වුවත් මෙහි විශාල වාසියක් ආණ්ඩුවට ලැබේ. දැන් රටේ ජනතාවගේ ප්‍රශ්න, බදු බර, රැකියා, වැටුප්, ආර්ථික අමාරුකම් ආදී ධනපති ආණ්ඩුව ඉදිරියේ තිබූ සියලු ගැටලු මෙම සිදුවීම විසින් යටගසා ගැනීමට ආණ්ඩුවට හැකියාව ලැබී තිබේ. ජාතික ආරක්ෂාව ගැන කතාකරමින් තම ආර්ථික හා දේශපාලන දුබලකම් හා බැරිකම වසා ගැනීමට මෙය ආණ්ඩුවට වාසිදායකවී තිබේ.

එසේම මෙම ප්‍රශ්නය ජාතිවාදය මත පිහිනා බලය ලබා ගැනීමට බලා සිටින මහින්ද රාජපක්ෂ හා ගෝඨාභය රාජපක්ෂ වටා පෙළගැසී සිටින බලවේගයන්ටද වෙස්වළාගත් ආශීර්වාදයක් වී තිබේ. රට තුළ පසුගිය කාලය මුළුල්ලේ ගොඩනැගෙමින් තිබූ රට ගොඩනැගීම, රට හැදීම පිළිබඳව පුළුල් දේශපාලන සංවාදය වහාම වෙනස් වී 'ජාතික ආරක්ෂාව' පිළිබඳ කරුණ ප්‍රධාන වීමත් සමග එය තම වාසියට හරවා ගැනීමට එකී බලවේගයන් විවිධ මත හා තර්ක ගොඩනගමින් කටයුතු කරනු පෙනේ. ඒ අනුව මෙම ප්‍රහාරය, පසුගිය කාලය පුරා ජනතාව තුළ බිය ජනිත කර, ජාතිවාදය අවුළුවා ඒ මගින් බලයට ඒමට උත්සාහ කරමින් සිටි රාජපක්ෂ මහතා ඇතුළු කණ්ඩායමට අනගි අවස්ථාවක් ලබාදීමක් වී තිබේ.

අනෙක් අතට මෙය උමතු ආගමික අන්තවාදීන්ටද වාසිදායකය. තම ප්‍රහාරය සාර්ථක බව කියමින් උදම් ඇනීමට මෙම ම්ලේච්ඡ ප්‍රහාරයට සම්බන්ධ වූවන්ට පුළුවන. මෙවැනි පන්නයේ මරාගෙන මැරෙන ප්‍රහාර සඳහා ආගමික උමතුවෙන් පෙළෙන්නන් එකතුකර ගැනීමටද හැකිවෙනු ඇත. එය වහාම පරාජය කළ යුතුය.

මේ මොහොතේදී වගකීමක් සහිතව කටයුතු කරන දේශපාලන පක්ෂ, සියලු සමාජ කණ්ඩායම් හා පොදු ජනතාව ඉතාම හොඳ සිහිබුද්ධියෙන් යුතුව කටයුතු කළ යුතුව තිබේ. හැඟීම්වලට යටවෙනු වෙනුවට සිහි බුද්ධියෙන් කටයුතු කිරීම අත්‍යවශ්‍ය මොහොතක් ලෙස මේ මොහොත තේරුම් ගත යුතුව තිබේ.

සියලුම දෙනා විසින් මෙම ම්ලේච්ඡ ප්‍රහාර හෙළා දැකිය යුතුය. ඉන් විපතට පත්වූවන්ට හැකි පමණින් ආධාර උපකාර කළ යුතුය. ඔවුන්ගේ දුක බෙදා ගත යුතුය. එසේම සියලුම පක්ෂ අවදියෙන් සිට යළි මෙවැනි ප්‍රහාරයන් ඇතිවීම වැළැක්වීමටත් මෙම අන්තවාදී උමතු කණ්ඩායම පරාජය කොට අවසන් කිරීමටත් ලබාදිය යුතු දායකත්වය ලබාදිය යුතුය. ඒ අතරම වැරදි තීරණවලින්, අනවශ්‍ය ගැටුම් නිර්මාණය කිරීමෙන්, ආගමික හෝ ජාතිවාදී ගැටුම් නිර්මාණය කිරීමට දායකවීමෙන් මෙම අන්තවාදීන්ගේ පිරිස් බලය වැඩිකිරීමට හෝ ඔවුන්ගේ ම්ලේච්ඡ ක්‍රියා සාධාරණය කරගැනීමට ඉඩ නොදිය යුතුය.

අවසාන වශයෙන් මෙම ම්ලේච්ඡත්වය පැරදවිය හැක්කේ 'වෙන්වෙන්ව කටයුතු කිරීමෙන් හෝ පටු දේශපාලන වාසි වෙනුවෙන් කටයුතු කිරීමෙන් නොව, සියලු දෙනාම එක්ව මෙම ම්ලේච්ඡත්වයට එරෙහිව එකාවන්ව නැගීසිටීමෙන්ය' යන සත්‍යය මත කටයුතු කළ යුතුය. වගකිවයුතු පුරවැසියන්ගේ කාර්යභාරය වන්නේ එයයි.

# ධනවාදයේ අර්බුදය හා ලොව පුරා පැතිරෙන ම්ලේච්ඡත්වය

පසුගියදා කතෝලික දේවස්ථාන කිහිපයක් ඇතුළු නිරායුධ අහිංසක පුරවැසියන් ඉලක්ක කරගෙන සිදු වූ මරාගෙන මැරෙන බෝම්බ ප්‍රහාරවලින් පසු ලාංකේය දේශපාලනය යළිත් උණුසුම් වී තිබේ. ඉතාම පැහැදිලි තොරතුරු තිබියෙදීත් මෙම ම්ලේච්ඡ ප්‍රහාරය වළක්වා ගැනීමට අසමත් වූ ධනපති ආණ්ඩුව හා එහි බලධාරීන් එකිනෙකාට ඇඟිල්ල දිගුකරමින් තම වගකීමෙන් පලා යෑමට කටයුතු කරන අයුරුත්, නිලධාරීන් පිට පමණක් වරද පටවා ඔවුන්ට ඉල්ලා අස්වීමට බලකොට තම වගකීම් විරහිතභාවය ඒ තුළ සඟවා ගැනීමට උත්සාහ කරන අයුරුත් පසුගිය දිනවල දැකිය හැකි විය.

එසේම මෙම සිදුවීම පිළිබඳ විවිධ දේශපාලන කණ්ඩායම් හා විවිධ සංවිධාන තම තමන්ගේ දේශපාලන න්‍යාය පත්‍රවලට අනුව විග්‍රහ කරමින් ඒ පිළිබඳ අදහස් හා යෝජනා පළ කරනු පසුගිය දිනවල දැකිය හැකි විය. මහින්ද රාජපක්ෂ කණ්ඩායමට අනුව මෙය "බුද්ධි අංශවලින් පළිගැනීම" හා "ජාතික ආරක්ෂාව දුර්වල කිරීම" නිසා සිදුවූවකි? ඒ මගින් ඔවුන් නැවත තම ජාතිවාදී හා මර්දනකාරී අතීතය සාධාරණය කර ගනිමින් එකී මනෝභාවය තම අනාගත බලය සඳහා යොදා ගැනීමට උත්සාහ කරන බව පැහැදිලිය. එක්තරා කාලයකදී බුද්ධි අංශ එම කාර්යයේ යොදවනවා වෙනුවට තම දේශපාලන විරුද්ධවාදීන් දඩයම් කිරීමට යොදවමින් සැබෑ ලෙසම ඒවා දුර්වල කරනු ලැබුවේ රාජපක්ෂ පාලනය විසින්ම බව ඔවුහු සඟවති.

අනෙක් අතට මෙය ආගමික කණ්ඩායම් අතර ගැටුමක් බවට පරිවර්තනය කොට එමගින් එකිනෙකාගේ පටු ව්‍යාපාරික හා දේශපාලනික වුවමනා සපුරා ගැනීමට සමහරු උත්සාහ කරති.

දැනට තිබෙන තොරතුරු අනුව මෙය ජාතික තව්හිත් ජමාත් නම් ලංකාවේ කුඩා ඉස්ලාම් ආගමික අන්තවාදී කණ්ඩායමක් විසින් සිදුකළ ම්ලේච්ඡ ක්‍රියාවකි. මෙම කණ්ඩායමට, සිරියාව පදනම් කර ගනිමින් ක්‍රියාත්මක වන ISIS නම් ඉස්ලාම් අන්තවාදී සංවිධානය සමගද සබඳතා ඇති අතර ඔවුන් විසින් මෙම ප්‍රහාර මෙහෙයවා ඇති බවද පෙනේ. ඒ, මෙම ප්‍රහාරයේ වගකීම ISIS සංවිධානය විසින් භාරගනු ලැබීම නිසාය.

දැන් මේ සංවේදී මොහොතේදී මෙම ප්‍රහාර දෙස විවිධ දේශපාලන කණ්ණාඩිවලින් බලන අය ඒවා තම තමන්ට ගැලපෙන ලෙස විග්‍රහ කර ගනිති. මුස්ලිම් ජනතාවට එරෙහිව පොදුවේ පසුගිය කාලය පුරා ක්‍රියාත්මක වූ ජාතිවාදී කණ්ඩායම් මෙය තම ක්‍රියා සාධාරණීකරණය කර ගැනීමටත්, ජාතිවාදී ගැටුම් ඇතිකිරීමටත් යොදා ගැනීමේ අවදානම තිබේ. අනෙක් අතට මෙය අනුමත කරන ඉස්ලාම් අන්තවාදී සංවිධාන මෙම ප්‍රහාර සාධාරණය කර ගැනීම සඳහාද විවිධ තර්ක ඉදිරිපත් කිරීමට පුළුවන. මේ සිදුවීම් දෙස වමේ දේශපාලන දැක්මකින් බැලිය යුත්තේ මේ නිසාය.

මෙවැනි ම්ලේච්ඡ ආගමික හා ජාතික අන්තවාදී කණ්ඩායම් ලොව පුරාම පවතින අතර පසුගිය කාලයේ ඒවායේ වැඩිවීමක්ද, ඔවුන් විසින් සිදුකරන ඝාතනවල වැඩිවීමක්ද දැකිය හැකි විය. සමහර බටහිර රටවල විදේශිකයන්ට එරෙහිව ක්‍රියාත්මක වන වර්ගවාදී අන්තවාදී කණ්ඩායම් තිබේ. නාසිවාදී හා ෆැසිස්ට්වාදී කණ්ඩායම්ද ඒ අතර වේ. එසේම අමෙරිකා එක්සත් ජනපදයේද කළු ජාතිකයන්ට එරෙහිව විටින් විට සුදු ජාතික අන්තවාදීන් විසින් එල්ල කරනු ලබන ප්‍රහාර දැකිය හැකි විය. එක්සත් ජනපදයේ උදව් ලබන ඊශ්‍රායලය (සියොන්වාදීන්) පලස්තීනයට එරෙහිව එල්ල කරන අමානුෂික ප්‍රහාරද මේ අතර වේ. බටහිර අධිරාජ්‍යවාදී රටවල් විසින් මැදපෙරදිග සිදුකරන දේශපාලන මැදිහත්වීම්වලට එරෙහි විරෝධය ඉස්ලාම් අන්තවාදීන් තම ආගමික අන්තවාදය වෙනුවෙන් යොදාගනී.



එබැවින් මෙම සියලු ආගමික, ජාතික, වාර්ගික, අන්තවාදයන්, අධිරාජ්‍යවාදයේත්, ධනවාදයේත් නිර්මාණයන්ය. එක් අතකින් මෙම අන්තවාදී බොහෝ කල්ලි පිටුපස අධිරාජ්‍යවාදීන්ගේ අනියම් හා ඍජු සබඳතා තිබේ. ඔවුහු මේවා නිර්මාණය කොට පෝෂණය කොට එක් එක් කලාපවල දේශපාලන අස්ථාවරභාවයන් නිර්මාණය කර ඒ මගින් එකී භූ දේශපාලන කලාපවලට රිංගා ගැනීමට කටයුතු කරති. සමහර අන්තවාදී පිරිස් නිර්මාණය වන්නේ සමාජය තුළ තමන්ට හිමි ස්ථානය නැතිව යන්නේ යැයි සිතන විටය. ආර්ථික හා වෙනත් දුෂ්කරතාද මේ සඳහා බලපාන බව පෙනේ.

පොදුවේ ගත්විට ඉතාම පැහැදිලි කරුණ වන්නේ එක් අතකින් ධනවාදය තුළ පවතින ප්‍රතිවිරෝධතාවය හා පීඩනයන් ආගමික, ජාතිකත්ව හා වාර්ගික පීඩනයන් හා ප්‍රතිවිරෝධයක් ලෙස පරාවර්තනය වන බවය. ධනවාදය තුළ ඇති ධනවාදයේ අර්බුදය විසින් නිර්මාණය කරනු ලබන පීඩනයත් ආගමික හෝ ජාතික අන්තවාදී ස්වරූපයෙන් හෝ පුපුරායාම සිදුවන බව පැහැදිලිව පෙනේ.

එසේම සමාජය තුළ ධනවාදය විසින්ම පවත්වාගෙන යනු ලබන මිථ්‍යා විශ්වාස හා ආගමික මිථ්‍යාවන්ද මීට උදව් වන බව පෙනේ.

මෙවැනි උමතු ආගමික අන්තවාදී කණ්ඩායම්වල ම්ලේච්ඡ ක්‍රියා හා ඝාතනවලින් සිදුවන හානි ධනපති ආණ්ඩුවලට තාවකාලිකව බලපෑවද දිගුකාලීනව මේවා අධිරාජ්‍යවාදයටත් ධනවාදයටත් සේවය කරන බව නොරහසකි. ධනවාදය තුළ මිනිසුන් තුළ මතුවන අසහනය හා ප්‍රතිවිරෝධයත් අන්තවාදයන් ඔස්සේ පුපුරා යාම ධනවාදයටත් අධිරාජ්‍යවාදයටත් හොඳය. ඉන් එක් අතකින් පන්ති සටන් දුර්වල වේ. අනෙක් අතින් වමේ බලවේගවල ක්‍රියාකාරිත්වයට බාධා ඇති වේ. එවිට එය සමාජ පරිවර්තනයන්ට බාධා කරමින් ධනවාදයට මර්දනකාරිත්වය වැඩිකරමින් ජනතාව නොමඟ යවමින් හා සැබෑ ප්‍රශ්න යටපත් කරමින් පැවතීමට අවශ්‍ය තත්වයන් නිර්මාණය කර දේ. මේවා ධනපති ක්‍රමයටත් අධිරාජ්‍යවාදයටත් වෙස්වළාගත් ආශීර්වාදයක් වන්නේ එසේය.

කෙසේ වුවත් ලංකාවේ මෙම ප්‍රශ්නයේදී ජනතාව ඉතාමත් වගකීම් සම්පන්නව හා අවබෝධයෙන් කටයුතු කළ යුතුය. වමේ ව්‍යාපාරයක වගකීම වන්නේ හැඟීම්වලට යටවීම හෝ හැඟීම් බරවූ ජනතාවගේ මනෝභාවයට අනුව කටයුතු කිරීම නොව නිවැරදි ලෙස කටයුතු කිරීමය. මෙවැනි ම්ලේච්ඡ ප්‍රහාර වඩාත් අවාසිදායක වන්නේ, වමේ හා ප්‍රගතිශීලි බලවේගයන්ටය. එබැවින් මෙවැනි ප්‍රහාරත්, ඒවාට මූලික

> ධනවාදය තුළ මිනිසුන් තුළ මතුවන අසහනය හා ප්‍රතිවිරෝධයත් අන්තවාදයන් ඔස්සේ පුපුරා යාම ධනවාදයටත් අධිරාජ්‍යවාදයටත් හොඳය. ඉන් එක් අතකින් පන්ති සටන් දුර්වල වේ. අනෙක් අතින් වමේ බලවේගවල ක්‍රියාකාරිත්වයට බාධා ඇති වේ. එවිට එය සමාජ පරිවර්තනයන්ට බාධා කරමින් ධනවාදයට මර්දනකාරිත්වය වැඩිකරමින් ජනතාව නොමඟ යවමින් හා සැබෑ ප්‍රශ්න යටපත් කරමින් පැවතීමට අවශ්‍ය තත්වයන් නිර්මාණය කර දේ.

15 වැනි පිටුවට

# එන වේගයට වඩා වැඩි වේගයෙන් ආපසු යන ආයෝජන



පෙර පාලකයින් මෙන්ම වත්මන් රනිල් - මෛත්‍රී පාලනයද නිරතුරුව පාරම් බාන ලද සුලබ වාක්‍යයකි, "ආයෝජන කැඳවීම". සාමාන්‍ය ජනතාවද එක්සත් ජාතික පක්ෂ පාලනයකදී ආයෝජකයින් වැඩිපුර එන්නේ යැයි ප්‍රබල විශ්වාසයක් සහිතව කටයුතු කළ ඉතිහාසයක්ද ඇත. එයට හේතුව පැවැති ශ්‍රී.ල.නි.ප. මූලික වූ ආණ්ඩුවලට වඩා විවෘත ආර්ථිකය ක්‍රියාවට නැගීමෙන් ආයෝජකයින් කැඳවා ගැනීමට වැඩි හැකියාවක් ඇත්තේ එ.ජා.ප. ප්‍රමුඛ පාලකයින්ට යැයි ඉතිහාසය තුළ විශ්වාසයක් ගොඩනැගී තිබීමය. 1978දී විවෘත කිරීමේ ආර්ථික උපායමාර්ගය ක්‍රියාවට නැගීමත් සමග පැවැති වැසුණු ආර්ථිකයට වඩා වැඩි විශේෂ විනිමය ප්‍රමාණයක් සහිත ආයෝජන ගලාඒමක් සිදුවීමද සත්‍යයකි. විශේෂයෙන් මහ කොළඹ ආර්ථික කොමිසම යටතේ නිදහස් වෙළඳ කලාප බිහිවීමත්, විනිමය පාවෙන අනුපාත ක්‍රමයට පරිවර්තනය කිරීම හා පැවති විනිමය පාලන නීතිරීති ලිහිල් කිරීමත් සමග විදේශ ආයෝජකයින්ට දිරිදෙන පහසුකම් සැලසීමට වරින් වර යෝජනා කිරීමත් ඊට ධනාත්මක සාධක ලෙස බලපාන ලදී.

නමුත් දිගින් දිගටම කඩා වැටෙමින් එන ආර්ථික අර්බුදයත් අඛණ්ඩ දේශපාලන අස්ථාවරත්වය හමුවේත් තමන් මෙතෙක් විදේශ ආයෝජකයින් "පිනවීමට" යොදාගත් උපක්‍රම තවදුරටත් වලංගු නොවන මට්ටමට ලාංකේය ධනවාදී ආර්ථික උපායමාර්ගය අසාර්ථක වෙමින් පවතී. දැන් විවෘත ආර්ථික මොඩලය වයසින් අවුරුදු 40ක් සම්පූර්ණ කර ඇතුවා පමණක් නොව වෙනත් කිසිදු රටකදීටත් වඩා අසාර්ථකත්වයේ ලකුණු පහළ කර හමාරය.

අධික ණය බර රටක් ලෙස මෙන්ම, එහි පීඩනය දේශීය විදේශීය ආයෝජන කෙරෙහිද සෘජුව බලපා ඇත. එසේම දිගින් දිගට සිදුවන අධික බදු පැනවීම, නීතිරීතිවල බලපෑම, පුහුණු ශ්‍රමිකයින්ගේ හිඟය, ආයෝජන සඳහා ස්ථාවර දේශපාලන ප්‍රතිපත්ති ක්‍රියාත්මක නොවීම ආදී කරුණු බොහොමයක් නිසා ලංකාවට මේ වනවිට ආයෝජන එනවාට වඩා වැඩි වේගයකින් ආපසු ආයෝජන ඉවත් කරගෙන යාමේ ප්‍රවණතාවය වර්ධනය වී ඇත.

**"කළු ආයෝජන" සුදු කිරීම!**

එ.ජා.ප.යේ පාලන ඉතිහාසයේ දේශීය මෙන්ම විදේශීය ආයෝජනද වැඩිපුරම ගලා ආ වකවානුව වන්නේ, ඇඟලුම් කර්මාන්ත ආශ්‍රිතව BOI වෙළඳ කලාප වෙත ආයෝජකයින් පැමිණි 80 දශකයයි. එම ආයෝජන ඉතා ලාභ ශ්‍රමය සොයා පැමිණි අතර එමගින් ග්‍රාමීයව විරැකියාවෙන් පෙළුණු නූගත් තරුණ තරුණියන් කොළඹ ගෙන්දගම් පොළවට ආකර්ෂණය කරවූ අතර එහි ධනාත්මක මෙන් ඍණාත්මක බලපෑමද රැසක් ඇතිවිය. තරුණ විරැකියාවට එය තාක්ෂණික විසඳුමක් වුවත් නාගරිකව නීති විරෝධී ආදායම් මාර්ග සොයන පිරිසක් ඉක්මනින් වර්ධනය වීමටද එයම බලපෑවේය. ඒ කෙසේ වුවත් ඇඟලුම් කර්මාන්තයේ ආයෝජන කලාප තුළට පැමිණි ආයෝජකයින් බොහොමයක් නිල ක්‍රම මගින් ලංකාවට ආයෝජන කැඳවීම් විය. එසේ නොවුණු ජෝසිම් වැනි ජැක්පොට් සූදුකරුවන් ඉතා ඉක්මනින් ප්‍රතික්ෂේප වීමද සිදුවිය. ආරම්භක වකවානුවේ ආයෝජකයින් අද්දවා ගැනීමේ ආණ්ඩුවේ උපක්‍රමද යම් විනිවිදභාවයක් සහිත වූ අතර ආයෝජනද මුළුමනින්ම නොවුණත් යම් තරමකට "කළු" නොවීය.

නමුත් කඩා වැටෙන ආර්ථිකයට සමාන්තරව ආයෝජකයන්ගේ ස්වරූපයද කළු ආයෝජන මට්ටමට පත්විය. ඒ සඳහා ආයෝජන ලෙස කළු සල්ලි ගලා ඒමට පටන් ගත් අතර, ආයෝජන මණ්ඩලය වැනි නෛතික ආයතන මගින් ආයෝජනය කරනු වෙනුවට කැබිනට් මණ්ඩලයේ "හයිය අතු" (High Hand) මගින් කොමිස් මුදල් පදනමට ආයෝජන ලබා ගැනීමේ වැඩි නැඹුරුවකට ලංකාවේ ආයෝජන පරිවර්තනය විය. මෙය දේශීය හා විදේශීය දෙයාකාරයේම ආයෝජන සඳහා පොදු ස්වභාවයක් ගනු ලැබීය.

කළු සල්ලි සුදු කරන ආයෝජන ලංකාවට ගෙන ඒමේ මෑතකාලීන වාර්තා පිහිටුවා ඇත්තේ රාජපක්ෂ පාලනය විසිනි. ආර්ථික සංවර්ධන ඇමති ලෙස කටයුතු කළ බැසිල් රාජපක්ෂ ඇමතිවරයා "Mr 10%" ලෙස හැඳින්වීමට තරම් එම කළු ආයෝජන කැඳවීම දුරදිග ගියේය. අනිත් කැබිනට් මණ්ඩල සාමාජිකයින්ට ඉඩක් නොතබාම ආයෝජකයින්ගෙන් කොමිස් ගැනීමේ තරගයක් රාජපක්ෂ පවුල තුළම ඇතිවිය. තාත්තාගේ ආයෝජකයාගෙන් පුතා කොමිස් ඉල්ලන තරමට එය වර්ධනය වන විට රාජපක්ෂ පාලනය බිඳ වැටුණි.

එම රාජපක්ෂ පැණි වරකේ එල්ලී සිටි වවුලන්ම යළි ආණ්ඩු මාරුවත් සමගම රනිල් - මෛත්‍රී හවුලේද රහ බැලීමට එල්ලීම එක් අතකින් විහිළු සහගතය. අනික් අතට ඛේදවාචකයක්ය. එහිද ප්‍රබලම කොටස්කරුවා වූයේ චීන හා ඉන්දීය කළු සල්ලි සමාගම්ය.

**ෆොක්ස්වාගන් සහ සිල්වර් පාර්ක්**

රනිල් වික්‍රමසිංහ වත්මන් එ.ජා.ප. පාලනයේ කළු සල්ලි ආයෝජනවල

වගුව 01

| වර්ෂය | ගිවිසුම අත්සන් කළ ව්‍යාපෘති සංඛ්‍යාව (නව සහ පැවැති ගිවිසුම දීර්ඝ කළ) | වසා දමන ලද ව්‍යාපෘති | ගිවිසුම අවලංගු කළ ව්‍යාපෘති සංඛ්‍යාව |
|---|---|---|---|
| 2017 | 103 | 7 | 148 |
| 2016 | 185 | 10 | 78 |
| 2015 | 157 | 27 | 23 |
| 2014 | 160 | 15 | 56 |
| 2013 | 147 | 16 | 122 |

නූතනම උදාහරණය වී ඇත්තේ ඉන්දියාවේද කුප්‍රකට ආයෝජන රැසකදී චූදිත වූ අයකු හම්බන්තොට මිරිජ්ජවිල කර්මාන්ත උද්‍යානය සඳහා "සිල්වර් පාර්ක්" නමින් ඩොලර් මිලියන 3850ක ආයෝජනයක් සඳහා කැඳවා තිබීමයි. පසුගිය අයවැය විවාදයේදී ජ.වි.පෙ. මන්ත්‍රීවරුන් විසින් මේ පිළිබඳව පාර්ලිමේන්තුවේ ප්‍රශ්න කිරීමත් සමග මෙම කළු ආයෝජනයේ තොරතුරු රැසක් රටට අනාවරණය විය. එහි ප්‍රධාන කරුණක් වන්නේ මෙම ආයෝජනයට අදාළ "ව්‍යාපෘති යෝජනාව" (Project Proposal) පමණක් ලබාගෙන මුළු ව්‍යාපෘතියම අනුමත කර රනිල් වික්‍රමසිංහ අතින්ම මුල්ගල් තබා වැඩ ආරම්භ කර තිබීමයි. එම කළු ආයෝජකයාට අදාළ බදු ගිවිසුම (Lease Agreement) අත්සන් කරන්නේ අනාගත දිනයකදී බව ඇමතිවරයාම පාර්ලිමේන්තුවේ ප්‍රකාශ කරන ලදී. ආයෝජන ඇමති මලික් සමරවික්‍රම පාර්ලිමේන්තුවට කියන්නේ, මෙම ව්‍යාපෘතියේ ආයෝජකයා සිංගප්පූරුව බවයි. නමුත්, ජ.වි.පෙ. මන්ත්‍රී වෛද්‍ය නලින්ද ජයතිස්ස ඔහු තමිල්නාඩුවේ නමගිය කළු සල්ලි ව්‍යාපාරිකයකු යැයි කියන විට ඇමතිවරයා ඉතා අසරණව එයද පිළිගනී. ආයෝජකයා කවුදැයි ආයෝජන ඇමති නොදන්නා ආයෝජන ලංකාවට එන්නේ එලෙසිනි. මෙම රනිල් - මෛත්‍රී හවුල් පාලන කාලය තුළම හොරණ වගවත්තේ ඉදිකරන ටයර් කර්මාන්ත ශාලාවටද අවසර දී ඇත්තේ මෙලෙසටම බදු ගිවිසුමකින් තොරව ආයෝජන යෝජනාව පමණක් සැලකිල්ලට ගෙනය. කුලියාපිටියේ ෆොක්ස්වාගන් විහිළුවද එවැනි තවත් ව්‍යාපෘතියකි. ෆොක්ස්වාගන්

(වගුව 02)

2013 සිට 2017 දක්වා ලංකාවට පැමිණි ආයෝජන ප්‍රවණතාවය -

| වර්ෂය | 2014 - 2020 ආයෝජන මණ්ඩල අයෝජන අපේක්ෂා | සත්‍ය ලෙස ළඟා කරගත් අයෝජන ඩොලර් මිලියන /(M) |
|---|---|---|
| 2017 | 103 | 7 |
| 2016 | 185 | 10 |
| 2015 | 157 | 27 |
| 2014 | 160 | 15 |
| 2013 | 147 | 16 |

කම්හල ඉදිකිරීමට එම ස්ථානයේ තිබූ පොල් වත්තක පොල් ගස්ද කපා ඉවත් කලද ආයෝජකයා තවම පැමිණියේ නැත.

**එන - යන ආයෝජන**

ලංකාවට එන ආයෝජන ආ පයින්ම ආපසු යන බව හෙළිකරන විට ආයෝජන ඇමතිගේ පිළිතුර වන්නේ "ඒ යන ආයෝජන රාජපක්ෂලා කාලේ ආපු ආයෝජන" ලෙසිනි. නමුත් 2013 දී අයෝජන මණ්ඩලය ව්‍යාපෘති 147 කට අත්සන් කරන විට එම වසරේදීම ආයෝජන 16ක් වසා දමා ගිවිසුම අවලංගු කරන ලද ප්‍රමාණය 122 කි. ඒ, 2013 වසරේදී අත්සන් කළ නව ව්‍යාපෘති නොව ඊට වසර ගණනකට කලින් අත්සන් කළ ව්‍යාපෘති 2013 වසරේදී වසා දැමූ හෝ ගිවිසුම අවලංගු කළ ගොඩට අදාළ විය හැකිය. එසේම නව පාලනය යටතේද 2017 වසරේදී ද නව ව්‍යාපෘති 103 කට අත්සන් තබන විට ව්‍යාපෘති 7ක් වසා දමා 148ක ගිවිසුම අවලංගු කර ඇත. 2013 සිට 2017 වන විට වසා දමා ඇති මුළු ව්‍යාපෘති ගණන 75 කි. එසේම ගිවිසුම වාර්ෂික අවලංගු කර ඇති මුළු ප්‍රමාණය (2013 - 2017) 427කි. අයෝජන මණ්ඩලය යටතේ ලියාපදිංචි වූ ව්‍යාපෘති සහ වසා දමන ලද ව්‍යාපෘති වල ලේඛනයක් පහත වගුව 01 හි දැක්වේ.

ව්‍යාපෘති ලෙස ආරම්භ වීම මෙන්ම සෘජු විදේශ ආයෝජන ලෙස ලංකාවට පැමිණි ඩොලර් විනිමය (FDI) අගයන්ද විශාල කඩා වැටීමකට ලක්ව ඇති බව සංඛ්‍යාත්මකව දැකිය හැකිය. ආයෝජන මණ්ඩලයේ සංයුක්ත සැලැස්මේ අපේක්ෂා කරන ලද ඉලක්ක වෙනස් කිරීමෙන් 2017 වසරේදී යම් වර්ධනයක් ඉලක්කමක් ලෙස ඉහළ දමා පෙන්වා ගෙන තිබුණද සැබෑ ලෙසම එය සිදුවී ඇත්තේ ආයෝජන මුදල් ලෙස විනිමය රට තුළට පැමිණීමෙන් නොව සංයුක්ත සැලැස්මේ ඉලක්ක අඩුකර පෙන්වීමෙන් බව පසුගිය වසර 05ක ආයෝජන ගලා ඒම දැකීමේදී පැහැදිලි වේ.

රටක ආර්ථික වර්ධනයක් සතුටුදායකද නැතිද යන්න තීරණය කරන දර්ශක අතර ඉතිරි කිරීම රාජ්‍ය ආයෝජන, රැකියා උත්පාදනය, උද්ධමනය පාලනය, ණයගැති ස්වභාවය, ආදායම බෙදී යාමේ ස්වභාවය ආදිය ප්‍රධාන වේ. **අප සාකච්ඡාවට ලක් කළ ආයෝජන දර්ශකයේ වත්මන් ස්වභාවය අනුවද ඉතා පැහැදිලි වන්නේ, දුබල ධනවාදය ලාංකේය භූමිය තුළ විවෘත ආර්ථිකයේ ආරම්භයේදී ජනතාව මුලා කිරීමට දක්වන ලද දක්ෂතාවයවත් මේ කඩා වැටෙන මොහොතේදී රඟ දැක්විය නොහැකි තරමටම දුර්වල දුබල තත්වයට ඇද වැටී ඇති බවයි.**

රටක් ලෙස ලංකාවෙට ඉදිරියට යාමට නම්, ආයෝජන මෙන්ම සමස්ත ආර්ථිකයම ආරක්ෂිතව මෙහෙයවිය හැකි දේශපාලන නායකත්වයක් රට පාලනය භාරගත යුතු මොහොත එළඹ ඇත. එය සමස්ත ආර්ථික ක්‍රමයේම පැහැදිලි වෙනසක ආරම්භය වනු ඇත. ආයෝජනද රටට හිතකර වනු ඇත්තේ එවිටය.

> අප සාකච්ඡාවට ලක් කළ ආයෝජන දර්ශකයේ වත්මන් ස්වභාවය අනුවද ඉතා පැහැදිලි වන්නේ, දුබල ධනවාදය ලාංකේය භූමිය තුළ විවෘත ආර්ථිකයේ ආරම්භයේදී ජනතාව මුලා කිරීමට දක්වන ලද දක්ෂතාවයවත් මේ කඩා වැටෙන මොහොතේදී රඟ දැක්විය නොහැකි තරමටම දුර්වල දුබල තත්වයට ඇද වැටී ඇති බවයි.

# සියලු වැඩකරන ජනයා ඒකරාශි කිරීම ජයගත හැකි අභියෝගයක්

**අන්තර් සමාගම් සේවක සංගමයේ ප්‍රධාන ලේකම්, ජනතා විමුක්ති පෙරමුණේ මධ්‍යම කාරකසභික**

**වසන්ත සමරසිංහ සහෝදරයා**



***නියමුවා:- 129වැනි මැයි දින සැමරුම එළඹ තිබෙනවා. වත්මන් ලාංකේය වැඩකරන ජනතාව මුහුණ දී සිටින ගැටලු ඔබ හඳුනා ගන්නේ කොහොමද?***

***වසන්ත සමරසිංහ සහෝදරයා:-*** ලොව පුරා මිලියන 3500ක් පමණ වන වැඩකරන ජනතාව සමග 2019 ජාත්‍යන්තර වැඩකරන ජනතා දිනය සැමරීම සඳහා ලාංකේය වැඩකරන ජනතාවත් සූදානම් වෙමින් සිටිනවා. 1886 හේමාකට්වලින් පටන් ගත්ත අරගලයට, එහි සටන්පාඨ, මෙන්ම ඉල්ලීම් වසර 129කට පසුවත් එලෙසම පවතිනවා. වර්තමානය වන විට 'ශ්‍රම සූරාකෑම ඩිජිටලයිස්' වෙලා. තාක්‍ෂණයේ වර්ධනය මුළුමහත් ජනතාවගේ යහපත වෙනුවෙන් යොදා ගැනීම වෙනුවට ප්‍රාග්ධන හිමියන්ගේ ලාභ වැඩි කිරීම වෙනුවෙන් යොදා ගන්නවා.

වර්තමානය වන විට අප මුහුණ දී සිටින ප්‍රධානතම අභියෝගය 'Smart exploitation'වලට එරෙහි සටනට ලෝකය වේගයෙන් ඉදිරියට යනවා. නමුත් වැඩකරන ජනතවාගේ ජීවිත ගමන් කරන්නේ අනෙක් පැත්තට. අද එක රැකියාවක් කරලා ජීවත්වෙන්න බැහැ. පැය 08 වැඩ දිනය අද ජීවත්වීම සඳහා ශ්‍රමය විකුණන අයෙකුට ඉතාමත් කලාතුරකින් ලැබෙන දෙයක්. වැඩකරන හැම කෙනෙක්ම පැය 12 වැඩමුරයක්, නැත්නම් පැය 10 වැඩමුරයක් නැතිනම් පැය 08න් පස්සේ වෙනත් තැනක Part Time රස්සාවක් කරනවා. අපේ රටේ ආණ්ඩුවත් කරන්නේ එම තත්වයන් වර්ධනය කරන දිසාවට වැඩ කිරීමයි.

***නියමුවා:- ඔබ කියන්නේ ආණ්ඩුවේ මැදිහත් වීමෙන් වැඩකරන ජනතාවට යහපතක් නැහැ කියලද?***

***වසන්ත සමරසිංහ සහෝදරයා:-*** ඔව් අනිවාර්යයෙන්ම. අපේ රටේ තියෙන්නේ 'ධනපති හෙවනැලි ආණ්ඩු' ඒ අයට රටේ ජනතාව ගැන කිසිදු තැකීමක් නැහැ. රටේ බඩු මිල ඉහළ යනවා. රුපියල අවප්‍රමාණය වෙලා මිලදී ගැනීම පහළ යනවා. ආණ්ඩුවට උත්තර නැහැ. ඒකට හේතුව මේ රට 'ධනපති ක්‍රමය කඩා වැටුන රටක්' නිසා. ක්‍රමවේද නැති, ජනතාවට වගවීමක් නැති ආණ්ඩු. රටේ වැඩකරන ජනයාට අයිති EPF එක සියලු ආණ්ඩු විසින් කොල්ලකනවා. නීති ක්‍රියාත්මක නැහැ. පසුගිය ආණ්ඩුවත්, මේ ආණ්ඩුවත් දෙකම Man Power වහල් ක්‍රමය නීතිගත කරන්න නීති ගෙන එන්න කටයුතු කරනවා. ඒ විතරක් නෙවෙයි, ආණ්ඩුව අසාර්ථකයි. ක්‍රමය අසාර්ථකයි කියලා දන්න මේ පාලකයෝ ජනතාවගේ විරෝධයන් පාලනය කිරීමට මර්දනය දියත් කිරීමටයි සැලසුම් සකස් කරන්නේ. ත්‍රස්තවාදය වැළැක්වීමේ පනත අහෝසි කිරීමට ගෙන එන 'ප්‍රති ත්‍රස්ත පනත' ඒකට කදිම උදාහරණයයි. සියලු මිනිස් ක්‍රියාකාරකම් ත්‍රස්තවාදී ක්‍රියා ලෙස අර්ථකථනයට මෙම පනතින් කටයුතු කර තිබෙනවා. නෝනටයි, මහත්තයටයි හැර කිසි කෙනෙකුට එකතුවෙලා තමන්ගේ ප්‍රශ්න ගැන කථා කරන්න බැහැ. එහෙම වුණොත් එම ක්‍රියාව ත්‍රස්තවාදී ක්‍රියාවක් ලෙස අර්ථකථනය කරන්න මෙම පනත අනුව කටයුතු කරනවා.

එපමණක් නෙවෙයි, කිසිදු සමාජ රැකවරණයක් නැති රටක් තුළ කාන්තාවන් රාත්‍රී සේවයේ යෙදවීමට ඇති බාධා ඉවත් කරනවා. අද ආණ්ඩුව වැඩ කරන්නේ ධනපති හෙවනැලිවල වුවමනාවටයි. පැය 12 ලබාදීමට වෘත්තීය සමිති විරුද්ධ වෙනකොට කම්කරු ඇමති ඒකට අනුමැතිය දෙනවා. වැඩකරන ජනතාවට බලපාන නීති වැඩකරන ජනතාවට හොරෙන් සංශෝධනයට ක්‍රියාත්මක වෙලා. වෘත්තීය සමිති මර්දනයට කටයුතු කරපු එකදු ක්‍රියාවකට එරෙහිව නීතිය තිබුණට ඒක ක්‍රියාත්මක කරන්න කම්කරු දෙපාර්තමේන්තුව කටයුතු කරලා නැහැ.

***නියමුවා:- ගෝලීය ධනවාදය උත්සාහ දරමින් සිටින්නේ වැඩකරන ජනතාවට තමන් අයිති කම්කරු පංතියට බව අමතක කරවීමටයි. මේ තත්වය තුළ කම්කරු ජනතාව සංවිධානය කිරීමේ අභියෝගය කවරාකාරද?***

***වසන්ත සමරසිංහ සහෝදරයා:-*** මේ අභියෝගයන්ට මුහුණ දීම සඳහා වැඩකරන පංතිය සංවිධානය කිරීම වෘත්තීය සමිති ව්‍යාපාරය හමුවේ ඇති ප්‍රධානතම අභියෝගයයි. විශ්‍රාම වැටුප් කප්පාදුව පිළිබඳව නිශ්චිත පිළිතුරක් නැහැ. නව බඳවාගැනීම් විධිමත් නැහැ. වැටුප් විෂමතා නිවැරදි කිරීමට ප්‍රතිපාදනයක්, ක්‍රමවේද නැහැ. එමෙන්ම රාජ්‍ය දේපළ විකිණීමට එරෙහිව දැවැන්ත අරගලයක් වුවමනායි. එය පෙළගැස්වීම සංකීර්ණ මෙන්ම දුෂ්කර කර තිබෙන්නේ 'නවීන ලෝකය' යයි හඳුන්වමින් 'සුදු කරපටි'වල සිට සූරාකෑම සඟවා තිබෙනවා. තාක්‍ෂණය, ඵලදායීතාවය, නාස්තිය අවම කිරීම, බහු කාර්යය රැකියා වැනි වචන තුළ සූරාකෑම සඟවා තිබෙනවා. ශ්‍රමිකයා විසින් සියල්ල සිදුකර ප්‍රාග්ධන හිමියාගේ ලාභය ආරක්‍ෂා කර දුන්නද ශ්‍රමිකයාට ලැබෙන්නේ සොච්චමයි.

අද රටේ අවම වැටුප රු.10,000/=. මෙයට අයවැය සහන දීමනා පනත් දෙකකින් එකතු වූ රු. 3500/= සමග රු.13,500/= පමණයි. හැබැයි පවුලක් මාසිකව ජීවත් වෙන්න රු. 50,000/=කට වැඩිය වුවමනායි. වතු කම්කරු දිනක අවම වැටුප රු. 700/= දින 30 ක් වැඩ කළත් මේ අය ජීවත්වෙන්නේ කොහොමද? මේ දුෂ්කර ජීවන අරගලයට හිරවෙලා සිටින ශ්‍රමිකයින් අද ප්‍රාග්ධනයේ සිරකාරයින් බවට පත්ව එය තුළම දියවෙමින් තිබෙනවා. ඔවුන්ට ජීවිතයක් නැති කරලා තියෙන්නේ. කම්කරුවාට තම පංතිය අමතක කරලා.

අද ශ්‍රමය විකුණන ශ්‍රමිකයන් තමයි තවත් ශ්‍රමිකයන් සූරාකෑමට උදව් කරන්නේ. ගෝලීය ධනවාදය තුළ වැඩකරන ජනතාව ඇතිකර තිබෙන මතවාදය විසිනුයි එය සිද්ධ වෙන්නේ. 'කම්කරු පංතිය' වෙනුවට 'වැඩකරන ජනතාව' ලෙස පෙනුම වෙනස් කර තිබෙනවා. එයට කම්කරු පංතිය ගොදුරු කර ගැනීමට විවිධ උපායමාර්ග, තාක්‍ෂණ, නව නිෂ්පාදන ක්‍රම හඳුන්වා දී තිබෙනවා. ඒ මගින් ධනපති පංතිය තම වුවමනාවන් ඉටු කරගන්නවා.

> "ශ්‍රමය නොමැතිව කිසිදු නිෂ්පාදනයක් සිදු නොවන බව ලෝකයට ඒත්තු ගැන්වීම, කම්කරු ජනතාවට තේරුම් කර දීම අද දවසේ වෘත්තීය සමිති හමුවේ ඇති ගෝලීය අභියෝගයක්. මාක්ස් අදටත් වලංගු වෙන්නේ, මේ ගනුදෙනුව බේරාගැනීමට ඔහුගෙන් බොහෝ දේ ඉගෙන ගැනීමට ඇති නිසා. අප රට තුළත් ජාත්‍යන්තරය තුළත් සියලු වැඩකරන ජනයා ඒකරාශි කිරීමේ අරමුණු ඇතිව වැඩකරනවා. මෙය ජයගත හැකි අභියෝගයක් වන අතර එය අනිවාර්යයෙන් ශ්‍රමයේ ජයග්‍රහණයෙන් කෙළවර විය යුතුයි."

රැකියාව අහිමි කරවීම පිළිබඳව හදන අනියත බිය විසින් ඔවුන් ගෝලීය ධනපති පංතියට හසු වී තිබෙනවා. ශ්‍රමය නොමැතිව කිසිදු නිෂ්පාදනයක් සිදු නොවන බව ලෝකයට ඒත්තු ගැන්වීම, කම්කරු ජනතාවට තේරුම් කර දීම අද දවසේ වෘත්තීය සමිති හමුවේ ඇති ගෝලීය අභියෝගයක්. මාක්ස් අදටත් වලංගු වෙන්නේ, මේ ගනුදෙනුව බේරාගැනීමට ඔහුගෙන් බොහෝ දේ ඉගෙන ගැනීමට ඇති නිසා. අප රට තුළත් ජාත්‍යන්තරය තුළත් සියලු වැඩකරන ජනයා ඒකරාශි කිරීමේ අරමුණු ඇතිව වැඩකරනවා. මෙය ජයගත හැකි අභියෝගයක් වන අතර එය අනිවාර්යයෙන් ශ්‍රමයේ ජයග්‍රහණයෙන් කෙළවර විය යුතුයි.

***නියමුවා:- ගෝලීය වශයෙන් මෙන්ම දේශීය වශයෙන්ද වැඩකරන ජනතාවට ඔවුන්ගේ අයිතිවාසිකම්, සුභසාධන කප්පාදු වෙමින් යන ප්‍රවණතාවයන් දැකිය හැකියි. මීට එරෙහි වෘත්තීය සමිති හා දේශපාලන පෙරමුණේ අරගලය විස්තර කළොත්.***

***වසන්ත සමරසිංහ සහෝදරයා:-*** ලෝකය පුරා මෙන්ම රට තුළද පොදු ජන අයිතීන් අහිමි වන ප්‍රවණතාවයක් තිබෙනවා. කම්කරුවන්ට, ගොවියන්ට, සාමාන්‍ය ජනයාට අධ්‍යාපනයට, සෞඛ්‍යයට, සුභසාධනයට මෙම සියලු සමාජ ශ්‍රේණි හා අයිතිවාසිකම් අහිමි වීම සිදුවෙනවා. මෙම සියලු අහිමිවීම්වල ප්‍රධාන සාධකය වන්නේ ධනපති පංතියට තම පැවැත්ම තහවුරු කර ගැනීමට අවශ්‍ය වීමයි. ලොව පුරා කෝටි 350ක් පමණ වන ශ්‍රමිකයින්, ඒකරාශි වුවහොත් කුමක්ද කළ නොහැක්කේ? නමුත් රට තුළ සිටින කම්කරුවන් අපංතික ලෙස බෙදී පැවතීම අප විසින් පරාජය කළ යුතුයි. වැඩබිම්, ගොවිබිම්, විශ්වවිද්‍යාල, පාසල්, ගම් වැනි සියලු සටන් බිම් පොදු සතුරාට එරෙහිව පෙළගැස්විය යුතුයි. එය දේශපාලන පෙරමුණේ කාර්යභාරයක්. නමුත් එය සියලු ජනයාගේ සහභාගිත්වයෙන් සිදුකළ යුතු බව අපගේ දැඩි විශ්වාසයයි.

ජනතාවට සතුට අහිමි කළ මෙම ධනපති ක්‍රමයට එරෙහි අරගලයට වෘත්තීය සමිති දේශපාලන කටයුතුවල අනිවාර්යයෙන් මැදිහත් විය යුතුයි. මොකද දේශපාලනයෙන් වියුක්ත කළ කිසිවක් සමාජයේ නැහැ. කම්කරු පංතියට වෙනම අරගලයක් නැහැ. සමාජ අරගලයක් තියෙන්නේ. ඒක දේශපාලන අරගලයක්.

***නියමුවා:- ලාංකේය කම්කරු ජනතාව රටේ පවතින ජරාජීර්ණ දේශපාලනය වෙනස් කරන ප්‍රමුඛ බලවේගයක් බවට පත් වනු ඇති බවට බලාපොරොත්තු තැබිය හැකිද?***

***වසන්ත සමරසිංහ සහෝදරයා:-*** වැඩකරන ජනතාව තමන් ජීවත්වීම සඳහා ශ්‍රමය විකුණන බව තේරුම් ගැනීමත් සමග මේ පවතින ක්‍රමය තුළ ඔවුන්ට පැවරී ඇති කාර්යය ඉටු කරාවි. රටේ අති බහුතරය වන්නේ වැඩකරන ජනතාව හා ඔවුන්ගේ යැපෙන්නන්. ඔවුන්ට වඩා හොඳ ජීවිතයක්, දරුවන්ට හොඳ අධ්‍යාපනයක්, හොඳ සෞඛ්‍යය සේවයක්, ජීවත්වීමට නිවසක්, සැඳෑ සමය ගත කිරීමට ආරක්‍ෂාකාරී රටක් වෙනුවෙන් වැඩකරන ජනතාවට මේ ජරාජීර්ණ වෙමින් පවතින දේශපාලන ක්‍රමය අනිවාර්යයෙන් වෙනස් කළ යුතුමයි. ඒ සඳහා වැඩකරන ජනතාව තමන්ගෙන්ම ඉගෙන ගත යුතුයි. මෙය දුප්පත්කමවත්, නූගත්කමවත් නෙවෙයි. උගත් මෝඩකම් ජනතාව පීඩාවට පත්කරලා තියෙන්නේ. අපි ජීවත්වන මේ සමාජය මෙතෙන්ට පත්කළ සියලු දෙනා එලවා දැමීමට වැඩකරන ජනතාව කටයුතු කළ යුතුමයි. එවිට ඔවුන්ට අනිවාර්යයෙන් හොඳ ජීවිතයක් ලැබෙයි.

# අනුර සහෝදරයාට කැනඩාවේදී උණුසුම් ප්‍රතිචාර

ශ්‍රී ලංකාව ගොඩනැංවීම සම්බන්ධයෙන් ජ.වි.පෙ.ට ඇති වැඩපිළිවෙල කැනඩාවේ වෙසෙන ශ්‍රී ලාංකිකයන්ගේ ප්‍රශංසාවට ලක් වූ අතර ලංකාවේ ජාතික සමගිය උදෙසා පක්ෂය හා අනුර සහෝදරයා සිදු කරන මෙහෙය අගය කිරීමේ උපහාර දැක්වීමක්ද ඔවුන් විසින් සිදු කරන ලදී.

ජනතා විමුක්ති පෙරමුණ යනු හුදෙක් මෙරට තුළට පමණක් දේශපාලනය කරන ව්‍යාපාරයක් නොව රටවල් ගණනාවක වෙසෙන ශ්‍රී ලාංකිකයින් අතර ක්‍රියාත්මක වන දේශපාලන පක්ෂයකි. අද දවසේ තම සංවිධාන ජාලය ලෝකයේ බොහෝ රටවල් ප්‍රමාණයක ශක්තිමත්ව පවත්වාගෙන යාමට ජ.වි.පෙ.ට හැකිව තිබේ.

ඒ අනුව කැනඩාවේ වාසය කරන ජ.වි.පෙ. සාමාජිකයින් විසින් පසුගිය අප්‍රේල් 11 සිට 23 දක්වා කැනඩාවේ ප්‍රධාන නගර ගණනාවක "රට දිනවන අභියෝගයට අපි සූදානම්" යන මැයෙන් සම්මන්ත්‍රණ මාලාවක් සංවිධානය කර තිබුණි.

ජ.වි.පෙ. නායක අනුර දිසානායක සහෝදරයාගේ මූලිකත්වයෙන් මෙම සම්මන්ත්‍රණ පැවති අතර ටොරොන්ටෝ, ඔටාවා, මොන්ට්‍රියල් හා කැල්ගරි යන නගරවල පැවති ප්‍රසිද්ධ සම්මන්ත්‍රණයන් සඳහා එරට වෙසෙන ශ්‍රී ලාංකිකයෝ විශාල පිරිසක් සහභාගී වී සිටියහ. එයට අමතරව එරට ජීවත්වන මුස්ලිම් හා දමිල ප්‍රජාව සංවිධානය කළ විශේෂ හමු කිහිපයකටද ඔහු එක් විය.




# ගොවි අරගලය තවත් ඉදිරියට

සමස්ත ලංකා ගොවිජන සම්මේලනය මේ මොහොත වන විට ගොවි ජනයාගේ අරගල මධ්‍යස්ථානය බවට පත්වී තිබේ. පක්ෂ බේදයකින් තොරව ගොවි ජනයා තම ඉල්ලීම් දිනා ගැනීම සඳහා මෙම මධ්‍යස්ථානය වටා එක් රොක් වෙමින් සිටී.

පසුගිය අප්‍රේල් 01වැනිදා සමස්ත ලංකා ගොවිජන සම්මේලනය විසින් අම්බලන්තොට නගරයේදී 'වී මිලදී ගැනීමේ යාන්ත්‍රණය විධිමත් කරනු', 'වී කිලෝවක සහතික මිල රු.50-55 කරනු' යන මැයෙන් ආණ්ඩුවට බලකෙරෙන උද්ඝෝෂණයක් පවත්වන ලදී.

2015 වසරේ පැවති මහ මැතිවරණයේදී වී කිලෝවක සහතික මිල රු50ක් කරන බවට පොරොන්දු වී බලයට පත් ආණ්ඩුව එක් කන්නයකදී පමණක් එම මිලට වී කිලෝවක් මිලදී ගෙන ද ඇත. එහෙත් පසුව ආණ්ඩුව විසින් එය නොසලකා කටයුතු කරමින් සිටියි.

වැඩි වන ජීවන වියදම හමුවේ තවදුරටත් වී කිලෝවක සහතික මිල රු 38-41 අතර පවත්වාගෙන යෑම තුළින් ගොවි ජනයා තවදුරටත් අසරණ වීම වළක්වා ගැනීමේ අරමුණින් ගොවිජන සම්මේලනය මෙම ඉල්ලීම ආණ්ඩුවට යොමු කර තිබේ. අම්පාර, දෙහිඅත්තකණ්ඩිය ආදී ප්‍රදේශයන්හිද මෙම උද්ඝෝෂණය මාලාව පැවැත්වූ අතර අම්බලන්තොට උද්ඝෝෂණය ජාතික සංවිධායක නාමල් කරුණාරත්න, ප්‍රධාන ලේකම් ටී.බී. සරත් යන සහෝදරවරුන්ගේ ප්‍රධානත්වයෙන් පැවැත්විණි.



# ජ.වි.පෙ. වතු ජනයා හමුවට



මෙරට දේශපාලනය තුළ වඩාත්ම රැවටීමකට ලක් වූ ජන කොට්ඨාසයක් ලෙස වතු ආශ්‍රිතව වැඩ කරන ජනයා හැඳින්විය හැක. ජාතිවාදය මතුකරමින් මැති ඇමතිකම් ගත් වතුකරයේ දේශපාලඥයින් මෙන්ම ඔවුනගේ වෘත්තීය සමිතිද නිරන්තරයෙන් සිදු කළේ වතු ජනයා නැවත නැවතත් රැවටීමයි. පසුගිය කාලයේ වූ රු.1000 වැටුප් ඉල්ලීම තුළද මේ බව වඩාත් හොඳින් තහවුරු විය.

පසුගිය කාලය තුළ ජනතා විමුක්ති පෙරමුණේ නායක අනුර දිසානායක සහෝදරයා වතුකරයේ සහෝදර ජනයා මුහුණ දෙන වැටුප් ඇතුළු ගැටලු සම්බන්ධයෙන් සාකච්ඡා කිරීම සඳහා ඒ ප්‍රදේශයන් හි සංචාරක නිරත විය. බොහෝ දේශපාලඥයන් පොදු ජනයා මුණ ගැසීමට යනු ලබන්නේ මැතිවරණයක් ආසන්නයේදී වුවද මෙය එවැනි ඡන්ද බලාපොරොත්තුවෙන් ගිය ගමනක් නොව ඔවුන්ගේ වෘත්තීය අරගලයට සහය පළ කිරීමක් විය.

පසුගිය අප්‍රේල් 06, 07 යන දිනයන්හිදී අනුර දිසානායක සහෝදරයා බණ්ඩාරවෙල ලියන්ගහවෙල වත්ත, හාලිඇළ රොක්තැන්න වත්ත, හපුතලේ කැල්බන් වත්ත, දඹේතැන්න, ඉඳල්ගස්හින්න බෝවවත්ත සහ දියතලාව ආර්කේඩියාවත්ත යන ප්‍රදේශයන්හි වතු ජනයා හමුවූ අතර එහිදී එම ජනයාගෙන් උණුසුම් පිළිගැනීමක් ලැබුණි.

මෙම අවස්ථාව සඳහා ජ.වි.පෙ. බදුල්ල දිස්ත්‍රික් නායක ඌව පළාත් සභා මන්ත්‍රී සමන්ත විද්‍යාරත්න සහ සමස්ත ලංකා වතු කම්කරු සංගමයේ සභාපති කිට්නන් සෙල්වරාජ් යන සහෝදරවරුද සහභාගි වූහ.

# නැගූ අපරාජිත ඔබේ හඬ ඇදෙයි මතු මතු රැව් දිදී

"අවසානයේදී නව දේශයක්, නව ලොවක් බිහිකෙරෙමින් නව ඉරක් , විමුක්තියේ රතු උදාර ඉරක් පායනු ඇත. එදිනට අප්‍රේල් සිද්ධීන් පිළිබඳ නිවැරදි වූත්, යුක්ති සහගත වූත් විනිශ්චයක් කෙරෙනු ඇත. ඒ විනිශ්චය විසින් මාත්, මාගේ සගයනුත් නිදහස් කොට මුදාහරිනු ඇත." ( අප මරා දැමුවද අප නගන හඬ සදා නොමියෙනු ඇත - පිට 185-186) - රෝහණ විජේවීර

1971 අප්‍රේල් 05 වනදා ඉතිහාසයට එක් වනුයේ පැවති ධනේශ්වර පාලනයට එරෙහිව ලාංකේය නිර්ධන පංතියේ ප්‍රථම සංවිධානාත්මක සන්නද්ධ නැගිටීම ලෙසය. එවකට පැවති සමගි පෙරමුණ ආණ්ඩුව අරගලකරුවන්ට එරෙහිව දඬුවම් පැමිණවූයේ අතීතයට බලපාන සේ නීති සකස් කරමිනි. මෙවන් මර්දනයන්ට මුහුණ දෙමින් ජ.වි.පෙ. මේ වනවිට බොහෝ දුර පැමිණ තිබේ.

මෙවරද "සදා සමරමු සොහොයුරෝ" යන තේමාව යටතේ ජනතා විමුක්ති පෙරමුණේ 48වැනි අප්‍රේල් විරු සැමරුම් මාලාව මෙරටදී මෙන්ම විදේශයන්හිදීද අභිමානවත් අන්දමින් පැවැත්වීමට ජ.වි.පෙ.ට හැකි විය.

අප්‍රේල් 05වැනිදා පස්වරුවේ අනුරාධපුර, මහනුවර සහ මාතර යන නගරයන්හි පිළිවෙළින් ජ.වි.පෙ. ප්‍රධාන ලේකම් ටිල්වින් සිල්වා, දේශපාලන මණ්ඩල සභික කේ.ඩී. ලාල් කාන්ත සහ මධ්‍යම කාරක සභික ඌව පළාත් සභා මන්ත්‍රී සමන්ත විද්‍යාරත්න යන සහෝදරවරුන්ගේ ප්‍රධානත්වයෙන් සහ විශාල ජන පිරිසකගේ සහභාගිත්වයෙන් මෙම විරු සමරු පවත්වන ලදී.



ඉතිහාසයේ කතාව... 09

# ඉතිහාසය තුළ 'පවුල' බිහිවූ හැටි

ඉතිහාසයේ එක්තරා වකවානුවක දේපළ මත මානව සමාජය පංතිවලට බෙදීමත් සමග එතෙක් සමාජය දැන නොසිටි ආයතන හා සමාජ සංස්ථා ගණනාවක්, සංකල්ප ගණනාවක් බිහිවිය. පංති සමාජය තුළ ආගම බිහිවූ හැටි දැනටමත් අප කථාකර ඇත. මානව සමාජයේ කුඩාම තැනුම් ඒකකය ලෙස වර්තමානයේ පිළිගැනෙන 'පවුල' බිහිවූයේද පංති සමාජයේ බිහිවීමත් සමගය.

'පවුල' මානව සමාජයේ ආරම්භයේ සිටම පැවති සංවිධාන ආකෘතියක් නොවේ. මානව සමාජයේ ආදි කාලීන මුල් යුගයේදී ජනතාවගේ සංවිධානමය ආකෘතිය වී තිබුණේ ගණ හා ගෝත්‍රය. ගණය කුඩාම ඒකකය වූ අතර ගෝත්‍රය පුළුල් ඒකකය විය. ප්‍රාථමික සාමූහික ක්‍රමය පැවති මුල් යුගයේ ගණ හා ගෝත්‍ර තුළ පැවතියේ පොදු සාමූහික බවකි. එහි නූතන පවුල නමින් පවතින ඒකකය තිබී නැත.

### ලිංගික සබඳතා හා පවුල

සෑම ජීවියකුටම පොදු සොබාදහම විසින් වර්ගයා බෝකිරීම සඳහා දායද කළ ලිංගික සබඳතා ක්‍රමයක් තිබේ. මානව සමාජය ආරම්භයේදී එය පැවතී ඇත්තේ 'අවිචාරවත් ලිංගික සබඳතා' ලෙස වර්තමාන සමාජය විසින් හඳුන්වන ක්‍රමයකටය. ලෙවිස් මොර්ගන් නම් මානව විද්‍යාඥයාට අනුවත්, එංගල්ස් විසින් කරන ලද අධ්‍යයනයන්ට අනුවත් මිනිසාගේ මුල් අවදියේදී සියලුම පිරිමි සියලුම ගැහැනුන් සමග එකට ජීවත්වී තිබේ. ජනගහනය ඉතා කුඩා වීමත් වර්ගයා බෝකර ගැනීමේ අවශ්‍යතාවයත් සතුන්ගෙන් පරිණාමය වන විට පැවති තත්වයත් යන සාධක මත මෙය තීරණය වී තිබේ. අවිචාරවත් ලිංගික සබඳතා ලෙස හඳුන්වනු ලැබුයේ එයයි. එහෙත් පසුව සමාජය ටිකෙන් ටික සංවර්ධනය වෙද්දී මෙම ලිංගික සබඳතා දෙදෙනෙක් අතර වන විශේෂ සබඳතාවයක් දක්වා වර්ධනය වෙමින් පැවති බව පැවසේ.

ප්‍රාථමික සාමූහික සමාජය ක්‍රමානුකූලව වර්ධනය වෙද්දී අවිචාරවත් ලිංගික සබඳතාවල වෙනසක් ඇති වී තිබේ. පවුල නම් ඒකකය තැනීමේ ආරම්භක රූපකය ලෙස 'ලේ ඥාති පවුල' නම් පුළුල් ලිංගික සබඳතා සහිත කණ්ඩායම බිහිවී තිබේ. එය සිදුවී ඇත්තේ ජෛව විද්‍යාත්මක අවශ්‍යතා හා සමාජමය අවශ්‍යතා අනුව එක්තරා මොහොතක දෙමාපියන් හා දරුවන් අතර ලිංගික සබඳතා නවතා දැමීමත් සමගය. ඉන්පසු සම වයස් කාණ්ඩවල අය කවයක් ලෙස සකස් වී ඒ ඒ වයස් කාණ්ඩ තුළ ලිංගික සබඳතා පවත්වා ඇත. උදා. ලෙස ආච්චිලා හා සීයලා එක කවයකුත්, දෙමාපියන් තවත් කවයකුත්, දූ දරුවන් තවත් කවයකුත් ලෙස සම වයස්වල අය අතර සබඳතා පවත්වා ඇති අතර ලේ ඥාති පවුල් ක්‍රමය ලෙස එය හැඳින්වී තිබේ.



"අප කිසිදු තත්වයක් යටතේ, ආගමික ප්‍රශ්නය පංති අරගලයට සම්බන්ධ නැති 'බුද්ධිමත්' ප්‍රශ්නයක් වශයෙන්, වියුක්ත, විඥානවාදී ආකාරයකින් ඉදිරිපත් කිරීමේ වරදට වැටිය යුතු නැත. ධනේශ්වරයින් අතර රැඩිකල් ප්‍රජාතන්ත්‍රවාදීන් මේ වරද කර ඇත්තේ ස්වල්ප වතාවක් නොවේ. කම්කරු ජනතාව පීඩනයට හා අමානුෂික ලෙස රැළු තත්වයකට ඇදහෙළීම මත පදනම් වූ සමාජයක ආගමික අගතීන් හුදෙක් ප්‍රචාරක මාධ්‍යවලින් පමණක් දුරුකළ හැකි යයි සිතීම මෝඩකමකි."

**ලෙනින්**
**ආගම ගැන,**
**12වැනි පිටුව**



### පුනාලුවා පවුල

ලේ ඥාති පවුල තවදුරටත් පරිණාමය වීමේ ප්‍රතිඵලයක් ලෙස යුරෝපා රටවල 'පුනාලුවා පවුල' නමින් හඳුන්වන පවුල් ආකෘතියක් ගොඩනැගී තිබේ. එය සිදුව තිබෙන්නේ පළමුව දෙමාපියන් හා දරුවන් අතර ලිංගික සබඳතා නවතා දැමුවාක් මෙන්ම දෙවනුව එක මවක් කුසින් උපන් සහෝදර සහෝදරියන් අතර ලිංගික සබඳතා නවතා දැමීම සමගය. මේ සමග වංශ නම් සංවිධාන ව්‍යුහයක් නිර්මාණය වී තිබේ. එවිට මවගේ දරුවන් වංශය තුළ සිටි අතර වංශයේ පැවැත්ම මව මූලික කර සිදුවිය. මෙහිදී වංශය තුළ ලිංගික සබඳතා තහනම් විය. ඊට හේතුව එක් වංශයක් තුළ සිටින්නේ මවකගේ දරුවන් වීම නිසාය. ඒ අනුව ලිංගික සබඳතා සිදුවී ඇත්තේ වංශ දෙකක් අතරය. එවිට දරුවන්ගේ පියවරු හා ඔවුන්ගේ සහෝදරියෝ එක් වංශයක් තුළත් දරුවන්ගේ මව්වරු හා ඇගේ සහෝදර සහෝදරියෝ එම වංශය තුළත් සිට ඇත. එවිට ලේ ඥාති සහෝදරියන් අතර ලිංගික සබඳතා අහෝසි වී නෑනා-මස්සිනා ලෙස අප සලකන ඥාති සබඳතා අතර ලිංගික සබඳතා සිදුවිය. මෙම සබඳතාවය පුනාලුවා පවුල ලෙස සලකති.

සමාජය තවදුරටත් වර්ධනය වෙද්දී මෙම ලිංගික සබඳතා පවත්වන කණ්ඩායම් තුළ විශේෂ ආකර්ෂණයක් ඇතිකරගත් දෙදෙනෙක් අතර විශේෂ බැඳීමක් ඇති වී තිබේ. ඔවුන් විසින් දරුවන් ලැබෙන කාලය තුළ දෙදෙනා එක්ව වාසය කිරීමද සිදුකර ඇත. මෙය 'යුගලන පවුල' ලෙස හඳුනාගෙන තිබේ. මානව සමාජය තුළ මුල්වරට පෞද්ගලික ලිංගික ආලය යන්තමින් ආරම්භ වී ඇත්තේ මෙම කාලයේය.

දේපළවල පෞද්ගලික අයිතිය ඇතිවන විට එහි අයිතිය අත්පත් කරගත්තේ වංශය තුළ සිටි බලයක් පෑමට සමත් පිරිමින්ය. පෞද්ගලික දේපළ බිහිවීමත් එම දේපළවල අයිතිය පිරිමින් සතුවීමත් සමග තම දේපළ තම දරුවනට දීමේ වුවමනාවද මතුවිය. එහෙත් ඒ වන විට පැවති පවුල් ක්‍රමය අනුව දරුවන්ගේ පියා තීරණය කළ නොහැකි විය. එසේනම් තම දේපළ තම දරුවන්ට දීම සඳහා තමන්ගේ දරුවන් තහවුරු කරගැනීමේ වුවමනාව දේපළ හිමි පිරිමින්ට ඇතිවිය. ඒ සඳහා කාන්තාව එක් පිරිමියෙකු සමග පමණක් ලිංගික සබඳතා පවත්වන විවාහ ක්‍රමයක් අවශ්‍ය විය.

### පෞද්ගලික දේපළ හා පවුල

මෙලෙස මානව සමාජය තුළ ආරම්භක අවදියේ ලිංගික සබඳතා පවත්වන කණ්ඩායම් වෙනස් වෙමින් පොදු ලිංගික සබඳතාවයක සිට දෙදෙනෙක් අතරවන විශේෂ ඇල්මක් සහිත ලිංගික සබඳතාවයක් දක්වා ස්වාභාවික ලෙස වෙනස් වෙමින් ආ බව ඉතිහාසය තුළ දැකිය හැක. එහෙත් ජෛව විද්‍යාත්මක හා සමාජමය හේතු මත එලෙස ක්‍රමිකව වෙනස් වෙමින් ආ පවුල් රූපිකයන් එක්වරම වත්මන් ඒකභාර්යා ව්‍රතය සහිත පවුල බවට පත්වූයේ පෞද්ගලික දේපළ ඇතිවීමත් සමගය.

ප්‍රාථමික සමාජයේ පැවති ලිංගික සබඳතාවල ස්වභාවය අනුව දරුවන්ගේ පියා තීරණය කළ නොහැකි විය. එබැවින් දරුවන්ගේ 'අයිතිය' කියවුණේ මවගේ පැත්තෙනි. දරුවන් මවගේ දරුවන් විය. පියා නිශ්චිත නොවීය. ඒ නිසාම එම සමාජය මාතෘ මූලික සමාජයක් විය. මෙම සමාජය ක්‍රමිකව වර්ධනය වී වංශ පැවති කාලයේ සමාජ දේපළ අවසාන වශයෙන් අයිතිවූයේ වංශයටය. ඒවා වංශයේ පොදු දේපළ විය. මේ කාලයේ දුන්න හා ඊතලය සොයාගෙන තිබූ අතර ලෝකඩ නගුල හා පොරවද නිපදවා ගෙන තිබුණි. ඒ සමග නිෂ්පාදනය ක්‍රමයෙන් වර්ධනය විය. සතුන් දඩයම් කිරීමට අමතරව සතුන් ඇතිකිරීමත් ධාන්‍ය, එළවළු, පලතුරු වගාකිරීමත් ඇරඹුණි. ඒ සමග නිෂ්පාදනයන් වැඩි විය. එහි ප්‍රතිඵලය වූයේ ඉතිහාසය එතෙක් දැන නොසිටි සංකල්පයක් වූ 'අතිරික්ත නිෂ්පාදනය' ඇති වීමය. එනම් නිෂ්පාදකයා නිපදවන දේ ඔහුගේ අත්‍යාවශ්‍ය පැවැත්ම වෙනුවෙන් පරිභෝජනය කළ පසු තව යමක් ඉතිරි වීමය. ඒ සමගම අතිරික්ත නිෂ්පාදනය බිහි කිරීමට ශ්‍රමය සමත් විය. සූරාකෑමේ හැකියාවද මේ සමග වර්ධනය විය.

### අතිරික්ත නිෂ්පාදනයේ පලවිපාක

පැරණි ගෝත්‍රය තුළ නිෂ්පාදන උපකරණවල වර්ධනය සමග නිෂ්පාදිතයන්ගේ වර්ධනයද සිදුවූ බව පැහැදිලිය. එවිට සත්ව රංචුව, කෘෂිකාර්මික ගෙවත්ත ඇති විය. එහි ප්‍රතිඵලය වූයේ මස්, කිරි, ලොම්, හම්ද, එළවළු, පලතුරු හා ධාන්‍යද නිපදවීමය. මෙම දේපළ මුලින් ගෝත්‍රය තුළ වංශයේ දේපළ විය. එහෙත් දේපළ තවදුරටත් වර්ධනය විය. සූරාකෑමේ හැකියාව වර්ධනය වූ විට වැඩ නොකරන අයෙකුට අනිත් අයගෙන් වැඩ ගෙන ඔවුන්ගේ ශ්‍රමයේ අතිරික්තය අත්පත් කර ගැනීමේ හැකියාව ඇතිවූ විට සමාජය තුළ දේපළවලට පෞද්ගලිකව අයිතිය කීම ආරම්භ විය. එනම් පෞද්ගලික දේපළ ඇති විය. දේපළවල පෞද්ගලික අයිතිය ඇතිවන විට එහි අයිතිය අත්පත් කරගත්තේ වංශය තුළ සිටි බලයක් පෑමට සමත් පිරිමින්ය. පෞද්ගලික දේපළ බිහිවීමත් එම දේපළවල අයිතිය පිරිමින් සතුවීමත් සමග තම දේපළ තම දරුවනට දීමේ වුවමනාවද මතුවිය. එහෙත් ඒ වන විට පැවති පවුල් ක්‍රමය අනුව දරුවන්ගේ පියා තීරණය කළ නොහැකි විය. එසේනම් තම දේපළ තම දරුවන්ට දීම සඳහා තමන්ගේ දරුවන් තහවුරු කරගැනීමේ වුවමනාව දේපළ හිමි පිරිමින්ට ඇතිවිය. ඒ සඳහා කාන්තාව එක් පිරිමියෙකු සමග පමණක් ලිංගික සබඳතා පවත්වන විවාහ ක්‍රමයක් අවශ්‍ය විය. එහි ප්‍රතිඵලය වූයේ එතෙක් පැවති වංශ සංවිධානය බිඳවැටී එක් ගැහැනියක් එක් පිරිමියෙකු සමග පමණක් ජීවත්වන ඒකභාර්යා ව්‍රතය සහිත පවුල බිහිවීමය.

ඒ අනුව නූතන පවුල බිහිවූයේ ජෛව විද්‍යාත්මක හෝ සමාජමය වුවමනාවන් නිසා නොව දේපළමය වුවමනාවක් නිසාය. ඒ අනුව නූතන පවුල බිහිවූයේම අර්බුදයන් රැසක් හා ප්‍රතිවිරෝධයක්ද සහිතවය. ඒ පිළිබඳ තවදුරටත් කතා කරමු.

# අලි - මිනිස් ගැටුමේ අවසානය කොතැනද?



පරිණාමය වන අලි ප්‍රධාන වශයෙන් අප්‍රිකානු අලි (Toxodonta Africana) හා ආසියාතික (Elephant Maximus) අලි ලෙස ප්‍රධාන කොටස් දෙකකට වෙන්වී ඇත. ප්‍රධාන අලි විශේෂ දෙක අතර වර්ගීකරණය සඳහා ඔවුන්ගේ ශරීර ලක්ෂණ සැලකිල්ලට ගෙන ඇත. ආසියාතික අලින්ගෙන් ශ්‍රී ලාංකේය අලින් (Elephas maximus maximus) ස්වාභාවික වර්ණ ක්‍රියාවලියට අනුව සුළු වෙනස්කමක් පෙන්නුම් කරයි. ශ්‍රී ලංකාව, ඉන්දියාව, නේපාලය, භූතානය, කාම්බෝජය, ඉන්දුනීසියාව, ලාඕසය, මැලේසියාව. මියන්මාරය, තායිලන්තය ආදී අටවල් 13ක ආසියා මහාද්වීප තුළ අලි දැකිය හැකිය. අනෙක් බොහෝ ආසියාතික රටවල අලි වඳවී ගොස් හමාරය.

වයසින් වැඩිහිටි ඇතින්නක් අලි රංචුවක නායිකාව ලෙස දැකිය හැකි අතර, ලිංගිකව මෝරන පිරිමි සතුන් රංචුවෙන් එළවා දැමෙයි. මෙමගින් ලේ ඥාතිත්වයක් සහිත පැටවුන් බිහිවීම වැළැක්වේ. අලි පැටවකු ආරක්ෂා කිරීම රංචුවේ සාමූහික වගකීමක් ලෙස භාරගැනේ. සාමාන්‍යයෙන් අලියකු වසර 60-75 ජීවත්වන අතර බර කිලෝ ග්‍රෑම් 2000 -4500 දක්වා වේ. දිනකට ආහාර ලෙස කිලෝ ග්‍රෑම් 150-350 ආහාරයට ගන්නා අලියකු ජලය ගැලුම් 25 -50 දක්වා වූ ප්‍රමාණයක් පානය කරයි. අලියකු ආහාර අවශ්‍යතා, ලිංගික අවශ්‍යතා, පාරිසරික ආරක්ෂාව ආදීන් සඳහා සංචරණය කරයි. (දළ වශයෙන් දිනකට කිලෝ මීටර 25 පමණ දෛනික අවශ්‍යතා සඳහා සංචරණය කරයි) සාමාන්‍යයෙන් අලියකු දිනකට පැය 15-16 ක්‍රියාකාරීව සිටී. තෘණ භූමිවල ගැවසීමට හා ආහාර ගැනීමට දැඩි රුචියක් දක්වන අලින් ලංකාවේ හඳුනාගෙන ඇති 3200කට ආසන්න ශාඛ ප්‍රමාණ අතුරින් ශාක විශේෂ 116ක් ආහාරයට ගනී. මෙයින් 27ක් වගාකරන බෝගයන්ය. අලින්ගේ චර්යා පද්ධතිය ඔවුන් පිළිබඳව තීන්දු තීරණ ගැනීමේදී මෙවැනි කරුණු ඉතා සියුම්ව අධ්‍යයනය කළ යුතු වේ.

කෙසේ වෙතත් බොහෝ ආසියාතික රටවලට වඩා ශ්‍රී ලාංකේය පරිසරය අලින්ට ජීවත් වීම සඳහා ඉතා යෝග්‍ය පරිසරයක් වේ. දැනට වසර 3000කට පෙර ශ්‍රී ලාංකේය භූමියේ 90%කට වඩා වැඩි වන වැස්මක් පැවති බව විශ්වාස කෙරේ. ආහාර විවිධත්වය, සුරක්ෂිතතාවය හා දේශගුණය ඉතා යෝග්‍ය වීම හේතුවෙන් මෙම වකවානුව වනවිට සිටි අලි ප්‍රමාණය කොතෙක්දැයි නිශ්චය කළ නොහැක.

ශ්‍රී ලාංකේය දියුණු මානව ශිෂ්ටාචාරයේ ආරම්භය වසර 3000 කට වඩා වැඩි බව ප්‍රකාශ කෙරේ. පුරාණයේ මූලික කරගනු ලැබූ ආසියාතික සමාජ ක්‍රමය තුළ විවිධ මානව ක්‍රියාකාරකම් හා සංස්කෘතික අංගයන්වලට අලින් යොදාගත් බව ඓතිහාසික මූලාශ්‍රවලින් පැහැදිලි වේ. ද්‍රවිඩ සංස්කෘතිය තුළ ගණ දෙවි හැඩය අලින්ගේ හැඩයට යොදා ගැනීමෙන් පැවති අලි මිනිස් සබැඳියාව මැනවින් පැහැදිලිය.

ලොව සුපතල වාරි ශිෂ්ටාචාරය පැවතියේ ශ්‍රී ලංකාවේය. විවිධ වූ ඉදිකිරීම් සඳහා අලින් යොදාගත් බවට සාක්ෂි පවතී. විශේෂයෙන්ම වැව් බැමි හා ඇලවේලි ඉදිකිරීමේදී පස් තැලීම (සුසංහසනය - Compaction) සඳහා අලින් යොදාග න්නා ලදී. එමෙන්ම විවිධ වූ රාජධානීන් ආශ්‍රිතව සංස්කෘතික නිර්මාණයන් සඳහා අලින්ගේ රුව යොදා ගැනිණ. සඳකඩ පහන මෙහිදී නිදසුනකි.

බ්‍රිතාන්‍ය යටත්විජිතකරණය සිදුවන විට ශ්‍රී ලංකාවේ අලි ගහනය 15,000 සිට 20,000 දක්වා වූ බව සඳහන්ය. බ්‍රිතාන්‍යයන් රටට හඳුන්වාදුන් වතු වගාව හා ඉඩම්වලට මිලක් නියම කිරීම හේතුවෙන් පැවති ස්වභාවික පරිසරය උඩු යටිකුරු වන්නට විය. විශාල වනාන්තර එළිපෙහෙලි වන්නට විය. වතු වගාවන් ආරම්භ විය. අලින් මෙම වගාවන්ට පැමිණෙන්නට විය. මේ හේතුවෙන් අලින් ඝාතනය කිරීමට හා ඝාතනය වන සෑම අලියෙකු සඳහා මිලක් නියම විය. අලින් වගාවන්ගේ හතුරෙකු ලෙස හඳුන්වන්නට විය. හෝර්ටන් තැන්න එකම දඩයම් පිටියක් බවට පත්විය. මේ හේතුවෙන් බ්‍රිතාන්‍ය යටත්විජිතකරණ සමයේ මධ්‍ය කඳුකරයේ පමණක් අලින් 7000-8000 පමණ ඝාතනය කෙරුණු බව ප්‍රකාශ වේ. මෙයට පෙර ඇත්දළ හා ගජමුතු සඳහා අලින් ඝාතනය වූ අතර රජු හා ප්‍රභූන් අට්ටාල උඩ සිට වල් අලින් මෙල්ල කරන ආකාරය නැරඹීම විනෝදාංශයක් පමණක් විය. ඒ සඳහා වූ අලිගාල් අට්ටාල පිළිබඳ තොරතුරු පුරාණ මූලාශ්‍රවල සඳහන්ය. බ්‍රිතාන්‍ය පාලන සමයේ වතුවගාව හේතුවෙන් ශ්‍රී ලංකාවේ පැවති වනාන්තරවලින් 50%-60% පමණ අඩුවිය. මේ හේතුවෙන් අලි ගහනය සීඝ්‍රයෙන් අඩුවන්නට විය.

නාමික නිදහසින් පසුද පරිසරය වනාන්තර පිළිබඳව කිසිදු තැකීමක් නොකර විවිධ වූ සංවර්ධන ක්‍රියාමාර්ග සිදුකෙරෙමින් තිබේ. ජලාශ ඉදිකිරීම, මිනිසුන් නැවත පදිංචි කිරීම, ඉඩම් අස්වැද්දීම, බහුජාතික සමාගම්වලට අක්කර දහස් ගණනින් බදුදීම සිදු කරනුයේ වනාන්තරවලිනි. වනාන්තර එළිපෙහෙලි කළ නායකයන්ම වනාන්තර මෙපමණකින් අඩු වී ඇතැයි පවසති. කෙසේ වෙතත් අද වන විට පවතින කැලෑවලින් එක් අලියකුට ජීවත්වීමට අවශ්‍ය අවශ්‍යතා සපුර ගැනීමට ඇති ඉඩම් ප්‍රමාණය ඉතා අවමය. මෙය ලෝකයේ අලියකු සඳහා ඇති අවම වන ඝනත්වයයි.

මෙවැනි අක්‍රමවත් පරිසර හතුරු සංවර්ධන ව්‍යාපෘතිවල ක්‍රියාදාමයන්ගේ ප්‍රතිඵල හේතුවෙන් අලි ඇතුන් කුඩා වනබිම් කොටස්වලට සීමාවිය. ඒවායේ ඔවුනට අවශ්‍ය සම්පත් සීමාවිය. ඔවුනට අවශ්‍ය ආහාර, ජලය, ලවණ ඔවුන් ජීවත් වන වට පිටාවට වඩා බාහිරව ඇති බව අලින්ට සන්නිවේදනය වේ. (අලින්ගේ ආහාර පිළිබඳ ඉව කිලෝමීටර කිහිපයක් ඈතට දැනේ) විශේෂයෙන් ආහාර හා පානීය ජල අවශ්‍යතා සඳහා ගම්වදින අලි වනයේදී මෙන් නොව ගම්වල පවතින කලබලකාරී ස්වරූපය (විවිධ වූ චලනයන්) තමන්ට තර්ජනාත්මක පරිසරයක් ලෙස හඳුනාගනිති. මේ හේතුවෙන් දැඩි විමසිල්ලෙන් සිටින අලි වනයෙන් එපිට සිදුවන සෑම ස්වභාවික නොවන චලනයකටම පහර දීමට පෙළඹෙති. මෙම හේතුවෙන් වසරකට දළ වශයෙන් 75-100ක පමණ මිනිස් ජීවිත ප්‍රමාණයක් අහිමි වේ.

තම වගාවේ ධාන්‍ය, එළවළු ආදී අස්වැන්න ගොවියාට පෙනෙනුයේ මුදල් ලෙසය. තම අස්වැන්නට හානි පමුණුවන සියලු දෑ කෙරෙහි ගොවීන් තුළ වෛරයක් උපදවා ඇත. වෙඩි තැබීම්, ගිනි විසිකිරීම්, විදුලි වයර, ඇණ ලෑලි, හක්ක පටාස්, වස දැමූ ආහාර, මර උගුල් ආදී නොයෙක් ක්‍රමවේදයන් භාවිත කොට අලින් ඝාතනය කර තම අස්වනු බේරා ගැනීමට ඔවුහු උත්සාහ කරති. ප්‍රතිඵලය වනුයේ වසරකට අලි 225-300ක ප්‍රමාණයක් මිය යාමයි.

අක්‍රමවත් සංවර්ධනය, ඉඩම් පිළිබඳව විසඳුම් නොමැතිවීම හේතුවෙන් අවශ්‍යතා සඳහා ප්‍රමාණවත් වනයක් අලින්ට අහිමි කරනු ලැබ ඇත. මේ අනුව අලින්ට වනයෙන් එළියට පැමිණීමට ආරාධනා කොට ඇත. යටත්විජිතවාදීන්ටත්, අනතුරුව මාරුවෙන් මාරුවට ආණ්ඩු කළ එක්සත් ජාතික පක්ෂ, ශ්‍රී ලංකා නිදහස් පක්ෂ ආණ්ඩුවලටත් මෙම ගැටලුව සඳහා විසඳුම් තිබුණේ නැත. 16වැනි සියවස දක්වා මිනිසුන් හා අලින් අතර පැවති සහජීවනය, ධනවාදය තුළ වෛරක්කාරයන් බවට පරිවර්තනය කරවීමට සමත්ව ඇත. කෑදර ධනවාදය ඇත්දළ, ගජමුතු අත්පත් කරගත යුතු වාසනාවන්ත දේවල් ලෙස මිනිස් සිත් සතන් තුළට කිඳා බස්සවා ඇත. එයම ඇතුන්ගේ අවාසනාව බවට පත් වී ඇත. සියඹලංගමුව, ගල්ග මුව, හක්වටුනාව, කහල්ල, ආදී ඇතුන් ගහනය වැඩි ප්‍රදේශවල ඇතුන්ගේ ජීවිතය තිරණය වන්නේ මිනිසුන්ගේ මිත්‍යා 'වාසනාව' මතය. මෙම සියලු දෑ ධනවාදයේ නිර්මාණයන්ය.

අලි මිනිස් ගැටුම අවම කිරීම සඳහා දියුණු සංවර්ධන ක්‍රියාදාමයන් සහිත පරිසර ප්‍රතිපත්තියක් ධනවාදය සතුව නොමැත. අලි මිනිස් ගැටුමට ඔවුන්ගේ එකම විසඳුම අලින් වෙසෙන වන රොදවල් වටා විදුලි වැටවල් නිර්මාණය කිරීමය. අලි ඇතුන් රංචු සීමිත භූමි ප්‍රමාණයකට සීමා වීම තුළ ලේ ඥාතීත්වයක් සහිත පැටවුන් බිහිවීම, එකම වර්ගයේ ජාන මිශ්‍රවීම තුළ ඇතිවන දුබලතා හේතුවෙන් අලින් ශ්‍රී ලංකාවෙන් තුරන්වී යාම වළක්වාගත නොහැක. එසේ වඳවීම ධනවාදයේ නිර්මාණයක් වූ අලි මිනිස් ගැටුමට වඩා බරපතළය. ඔවුනට එය වැළැක්වීම සඳහා අවශ්‍ය ප්‍රතිපත්තිමය වැඩපිළිවෙළක් නොමැත.

ධනවාදයේ නිර්මාණණක් වූ අලි මිනිස් ගැටුම හා අනෙකුත් පාරිසරික ගැටලු අවම කර සියලු මානවයන්ට, සියලු ජීවීන්ටද සහයෝගයෙන් එක්ව ජීවත්විය හැකි පරිසර සතුරු සංවර්ධනයක් වෙනුවට මිතුරු සංවර්ධනයක් ස්ථාපිත කිරීම සඳහා වූ වැඩපිළිවෙළක පහත දැක්වෙන මූලික කරුණු අඩංගු විය යුතුව තිබේ.

* ගැසට් කර ඇති රක්ෂිත භූමිවල අවදානමකට ලක්ව ඇති ප්‍රදේශ නැවත අන්තර් ග්‍රහණය කිරීම, අප පරිසරයට උචිත කාර්මික, නාගරික, ජනාවාස, කඳුකර ප්‍රදේශවල පැවතිය යුතු වන ගහනය පවත්වාගෙන යාම

* වන ජීවී හා සංරක්ෂණ කලාප ඒකාබද්ධ කළ හැකි ස්ථාන හඳුනා ගැනීම හා ඒකාබද්ධ කිරීමත් වන සතුන් සඳහා යෝග්‍ය වන ආකාරයට වනාන්තර ගුණාත්මක වර්ධනය කිරීමත් සත්ව කොටස් පිළිබඳ මිනිසුන් තුළ ඇති මිත්‍යා මත බැහැර කිරීමට කටයුතු කිරීම. වනාන්තර තුළ අලින් වඩාත් ප්‍රියකරන තෘණ සහිත භූමි නිර්මාණය කිරීම

* අලි සංචරණය අධ්‍යයනය කොට විදුලි වැටවල් නිර්මාණය කිරීම හා තාක්ෂණික ක්‍රමවේදයන් හා ජීව විද්‍යාත්මක ක්‍රම මගින් අලි - මිනිස් ගැටුම් පාලනය කිරීම

මානව ක්‍රියාකාරිත්වය හේතුවෙන් පරිසරයේ ඇති සත්ව හෝ ශාක වඳවී යයි නම් එය අනුමත කළ නොහැකිය. විශේෂයෙන් ගොඩබිම ජීවත් වන විශාලතම සත්වයා ශ්‍රී ලංකාවෙන් තුරන් වී යාමට ඉඩදිය නොහැක. ඒ සඳහා වූ වැඩපිළිවෙළක් වන අලින්ගේ චර්යා රටාව විද්‍යාත්මකව අධ්‍යයනය කර ක්‍රියාත්මක කළ යුතුය.

> අලි මිනිස් ගැටුම අවම කිරීම සඳහා දියුණු සංවර්ධන ක්‍රියාදාමයන් සහිත පරිසර ප්‍රතිපත්තියක් ධනවාදය සතුව නොමැත. අලි මිනිස් ගැටුමට ඔවුන්ගේ එකම විසඳුම අලින් වෙසෙන වන රොදවල් වටා විදුලි වැටවල් නිර්මාණය කිරීමය. අලි ඇතුන් රංචු සීමිත භූමි ප්‍රමාණයකට සීමා වීම තුළ ලේ ඥාතීත්වයක් සහිත පැටවුන් බිහිවීම, එකම වර්ගයේ ජාන මිශ්‍රවීම තුළ ඇතිවන දුබලතා හේතුවෙන් අලින් ශ්‍රී ලංකාවෙන් තුරන්වී යාම වළක්වාගත නොහැක. එසේ වඳවීම ධනවාදයේ නිර්මාණයක් වූ අලි මිනිස් ගැටුමට වඩා බරපතළය.

ජනතා විමුක්ති පෙරමුණේ මහජන නියෝජිතයින් විසින් පළ කළ අදහස් වෙනුවෙන් නියමුවා වේදිකාව වෙන්වෙයි.

2019 අප්‍රේල් 01

# කෘත්‍රිම වැසි ඇති කරන්න ගියේ කාලගුණ විද්‍යා දෙපාර්තමේන්තුව අමතක කරලද?

(2019 අයවැය විවාදයට සහභාගි වෙමින්)

## පාර්ලිමේන්තු මන්ත්‍රී වෛද්‍ය නලින්ද ජයතිස්ස සහෝදරයා

2006 - 2010 කාලයේ කළුතර දිස්ත්‍රික්කයෙන් තමයි ආපදා කළමනාකරණ අමාත්‍යවරයා පත් වෙලා හිටියේ. එතුමා අගලවත්ත ආසනය භාරව තමයි හිටියේ. මහින්ද සමරසිංහ මන්ත්‍රීතුමා, ඒ කාලයේ KOICA ආධාර යටතේ ආපදා කළමනාකරණ අමාත්‍යාංශය මැදිහත් වෙලා අගලවත්ත නගරයේ ශ්‍රවණාගාරයක් ඉදි කළා. අවුරුදු හයක් ගත වනකොට ආපදා කළමනාකරණ අමාත්‍යාංශයෙන් හදපු ගොඩනැගිල්ල ආපදාවට ලක් වුණා. දැන් ඒකේ beams කඩාගෙන වැටිලා. බිත්ති ඉරි තැළිලා, කඩාගෙන වැටෙන්න ඔන්න මෙන්න කියා තමයි තිබෙන්නේ. දැන් නිර්දේශ කර තිබෙනවා, ගොඩනැගිල්ල අයින් කරන්න කියා. ගොඩනැගිල්ල අයින් කරන්න මම දන්න විධියට ලක්ෂ 20 - 25ක් විතර යනවා. මේ ව්‍යාපෘතිය සඳහා මම දන්න හැටියට ලක්ෂ 900ක් විතර වියදම් කර තිබෙනවා. ඒ රජයේ මුදල් හා විදේශාධාර. ඒ නිසා මම ඔබතුමාගෙන් පළමුවෙන්ම ඉල්ලන්න කැමැතියි, ආපදා කළමනාකරණ අමාත්‍යාංශය හදපු ඒ building එක පිළිබඳව කරුණාකර හොයලා බලන්න. හොයලා බලලා වාර්තාවක් ඉදිරිපත් කරන්න.

දැන් රටේ විදුලිය කපනවා. විදුලිබල ඇමතිතුමාත් මේක කවදාවත් අහලා නැති, අද ඊයේ ඇති වුණු පැවිල්ලක් වාගේ බොහොම විස්මයෙන් තමයි කථා කරන්නේ. මම දැන ගන්න කැමැතියි, කාලගුණ විද්‍යා දෙපාර්තමේන්තුවට කියන්න පුළුවන්කම තිබෙන්නේ අද හවස වහින ඒවා විතරද කියා. ඔවුන්ට අඩු ගානේ අනාවැකියක් කියන්න බැරිද? මොකද, දැන් වර්ෂාපතනය නැති වනකොට මාවුස්සාකැලේ ආශ්‍රිත ඉහළ අහසේ අපි දැක්කා, හෙලිකොප්ටර් යොදාගෙන විශාල වියදමක් දරලා, කෘත්‍රිම වර්ෂා ඇති කරන්නට යම් වැඩපිළිවෙළක් දියත් කරන බව. මෙහෙම ක්‍රියාවලියක් වනකොට කාලගුණ විද්‍යා දෙපාර්තමේන්තුවෙන් ඒ සඳහා විශේෂඥ සහාය ලබා ගන්නට ඕනෑ. කෘත්‍රිම වැසි ඇති කිරීම සඳහා යම් සාකච්ඡාවක් තිබුණා නම් කාලගුණ විද්‍යා දෙපාර්තමේන්තුවෙන් සහභාගි වුණ නිලධාරියා කවුද, අධ්‍යක්ෂ ජනරාල්වරයා සම්බන්ධ වුණාද?



එහෙම නැත්නම් ඊට වඩා බොහොම කනිෂ්ඨ කෙනෙක්ද සම්බන්ධ වුණේ? මම දන්න හැටියට හිටපු අධ්‍යක්ෂ ජනරාල්වරයා ප්‍රකාශයට පත් කර තිබෙනවා, "මෙහෙම කෘත්‍රිම වැසි ඇති කරන්න ගියත් ඇති කරන්න පුළුවන් උපරිම වර්ෂාපතනය මිලිමීටර් හතයි." කියා. කාලගුණ විද්‍යා දෙපාර්තමේන්තුවේ සිටින විෂය දැනුම සහිත අයගේ දැනුම පැත්තක දාලාද මේ ක්‍රියාවලිය සිද්ධ කළේ කියා මම දැන ගන්න කැමැතියි.

තුන්වන කාරණ මෙයයි, ඇමතිතුමනි, මම හිතනවා ඔබතුමා මේ වතාවේ උත්තර දෙයි කියා. මොකද, මේ පාර්ලිමේන්තුවේදිත් වාර කීපයක් අපි Doppler radar එක පිළිබඳ ප්‍රශ්නය මතු කළා. මිලියන 400ක් වියදම් කර මීට වසර ගණනාවකට කලින් ගෙනාපු Doppler radar යන්ත්‍රය දෙනියායේ ගොංගල කන්දේ හයි කරන්න ගිහිල්ලා වුණු අභාග්‍යය තමුන්නාසේ දන්නවා. ඒක crane ඒකෙන් අරගෙන යන්න ගිහිල්ලා පහළට පෙරළුණා. ඊට පස්සේ ඒකේ ක්‍රියාත්මක කරන්න පුළුවන් කොටස් ඇමෙරිකා එක්සත් ජනපදයට යැව්වා. දැන් මේ Doppler radar එකට මොකද වෙලා තිබෙන්නේ? ඒක නිෂ්පාදනය කරපු කොම්පැනිය භාර අරගෙන තිබෙනවාද, අපට ඒක අලුත්වැඩියා කර දෙන්නම් කියා. ඒ සඳහා කොපමණ කාලයක් යනවාද, කොපමණ වියදමක් යනවාද, අපට ඒකෙන් වැඩක් ගන්න පුළුවන් වෙයිද කියන කාරණා පිළිබඳව මම හිතනවා ඇමතිතමා පාර්ලිමේන්තුවට අදහසක් ඉදිරිපත් කරන්න ඕනෑ කියා.

**අපේ රට නිතර කාලගුණික ආපදාවන්ට ගොදුරුවන රටක් හැටියට වර්ගීකරණයට ලක් වෙලා තිබෙනවා. එම නිසා කාලගුණ විද්‍යා දෙපාර්තමේන්තුවේ තත්වය, එහි තාක්ෂණික කටයුතු මීට වඩා ඉහළ මට්ටමකට ගෙන එන්නට ඕනෑකම තිබෙනවා** කියා මම හිතනවා. මෙහි අධ්‍යක්ෂ ජනරාල්වරයා සහ අධ්‍යක්ෂවරු කිහිප දෙනෙක් තවමත් වැඩ බලන තත්වයෙන් තබා ගන්නට සිදු වී ඇත්තේ ඇයි? එහෙම වෙලා තිබෙන්නේ ඇයි? අපේ රටේ මේ තනතුරුවලට දක්ෂ අය සිටිනවා. අමාත්‍යතුමා මේ අය ස්ථිර කර ඒ අයට පහසුවෙන් වැඩ කටයුතු කරන්නට අවස්ථාව සලසා නොදෙන්නේ ඇයි කියන එක පිළිබඳව ආපදා කළමනාකරණ අමාත්‍යාංශය පැත්තෙන් අහන්න කැමැතියි.

මීළඟ කාරණය මම ගරු අධිකරණ ඇමතිතුමියගේ අවධානයට යොමු කරනවා. අපි අද කොකේන් කුඩු කිලෝ හත්සිය ගණනක් විතර විනාශ කළා. "Handbook of Drug Abuse Information 2018" ආරක්ෂක අමාත්‍යාංශය තමයි නිකුත් කර තිබෙන්නේ. ඒ සංඛ්‍යා ලේඛන අනුව ගත්තොත්, 2017 අවුරුද්දේ මත් ද්‍රව්‍යවලට සම්බන්ධ අසූඑක්දහස් එකසිය පනස්හයක් අත්අඩංගුවට ගෙන තිබෙනවා. එයින්, විසිදෙදහස් අටසිය තිස්තුනක් බන්ධනාගාර ගත වී තිබෙනවා. විෂ මත් ද්‍රව්‍ය සම්බන්ධ වැරදි නිසා අත් අඩංගුවට පත් ප්‍රමාණය 10,589යි. මට මතුකරන්න ඕනෑකම තිබෙන්නේ මේකයි. ඇමතිතුමියනි, 2017 අවුරුද්දේ මෙතරම් සංඛ්‍යාවක් අපි අත්අඩංගුවට අරගෙන බන්ධනාගාර ගත කළාට පුනරුත්ථාපනය කර තිබෙන්නේ 2706යි. එයින් බන්ධනාගාරය

> අපේ රට නිතර කාලගුණික ආපදාවන්ට ගොදුරුවන රටක් හැටියට වර්ගීකරණයට ලක් වෙලා තිබෙනවා. එම නිසා කාලගුණ විද්‍යා දෙපාර්තමේන්තුවේ තත්වය, එහි තාක්ෂණික කටයුතු මීට වඩා ඉහළ මට්ටමකට ගෙන එන්නට ඕනෑකම තිබෙනවා.

11 වැනි පිටුවට

2019 අප්‍රේල් 01

# ජ්‍යෙෂ්ඨ පුරවැසියන්ගේ ඡන්දයෙන් පත් වී ඔවුනට සලකන්නේ මෙහෙමද?

(2019 අයවැය විවාදයට එක්වෙමින්)

## පාර්ලිමේන්තු මන්ත්‍රී නිහාල් ගලප්පත්ති සහෝදරයා

ජනාධිපතිවරයා කිහිල්ලේ ෆයිල් ගහගෙන රට පාලනය කරන කෙනෙකු වුණා නම් ඇමතිතුමිය කොච්චර දැගලුවත් අපට මේ නීති ක්ෂේත්‍රය හදන්න බැහැ. අගමැතිතුමා එහෙම කෙනෙකු වුණා නම් නීති ක්ෂේත්‍රය හදන්න බැහැ.

අග්‍රහාර ජාතික රක්ෂණ භාර අරමුදල ගැන මම ඇමතිතුමාගේ අවධානයට යොමු කරනවා. 2016.01.01 වැනිදා සිට විශ්‍රාම ගිය රජයේ සේවකයින්ට, ජ්‍යෙෂ්ඨ පුරවැසියන්ට පමණයි මිය යනතුරුම මේ ප්‍රතිලාභ ලැබෙන්නේ. 2016ට පෙර විශ්‍රාම ගිය කිසිදු ජ්‍යෙෂ්ඨ පුරවැසියකුට මේ ප්‍රතිලාභ ලැබෙන්නේ නැහැයි කියන එක ඉතාම පැහැදිලියි.

විශ්‍රාමික සංගම් බොහොමයක්ම මේ සම්බන්ධයෙන් මැති ඇමතිවරුන්ට, ජනාධිපතිවරයාට, සහ අගමැතිතුමාට මේ දුක් ගැනවිල්ල කියා තිබෙනවා. මට ආරංචියක් තිබෙනවා, එහි ප්‍රතිඵලයක් විධියට මේකට Cabinet Paper එකක් ගිහිල්ලා තිබෙන නමුත්, ඒ Cabinet Paper එක ප්‍රතික්ෂේප කර තිබෙනවා කියලා. ඒක හරිම කනගාටුදායකයි. ජ්‍යෙෂ්ඨ පුරවැසියන්ගේ ඡන්දයෙන් බලයට පත් වෙලා ආණ්ඩුවේ තනතුරු දරන තමුන්නාන්සේලා අද ජ්‍යෙෂ්ඨ පුරවැසියන්ට සලකන්නේ මෙහෙමද කියන එක සම්බන්ධයෙන් ගැටලුවක් තිබෙනවා. මොකද, දේව සභාව එකතු වෙලා ඒ Cabinet Paper එක ප්‍රතික්ෂේප කිරීම ගැන මා නැවත කනගාටු වෙනවා. 2015 පිහිටුවා ගත් යහපාලන ආණ්ඩුවේ තමුන්නාන්සේලා අගමැතිතුමා, ජනාධිපතිතුමා ඇතුළු ඇමති මණ්ඩලය ඒ අයට සලකන්නේ මෙන්න මේ ආකාරයටයි කියන එක මම ඇමතිතුමාගේ අවධානයට යොමු කරනවා.

ඒ වාගේම මේ වසර දෙකහමාර තුළ රජයේ ගිණුම් පිළිබඳ කාරක සභාව සහ COPE එක රැස් වුණු හැම වෙලාවකදීම අපට දැන ගන්නට ලැබුණා, රජයේ සංස්ථා, ව්‍යවස්ථාපිත මණ්ඩල, අධිකාරිවල වාගේම දෙපාර්තමේන්තුවල විවිධ ක්ෂේත්‍රවල, විවිධ තලයේ පුරප්පාඩු දහස් ගණනක් තිබෙන බව. අපි ඒ ගැන ඔබතුමන්ලාගේ අවධානයට යොමු කළා. ඒ රැස් වුණු හැම අවස්ථාවකදීම මුදල් අමාත්‍යාංශයත් එම කාරක සභාවලට ඇවිල්ලා හිටියා. ඒ නිසා මෙන්න මේ පුරප්පාඩු පුරවන්න වහාම කටයුතු කරන්න කියලා අපි ඉල්ලනවා. රජයේ සේවය කාර්යක්ෂම කිරීමට නම් අනිවාර්යයෙන්ම මේ පුරප්පාඩු පිරවිය යුතුයි කියලා අපි විශ්වාස කරනවා. ඇමතිතුමනි, Arts, Commerce, Science degrees **තිබෙන අය පනස්හත්දහසක් විශ්වවිද්‍යාලවලින් පිට වෙලා සුසුම් හෙළමින් බලාගෙන ඉන්නවා. මේ ජාතියේ දූ දරුවන්ට කඳුළු ගෑස්, බැටන් පොලු ප්‍රහාර, ජල ප්‍රහාර දීලා, අත්අඩංගුවට අරගෙන ඔවුන්ගේ ඔළු කටු කුඩු කරලා ප්‍රශ්න විසඳන්න බැහැ.** අගමැතිතුමාගේ අර රැකියා ලක්ෂ 10 package එකෙන් අඩු ගණනේ රැකියා ලක්ෂයක්වත් දීලා ඉවර කරන්න කියලා මා ඔබතුමාට කියනවා.

තවත් වැදගත් කාරණයක් මම අවධානයට යොමු කරන්න කැමැතියි. එනම්, පළාත් පාලන ආයතනවල සහා ලේකම් ධුරවලට පත් කළ යුත්තේ අනිවාර්යයෙන්ම කළමනාකරණ සහකාර සේවයේ අධි ශ්‍රේණියේ -Supra Grade- අයයි. නමුත්, රටේ පළාත් පාලන ආයතන තුන්සිය ගණනක් තිබෙනවා. ඇමතිතුමනි, රටේම තිබෙන පළාත් පාලන ආයතන තුන්සිය ගණනින් කීයකට මෙන්න මේ මම කියන Supra Grade එකේ අය පත් කරලා තිබෙනවාද කියලා ඔබතුමා සොයා බලන්න. එහෙම පත් කරලා නැහැ. දේශපාලන හිතවත්කම් මත වැඩබලන පදනමින් පත් කරලා තිබෙනවා. ඒ නිසා සිදුවී තිබෙන නස්පැත්තිය මෙයයි. ප්‍රාදේශීය සභාවලින්, නගර සභාවලින්, මහ නගර සභාවලින් තමන්ගේ plan එකක් pass කර ගන්න, විවීරේඛා සටහනක් pass පාස් කර ගන්න, ඉඩම් ප්‍රශ්නයක් විසඳා ගන්න විවිධ ක්ෂේත්‍රවල



සිටින සේවකයින් තමන් ළඟට ආවාම, ඒ අය මේ බලතල පාවිච්චි කරලා වැඩ බලන ගමන්, දේශපාලන මතිමතාන්තර මත ඉඳගෙන ඒ ගොල්ලන්ගෙන් පළිගැනීම් කරනවා. ඒ සේවය හරියට කරන්නේ නැහැ. ඒ විතරක් නොවෙයි, මේ විධියට සේවය කරන සමහර වැඩබලන ලේකම්තුමන්ලා, වැඩබලන ලේකම්තුමියලා විශ්‍රාම ගියාට පසුව පළාතේ සිටින දේශපාලනඥයන්ගේ සහයෝගය මත නැවත වතාවක් සේවයේ යොදවා තිබෙනවා. මෙන්න මේ අකාර්යක්ෂම තත්වයෙන් සේවයේ යොදවපු නිසා මේ අයගෙන් පැහැදිලි සේවයක් රටේ ජනතාවට ඉෂ්ට වෙන්නේ නැහැ කියන එක මම අවධානයට යොමු කරනවා.

ඒ වාගේම තංගල්ල, අඟුණකොළපැලැස්ස බන්ධනාගාරය ගැන කරුණු කිහිපයක් අධිකරණ ඇමතිතුමියගේ අවධානයට ඉදිරිපත් කරන්න ඕනෑ. මෙම බන්ධනාගාරයට ඇතුළු වෙනකොටම ගහලා තිබෙනවා."සියලු සිරකරුවෝ මනුෂ්‍යයෝය" කියලා. කෝටි ගණනක් වියදම් කරලා පිහිනුම් තටාක, cricket ground එකක්, volleyball ground එකක් ආදී වශයෙන් සෑම ක්‍රීඩාවකටම අවශ්‍ය පහසුකම් ඇති කරලා, මහ දැවැන්ත උත්සවයක් පවත්වලා විවෘත කළා. ඒකට කමක් නැහැ. ප්‍රශ්නයක් නැහැ. මෙහි සිරකරුවන් 1,200ක් ඉන්නවා. රෝගීන් ඇතුළත් කරන වාට්ටු හයක් තිබෙනවා.

> Arts, Commerce, Science degrees තිබෙන අය පනස්හත්දහසක් විශ්වවිද්‍යාලවලින් පිට වෙලා සුසුම් හෙළමින් බලාගෙන ඉන්නවා. මේ ජාතියේ දූ දරුවන්ට කඳුළු ගෑස්, බැටන් පොලු ප්‍රහාර, ජල ප්‍රහාර දීලා, අත්අඩංගුවට අරගෙන ඔවුන්ගේ ඔළු කටු කුඩු කරලා ප්‍රශ්න විසඳන්න බැහැ.

11 වැනි පිටුවට

කවුළුව හැරී තබමි

# සැමරුමකින් ඔබ්බට යා යුතු සැමරුම



මේ උදාවූයේ 129වැනි කම්කරු දින සැමරුමයි. මුළු ලොව පුරා වෙසෙන සියලු ජාතීන්ට, ජනවර්ගවලට අයත් එමෙන්ම සියලු භාෂා, ආගම්, වාර්ගික සහ දේශපාලන මතවලට අයත් සමස්ත වැඩ කරන ජනතාව භේදයකින් තොරව සමරන එකම දිනය වන්නේ ජාත්‍යන්තර කම්කරු දිනයයි. කම්කරුවන් පමණක් නොව ශිෂ්‍යයන්, තරුණයන්, කාන්තාවන්, බුද්ධිමතුන් සංවිධානාත්මකව සමරනු ලබන එකම දිනය වන්නේද මැයි දිනයයි.

ධනපති පාලනයට එරෙහිව දියත් කළ සටනක් තුළින් බිහි වූ ජාත්‍යන්තර කම්කරු දිනය සැමරීමට අද වන විට ධනපති පංතියේ දේශපාලන පක්ෂ පවා පෙළඹී තිබීම ඉතිහාසයේ සරදමකි.

ජාත්‍යන්තර කම්කරු ව්‍යාපාරයේ දෙවැනි ජාත්‍යන්තරයේ පළමු සමුළුව 1889 දී පැරිස් නුවර මුළු දුන් අවස්ථාවේදී සමුළු න්‍යාය පත්‍රයේ මුල්ම කරුණ වූයේ, 1886 මැයිවල චිකාගෝහි පැවැති කම්කරු අරගලය වෙනුවෙන්, 1890 මැයි 01 දා සිට ජාත්‍යන්තර කම්කරු දිනය වශයෙන් සැමරීමේ යෝජනාව සම්මත කර ගැනීමය.

අද ජාත්‍යන්තර කම්කරු දිනය සමරනු ලබන්නේ, ජාත්‍යන්තර කොමියුනිස්ට් ව්‍යාපාරය, වමේ ව්‍යාපාරය අතිශය පසුබෑමකට ලක් වී ඇති අවස්ථාවකය. එනිසා මෙවර මැයි දිනය ඒ පිළිබඳව මූලිකව අවධානය යොමු කොට නැවත ශක්තිමත් ජාත්‍යන්තර ව්‍යාපාරයක් ගොඩනැගීම සඳහා වන අරගලයට මුලපිරීමක් තැබීම මැයි දිනය සමරන සියලු ව්‍යාපාරවල මූලික වගකීම බව අවධාරණය කළ යුතුව ඇත.

නව ලෝක තත්වයට ගැලපෙන, නව වමේ ව්‍යාපාරයක් ගැන අද ලෝකයේ තැනින් තැන කතාබහට ලක්වෙමින් තිබේ. එය කතාවකට පමණක් නොව ප්‍රායෝගික අභ්‍යාසයක් බවට පත් කිරීම අද සෑම වාමාංශික ව්‍යාපාරයකම ප්‍රමුඛ යුගයේ කටයුත්ත විය යුතු බව මෙවර මැයි දිනයේ දී දැඩිව අවධාරණය කළ යුතුව ඇත.

# බෝම්බ සහ රෝස





රට පුරා බෝම්බ පුපුරයි. ඉන් අහිංසකයෝ සිය ගණනක් මිය යති; ජනයා වැලපෙති; බියෙන් ත්‍රස්ත වෙති. මොහොතින් මොහොත ජීවිත අවදානම වැඩි වෙයි. මේ සියල්ල අතර පාලකයෝ රෝස මල් කතා කියති.

"මගේ තාත්තා බෝම්බ කතාව කලින්ම කීව නිසා මම බේරුණා." එක ඇමතිවරයෙක් කියයි.

"ගහන බව දැනගෙන හිටියත් මේ තරම් දරුණු ගැහිල්ලක් ගහයි කියලා හිතුවේ නැහැ" ආරක්ෂක ලේකම් කියයි.

මේ අපේ රටේ පාලකයන්ගේ හැටිය. දැන් රට කරවන්නේ එතරම්ම ළමා ලපටියන්දැයි සිතෙන තරමට මුළු රටම සමච්චලයට හැල්ලුවට ලක් කරමින් අපේ රටේ පාලකයෝ කටයුතු කරමින් සිටිති. සිංහල, දෙමළ හෝ මුස්ලිම් හෝ වේවා මේ ම්ලේච්ඡත්වයෙන් හා පාලකයින්ගේ අමන මැටි මෝල් වැඩවලින් විපතට පත් වන්නේ මෙරට අහිංසක ජනතාවයි. රට කරවන මහ උන්ගේ සිට උන්ගේ යටිපතුල් ලෙවකන පහළම දේශපාලුවා දක්වා නටන කෝලම්වලින් දැන් මුළු රටම අනතුරේ හෙළා හමාරය. ඔවුන්ගේ එකම කාරිය වී ඇත්තේ එකිනෙකා පිට වරද පටවා තම ජාම බේරා ගැනීමය. රටේ ජනයාගේ ජීවිතවලට වගකිව යුත්තෙක් නැත.

අපේ රටේ පාලකයන්ට අනුව රාජ්‍ය පාලනය යනු හවුලේ රට කොල්ලකෑමය. රටේ ජනයාට හෙන හතම ගැහුවත් ඔවුන්ට කම් නැත. මෙහෙව් පාලනයක්, මෙහෙව් පාලකයන් තවදුරටත් ඉවසා වදාරාගෙන සිටීමට තරම් රටේ ජනයා වැටී සිටින තත්වය ගැන අපට ඇති වන්නේ අතිශය කණගාටුවකි; කම්පාවකි. මේ නරුම පාලකයන්ට ජනතාවට තවදුරටත් අත්කර දිය හැක්කේ විනාශයෙන් විනාශයම හැර අන් යමක් නොවන බව තවදුරටත් කුමන සාක්ෂිද?

# මිය නොයන උපත




1965 මැයි 14 මෙරට වමේ ව්‍යාපාරය උඩු යටිකුරු කළ වර්ෂයකි. ඒ සාම්ප්‍රදායික වමට ප්‍රබලම අභියෝගය එල්ල කළ වසරයි. එනම් ජනතා විමුක්ති පෙරමුණ බිහිවූ වසරයි. මේ මැයි 14 වන දිනට යෙදෙන්නේ එම, සංවිධානාත්මක හා ශක්තිමත්ම ලාංකේය වමේ ව්‍යාපාරයේ 54වැනි වසරයි. 1943 ජූලි 14වැනි දින තංගල්ලේ උපත ලද රෝහණ විජේවීරයන් යන්තම් වයස 22වැනි විට ගොඩනැගූ යෝධ ව්‍යාපාරය උපන් දිනයයි.

පක්ෂය අරඹා කෙටි කලකින්ම දේශනයක් කරමින් විජේවීරයන් පක්ෂයේ අරමුණ පිළිබඳව කදිම විවරණයක් යෙදුනේය.

"අපට ලංකාව රුසියාවක් කරන්න ඕනෙද? බැහැ. චීනයක් කරන්න ඕනෙද? නෑ. වියට්නාමයක් කරන්න ඕනෙද? නැහැ. කියුබාවක් කරන්න ඕනෙද? නැහැ. අපට ඕන ලංකාව සමාජවාදී රටක් කරන්නයි. ඒ කරන්නේ කෙසේද යන්න පිළිබඳව නව අභ්‍යාසයක ඒ දෙන්නටයි."

මෙම නොසැලෙන, තියුණු ඉදිරි දැක්මෙන් යුතුව ව්‍යාපාරය මෙහෙයවූ විජේවීරයන් ඇතුළු සගයින්ට සහ ඔවුන්ගේ පසු පරම්පරාවේ සගයින්ටද මේ වන තුරුත් එය යථාර්ථයක් කරගත නොහැකි වූ බව සැබෑය. එහෙත් පක්ෂය ආරම්භයේදීම විජේවීරයන් තුළ තිබූ අනාගත දැක්ම අදටත් වලංගුය. එය මේ පොළොව මත විකසිත කිරීමට අප තවමත් අසමත් වූයේ මන්ද යන්න ගැඹුරින් අධ්‍යයනය කළ යුත්තකි.

සතුරා විසින් පක්ෂයට සකලවිධ විනාශයන් අත්කර දුන්නත් වසර 54ක් පුරා මේ පක්ෂය නොනැසී පැවතීමට එක්තරා අන්දමක විශ්මයකි. එහෙත්, කළ යුත්තේ විශ්මයෙන් උද්දාමවීම නොව අප වෙනුවෙන් රට වෙනුවෙන් දිවිදුන් අපේ මුල් සටන් ගුරුවරුන්ගේ මාවත තව තවත් එළි පෙහෙළි කරගනිමින් ඉදිරියට යාමය.

# පොලිටිකල් පංතිය

පොලිටික්ක පහුගිය දවසක ඇඹූ කඳුළින් පංතියට ආවා. අතේ ගුලිකරගත්ත ලේන්සුවකින් නහය උඩට තල්ලු කරන්න පුළුවන්ද කියල බලනව. මූණ මළගෙවල් සීයකට විතර ගියා වගේ.

"ගුඩ් මොනිං සර්" වසන්තිය පුරුද්දට වගේ කිවුව.

"වෙරි ගුඩ් මොනිං සර්" අනුරුද්දිය විශේෂණයක් එකතු කළා සෙකන්ඩ් නොවෙන්න.

"මොන මළ දානයක්ද? මෙච්චර දෙයක් වෙලා තියෙද්දි ළමයිනේ කොහොමද ගුඩ් මෝනිං - සුබ උදෑසනක් - කියන්නෙ" පොලිටික්ක හරහට කියද්දි වසන්තියගෙයි අනුරුද්දියගෙයි මූණු ඇකිළුණා. "නෑ... නෑ... මං කිවුවෙ ළමයිනේ මේ වෙන දේවල්වල හැටියට අපිට සුබපතා ගන්න පුළුවන්ද?" පස්සෙ පොලිටික්කට සැර වැඩි වගේ කියල හිතුණා.

"එහෙම බැලුවොත් සර් අපිට ඉංග්‍රීසි සුබ පතා ගැනීම් කියන්න වෙන්නෙම නෑ. යන තත්වෙ හැටියට ආයුබෝවන් කියන එක විතරයි අදාළ වෙන්නෙ." සමන විග්‍රහයකට මුල පිරුව.

"වැරදියට ගන්න එපා සමන්... මම මේ විශේෂ තත්වයක් නිසා එහෙම අදහසක් කිවුවෙ." පොලිටික්ක වෙච්ච වැරැද්දක් හදන්න හදනව.

"නෑ සර්.. විශේෂ තත්වයක් නෙමෙයි; සාමාන්‍ය තත්වයක්. අවුරුදු හැත්තෑ එකක් අපිට වෙච්චි හොඳක් නැති වුණත් අපි ජනවාරි පළවෙනිදට හැපි නිව් ඉයර් කියාගත්ත. මස්ත බාල්දු හැම දවසකමගුඩ් මෝනිං, ගුඩ් ආෆ්ටර් නූන්, ගුඩ් ඊව්නිං කිවුව. කොටින්ම නපුරු හීන දකින්න වෙනව කියල දැන දැනම ගුඩ් නයිට් කිවුව. හැබැයි එහෙම කිවුව කියල වෙච්ච සුගතියක් නෑ. පාලකයො රට ගෙනත් තියෙන තැන කොයි තරම් දරුණුද කිවුවොත් පාරට බැස්සොත් අනතුරක්. පල්ලියට ගියොත් මරණයක්... මරණය අතින් අරන් එහෙ මෙහෙ යන්න සිද්ධ වෙලා තියෙන මිනිස්සුන්ට එකිනෙකට කියා ගන්න තියෙන්නෙ ආයුබෝවන් - ආයුෂ බොහෝ වේවා - කියන එක විතරයි" තමන්ට වෙච්ච 'වැරැද්ද' සමන මේ තරම් දුරක් ගෙනියයි කියල පොලික්ක හිතුවෙ නෑ.

"හරි සමන් ඔයා කිවුවෙ තිබුණ, තියෙන තත්වෙ කියල හිතමුකො. අපි සුභ අනාගතයක් බලාපොරොත්තු වෙන්න ඕනැනෙ. දැන් බලන්න ගෝඨාභය මහත්තය ඡන්දෙ ඉල්ලන්නනෙ යන්නෙ" පොලිටික්ක බැරිම තැන මුට්ටිය දැම්ම.

"මමත් දැක්ක බෝම්බ රස්නෙ යන්නත් කලින් ගෝඨා මහත්තය ඡන්දෙ ඉල්ලනව කියල කියනව" මංජුව කිවුවෙ පොලිටික්කට සපෝට් එකට වගේ.

"මොකද්ද මංජු බෝම්බ රස්නෙ කතාව. ගෝඨාභය මහත්තය කොහොමත් ඡන්දෙ ඉල්ලන්න නේද හිටියෙ." පොලිටික්කට මංජුව දාපු විශේෂනේ දිරෙව්වෙ නෑ.

"නෑ මං කිවුවෙ සර්... ඡන්ද ඉල්ලන බව මේ වෙලාවෙම ටක්කෙටම කියන්නෙ, හොද්ද බොර වෙලා තියෙන නිසානෙ" මංජුව ඌණ පූර්ණය කළා.

"එහෙම කියන එක වැරදියි ළමයිනේ. දැන් මිනිස්සු බය වෙලා ඉන්නෙ. ඒ මිනිස්සු බයක් සැකක් නැතුව ඉන්න කැමතියි. එයාලා අනාගතේවත් සුබ වෙයි කියල බලන් ඉන්නව" පොලිටික්ක සුබ හීන මවනව.

"මහින්ද මහත්තයත් සුබ අනාගතයක් කියාගෙන ඇවිත් පවුලට සුබ අනාගතයක් හදා ගත්තනෙ. දැන් මල්ලි දියසෙන් කුමාරයට ඇඳල එන්නෙ. අපිව ඉස්ලාම් අන්තවාදීන්ගෙ බෝම්බවලට බය කරල දැන් බය නැති කරන්න මාව බලයට ගේන්න කියල අපිට කියනව. යුද්දෙ දරුණු වෙන තරමට තමයි ඒකාධිපතියෙක් මිනිස්සුන්ට ඕනෙ වෙන්නෙ කියල තමයි එයා හිතන් ඉන්නෙ. ඒත් එයා අයියගෙ බලේ අරන් ඇති කරපු බය මිනිස්සුන්ට අමතක වෙන්න බැහැ. දෙන්නෙක් කෝල් එකකින් කතා කරගන්න කලින් එයා ගැන හිතුව. රටේ වැරැද්දක් කියන්න ලියන්න කලින් එයාගෙ සුදු වෑන් ගැන හිතුව. අපි දන්න විදිහට දෙපැත්තෙම අන්තවාදී කල්ලි පිටිපස්සෙ හිටියෙත් එයාම තමයි. දැන් ප්‍රශ්නෙට විසඳුම විදිහට පේන්න හැදුවට එයලම තමයි ප්‍රශ්නෙ" සමනගෙ විග්‍රහය අහන් ඉන්න බැරුව පොලිටික්ක කැන්ටිමට දිරා මාරු වුණේ හොටු ලේන්සුවත් මේසෙ උඩ දාල.

## අන්තවාදය පරාජය...

01 පිටුවෙන්



නැති සටන්කාමිත්වයක් නැති මැයි දින සැමරුමක් වෙනුවට විනය, සටන්කාමීත්වය සහ දේශපාලන දැක්මක් සහිත මැයි දින පෙළපාළියක් සහ රැලියක් පවත්වමින් ජාත්‍යන්තර කම්කරු දිනයට අලුත් අර්ථකතනයක් ලබාදුන්නේ ජනතා විමුක්ති පෙරමුණයි. පසුගිය 21වැනිදා සිදුවුණ අවාසනාවන්ත සිදුවීම නිසා මෙවර මැයි දිනය සැමරීමට මැයි දින පෙළපාළියක් හෝ රැලියක් පවත්වන්න නොහැකි වෙලා තිබෙනවා. සමහරු කියන්න පුළුවන් ජනතා විමුක්ති පෙරමුණත් පාලකයින්ගේ වුවමනාවට මැයි දින සැමරුම් නවත්වලා දැම්මා කියලා. අපි වගකීමෙන් කියනවා ධනපති පංතියට වුවමනා විදියට හෝ ආණ්ඩුවට ඕනෑ විදියට අපි දේශපාලන තීන්දු තීරණ ගන්නේ නැහැ කියලා. මේ වෙලාවේ වගකිව යුතු දේශපාලන ව්‍යාපාරයක් ලෙස අපි, ජනතාව කම්පනයට පත්ව සිටින මේ මොහොතේ ඒ වගේම ආණ්ඩුව අන්තවාදීන්ගේ ක්‍රියා සම්පූර්ණයෙන්ම මර්දනය කරන්න අසමත් වෙලා තිබෙන මොහොතක ජනතාව කොළඹට කැඳවලා ඔවුන් අනාරක්ෂිත තත්වයකට පත්කරන්නේ නැහැ. එසේ වුවත් ජාත්‍යන්තර කම්කරු දින සැමරුම මඟහැර නොයා වැඩකරන ජනතාවගේ පක්ෂය ලෙස අපි අපේ පණිවිඩය වැඩකරන ජනතාවට ලබාදෙන්න මෙවැනි සැමරුමක් පක්ෂයේ ප්‍රධාන කාර්යාලයේදී සංවිධානය කළා.

එක්දහස් නවසිය හැටේ හැත්තෑවේ දශකයේ සමාජවාදී බලය තිබුණ කාලේ රටවල්වල අන්තවාදයක් තිබුණේ නැහැ. ආගම් තිබුණා. නමුත් ආගමික අන්තවාදයක් ඇතිවෙන්න සමාජවාදී රටවල් ඉඩ දුන්නේ නැහැ. සමාජවාදී රටවල් ඇතුළේ ජනතාවට මිත්‍යාව වෙනුවට විද්‍යාව ඉගැන්වුවා. මිත්‍යාව පස්සේ යන්න දුන්නේ නැහැ. ඒ විතරක් නෙවෙයි ජනතාවගේ අයිතිවාසිකම් තහවුරු කළා. ජනතාවට අයිතිවාසිකම් තිබුණා. ඒ නිසා ජනතාව දෙවියන් පස්සේ ගියේ නැහැ. සමාජවාදය බිඳ වැටීමෙන් පස්සේ ධනවාදය ඇතුළේ ජනතාවට තමන්ගේ අයිතිවාසිකම් නැහැ. ඒ ප්‍රශ්නවලට උත්තර හොයන්න ජනතාව දෙවියන් පස්සේ යනවා. ඒ විතරක් නෙවෙයි ධනවාදය ඇතුළේ විද්‍යාව වෙනුවට මිත්‍යාව වපුරනවා. මිනිස්සු ආගමික අන්තවාදයන්වලට ගොදුරු වෙනවා. මරාගෙන මැරෙන තත්වයට පත්වෙනවා. ධනවාදය, අධිරාජ්‍යවාදය ඇතුළේ ලෝකය එවැනි තත්වයකට පත්වෙලා. ඒ අස්වැන්න තමයි අද ලැබෙන්නේ. ඒ නිසා ධනවාදී සමාජ ක්‍රමය අවසන් කර නව සමාජවාදී සමාජයක් බිහිකිරීම වෙනුවෙන් වැඩකරන ජනතාව ඇතුළු සියලු දෙනා සටන් කරන්න ඕනෑ.

අද අපේ රටේ ජනතාවට රට ගොඩනගන ජාතික ව්‍යාපාරයක් අවශ්‍යයි. අපි දිගින් දිගටම කිවුවා ජනතාවට තමන්ගේ පාලනයක් ගොඩනගා ගැනීම වෙනුවෙන් ජාතික ව්‍යාපාරයක අවශ්‍යතාවයක් තිබෙනවා කියලා. අවුරුදු 500ක් පැරණි ධනවාදයට ජනතාවට මොකුත් දෙන්න බැරි වෙලා තිබෙනවා. අධිරාජ්‍යවාදයට වසර සියයකට වැඩියි. ජනතාවට දුන්නේ ලෙඩදුක්, කුසගින්න, යුද්ධය පමණයි. ඒ නිසා අද ජනතාවට මිත්‍යාව වෙනුවට විද්‍යාව, අයුක්තිය වෙනුවට යුක්තිය, අසාධාරණය වෙනුවට සමාජ සාධාරණය වගේම ප්‍රජාතන්ත්‍රවාදය අවශ්‍යයි. එවැනි සමාජයක් ගොඩනැගීමේ කාර්යභාරයේ මූලික වගකීම පැවරෙන්නේ අපේ රටේ වැඩකරන ජනතාවටයි. වැටුප් අරගලය වගේම මානව සමාජය ප්‍රගමනය කරා ගෙන යන සටනට මූලිකත්වය ලබාදිය යුතුයි. දැන් ධනවාදයේ, ධනවාදී පාලකයින්ගේ කාලය අවසන්. කල් ඉකුත්වූ මහත්වරුන්ට අලුත් ලේබල් අලවා ගෙනාවට රටට අලුත් ගමනක් යන්න බැහැ. මිනිසුන්ට මිනිසුන් වගේ ජීවත්වීමට හැකි පාලනයක් ගොඩනගන්න දේශපාලන ව්‍යාපාරයක් ගොඩනැගිය යුතුයි. ජාතික සමගිය තහවුරු වුන පංති සමගිය ආරක්ෂා වුන නව සමාජ ක්‍රමයක් වැඩකරන ජනතාවගේ පාලනයක් ගොඩනගා ගැනීම වෙනුවෙන් සියලු දෙනාට පෙරට එන්න කියලා ජනතා විමුක්ති පෙරමුණ ඉල්ලා සිටිනවා."

## මේ පරිච්ඡේදය...

16 පිටුවෙන්



**අර්බුදවලින් ගිනියම් වෙලා. ජාතිවාදයෙන් - ආගම්වාදයෙන් ගිනියම් වෙලා. ඒ ගිනියම් වුණු සමාජයේ ජනතාව නමැති කිනිහිරය උඩ තියලා තලල තලල ඔප මට්ටම් කරල, පන්නරය තියල හදපු ආයුධය තමයි ජනතා විමුක්ති පෙරමුණ කියන්නේ.** මේ අවිය අපි එදා සිට පාවිච්චි කරනවා. කාට එරෙහිවද? ජනතාවට එරෙහි වන්නන්ට එරෙහිව. ගොවි අරගලවලදි, වැඩකරන පන්තියේ ප්‍රශ්නවලදි, පාර්ලිමේන්තුවේදි මේ අවිය අපි පාවිච්චි කරනවා. ජනතා විමුක්ති පෙරමුණේ ශක්තිය, ධෛර්යය මර්දනය කරන්න එදා 71දි සිරිමාවෝගේ සමගි පෙරමුණ ආණ්ඩුව රටවල් 14කින් යුද ආධාර ලබාගත්තා. ඇමෙරිකාවෙන් හෙලිකොප්ටර් යානා දුන්නා, රුසියාවෙන් මිග් යානා දුන්නා, චීනෙන් යුද නාවුක යාත්‍රා 5ක් දුන්නා, ඉන්දියාවෙන්, පකිස්තානයෙන් බඩු ගෙනාවා. 71 පරම්පරාවෙ අධිෂ්ඨානය හොලවන්න, වීරත්වය හොලවන්න ධනපති පංතියේ පාලකයෝ හදාගෙන තිබුණු ආරක්ෂක බල ඇණිවලට බැරි වුණා. ලෝකෙ දැවැන්ත රාජ්‍යයන්වල ශක්තිය ගෙනල්ලයි අපේ සගයන්ව ගංගාවල පාකෙරෙව්වෙ. ගිනි තියල මැරුවෙ.

අපට නගල තිබුණු චෝදනා මොනවාද? මහා රාජිණියට එරෙහිව කුමන්ත්‍රණය කිරීම. ලංකා ආණ්ඩුව පෙරළීමට කුමන්ත්‍රණය කිරීම. මහා රැජිණට එරෙහිව යුද වැදීම. මහරැජිණට එරෙහිව යුද වැදීමට අනෙක් අය පෙළඹවීම. මේ තමයි චෝදනා හතර. අපේ රටට ඊනියා නිදහස ලබාගෙන අවුරුදු 71ක් වෙනව. ආසියාවේ මන්ද පෝෂණයෙන් පෙළෙන දෙවෙනි තැන හිමිවෙන්නේ ශ්‍රී ලංකාවට. අවුඃ 15ට අඩු දරුවන්ගෙන් 15%ක් රක්ත හීනතාවයෙන් පෙළෙනවා. වතුකරේ කම්කරු ජනතාව දවසක පඩිය 1000/ක් කරන ලෙස ඉල්ලනවා. රනිල් වික්‍රමසිංහ පාර්ලිමේන්තුවේද කිව්වා 43%ක් ලෝක දරිද්‍රතා රේඛාවෙන් පහළ ඉන්නෙ කියලා.

අධිරාජ්‍යවාදී පාලකයෝ නව ක්‍රමයකට යටත් කර ගන්නෙ. ණය දෙනවා. ගිවිසුම් ගහනවා. 71 වසරක් රට කරපු පාලකයෝ වංචාව, දූෂණය, ගණිකා වෘත්තිය, සූදුව, කුඩු, කර්මාන්ත දියුණු කරල තියෙනවා. මේ කර්මාන්තවලින් රටට බිහිකරන්නේ වෛර සහගත පරම්පරාවක්. නුවණක් නැති, හැඟීමක් නැති, ආත්මාර්ථකාමී තරුණ පරම්පරාවක්. මෙය අපි වෙනස් කරන්න ඕන. ඒකට ශක්තිය 71 විරුවන්ගෙන් උකහා ගන්න ඕන. පාලකයිනි, මේ පරිච්ඡේදය අපි අවසන් කරන්නේ සමාජවාදී සමාජයක් ස්ථාපිත කර බව අපි කියනවා."

## 21වැනි සියවසට...



ජනතාවගේ ප්‍රශ්නයක් නොවේ. ඒක මානවයාගේ පැවැත්ම පිළිබඳ ප්‍රශ්නයක්. සටන් තියෙන්නේ පන්ති සටන් පමණක් නොවෙයි. කාබන්ඩයොක්සයිඩ් 45%ක් පරිසරයට මුදාහැරීම වහාම අඩුකර ගත යුතුයි. එහෙම නොවුණහොත් ලෝකයේ දේශගුණික විපර්යාස රැසක්, කාලගුණික විපර්යාස රැසකට මුහුණ දෙන්නට සිදුවෙනවා. ඒ දේශගුණික විපර්යාස පළමුවෙන්ම ලෝකයේ රටවල් තුනකට බලපානවා. එකක් අපේ ලංකාව. එහෙම පවසා තිබෙද්දීත් දේශපාලන කියවීමක් අපේ රටේ තවම නැහැ. දැන් ලෝක ධනවාදය ශ්‍රම සූරාකෑමෙන් එහාට ගිහිල්ලා දැවැන්ත සූරාකෑමක් සිදුකරනවා. ඒ පරිසරය කොල්ලකෑම. ලාභය පස්සේ දුවන ධනේශ්වර ක්‍රමය විසින් විශාල ලෙස පරිසර කොල්ලකෑමක් කරනවා. මෙය මානවයාගේ ප්‍රශ්නයක්.

රුසියාවේ ලෙනින්ට සටන් පාඨ තුනක් තිබුණා. ගොවීන්ට ඉඩම්. හමුදාවට සාමය. ජනතාවට පාන්. ලාංකේය සමාජය සමාජවාදී විලිරුදාවක නැහැ. ජාතිකත්වයන් අතර විෂමතාවයන් තියෙනවා. අධිරාජ්‍යවාදය ක්‍රියාත්මක වෙනවා. ජාතිකත්වයන් අතර ඇති විෂමතාවයන් අධිරාජ්‍යවාදීන්ගේ මැදිහත්වීමට පාවිච්චි කර ගැනීමට ඉඩ තියන්නේ නැහැ. අපි ජාතීන් අතර විෂමතාවය අපි අහෝසි කරනවා. එය දේශපාලන ප්‍රශ්නයක්. දෙමළ ජාතික ප්‍රශ්නයට සන්නද්ධ විසඳුමක් දුන්නත් ඒ අයගේ ජාතික ප්‍රශ්නයට විසඳුමක් ලැබිල නැහැ.

ධනපති ක්‍රමයේ අර්බුද වැඩිවෙලා තිබෙනවා. වමේ ව්‍යාපාරවලට බලය ලබා ගැනීමට නොහැකි වෙලා තියෙනවා. සමාජවාදය අදටත් වලංගුයි. 21වැනි සියවසට නව වමේ ව්‍යාපාරයක් ඕනෙද? අපිට නව වමේ ව්‍යාපාරයක් අවශ්‍යයි. මේ මතුවෙන අනෙකුත් විමුක්ති අරගල වමේ ව්‍යාපාරයේ අරගල බවට පත්කරගත යුතුව තිබෙනවා. පරිසරය පිළිබඳ ප්‍රශ්නය, ස්ත්‍රීවාදය පිළිබඳ සටන අපේ ව්‍යාපාරයේ අරගලය බවට පත්කර ගත යුතුයි. කාල් මාක්ස් ප්‍රකාශ කළා 'මානුෂීය වූ කිසිවක් මට අරුචි නොවේ.' ලිංගික වෙනස්කම් මත කිසිවෙකුට අසමානව සලකන්නේ නැත. එංගල්ස්. අපිට ආර්ථික ප්‍රශ්නවලට මුහුණ දෙන්න සිදුවුණා. ඒ නිසා අනෙකුත් ප්‍රශ්න අපෙන් අත්හැරුණා. ඒ නිසා අනිකුත් ප්‍රශ්න මේ ක්‍රමය ඇතුළේ පැන නගින විමුක්ති සටන් අරගලවලට අත්නොහැර නායකත්වය දෙන්න ඕනෑ. අපි එහෙම අත්හැරල සිටි නිසා ඒ ප්‍රශ්නවලදි එන්ජීඕ කියන නඩය විමුක්ති අරගලවලට නායකත්වය දුන්නා. මේක අපි අපේ අතට උදුර ගන්න ඕනෑ. අද එයට නායකත්වය දෙන්න අපිට සිද්ධ වෙනවා.

ලිබරල් ප්‍රජාතන්ත්‍රවාදයයි, ආර්ථිකයේ සමානාත්මතාවයයි, නිෂ්පාදනවල සමාජ අයිතියයි එකට බද්ධ කරපු විමුක්ති අරගලයක් අවශ්‍යයි කියල නව කතිකාවක් තියනවා වමේ. විසිවැනි සියවසේ සමාජවාදය නොවෙයි. නව සමාජවාදය ඔස්සේ කතිකාවක් සාකච්ඡාවක් තිබෙනවා. **අපි සමාජවාදය අරමුණු කරගෙන වැඩකරන ව්‍යාපාරයක්. අද ලෝක තත්වයන්ගේ වෙනස්කම් තිබෙන නිසා ඒ පිළිබඳ අවබෝධයකින් තොරව විරුවන් සමරන්න බැහැ. එහෙම සමරනවා කියන්නේ ඒක ආමිස පූජාවක් පමණයි.** සමාජයේ ඇති අනෙකුත් විමුක්ති අරගල සමාජවාදය එනකම් හිටපන් කියලා කියන්න අයිතියක් නැහැ. එවැනි අරගල කරන අය ප්‍රතිගාමීන් කියලා හිතුවා. දැන් ඔය අරගලවල ප්‍රතිගාමීනුත් විමුක්තිකාමීනුත් ඉන්නවා. ඔය ප්‍රතිගාමී අරගල කරපු අය එම අරගල හේත්තු කළා එක්සත් ජාතික පක්ෂයට. නායකයා රනිල් වික්‍රමසිංහට. අද වෙන කොට ඒගොල්ලන්ගේ විමුක්ති නායකයා පිළිබඳ විශ්වාසය බිඳ වැටිල. ඒ අය පෙරළා වමේ ව්‍යාපාර වටා එකතුවෙමින් තියෙනවා. සමලිංගික ප්‍රශ්නය ආවා. අපි ඔව් කිවුවා. කායවිච්ඡේදන විද්‍යාව විසින් කරපු සොයා ගැනීම පදනම් කරගනිමින්. තර්ක විරහිත ලෙස අපිට ඔව් කියන්න වෙලා තියෙනවා. අරගලය එකයි. ක්‍රම වෙනස්.

සමාජවාදය හෙට කියලා හිතාගෙන කටයුතු කරන්න බැහැ. ටිකක් දුරයි. නව වැඩපිළිවෙළක් අපිට තියෙනවා. අත්‍යවශ්‍යම වෙලා තියෙනවා වමේ සහයෝගීතා පෙරමුණක්. ඒකට අපි දැන් ආරම්භයක් තියල තියෙනවා. සාකච්ඡා ගොඩාක් කරල තියෙනවා. එකඟ වුණු අය ගොඩක් ඉන්නවා. ලබන මාසේ අග විතර වෙනකොට අපිට හැකිවෙයි එය එළිදක්වන්න. වමේ සහයෝගීතා ව්‍යාපාරයේ ආරම්භය. එම ව්‍යාපාරය කිසිදු ධනපති පක්ෂයක් සමග ගනුදෙනුවක් කරන්නේ නැහැ. අපේ වමේ සහයෝගීතා පෙරමුණෙනුත් අපේක්ෂකයෙක් ඉදිරිපත් කරනවා. ඉදිරි මැතිවරණයේදි රටේ තුන්කොන් සටනක් ඇති වේවි. පාවෙන ඡන්ද එහාට මෙහාට වේවි. අපි ඒවා දිනා ගන්න උත්සාහ ගනිමු. ඉදිරියේදි අපේ අරමුණු ජයග්‍රහණය කිරීම උදෙසා කැපවීමෙන් වැඩකරමු."

## ධනවාදයේ අර්බුදය...

03 පිටුවෙන්



වන උමතු ආගමික අන්තවාදයනුත් වහාම පරාජය කළ යුතුය. ඒ වෙනුවෙන් සමාජ බලවේග පෙළගැස්විය යුතුය. එහෙත් ඒ අතරම සියලු මුස්ලිම් ජනයා මෙම ගොඩට නොදමීමටද ඔවුනට හිරිහැර කොට මෙම අන්තවාදී සංවිධානවලට පැවතීම සඳහා වන තර්කනයන් ගොඩනැගීමට හා මිනිස් බෝම්බ තව තවත් නිර්මාණය කිරීමට ඉඩ නොදිය යුතුය. උමතු අන්තවාදය පැරදවිය හැක්කේ ඒවා හැකි තරම් හුදකලා කිරීමෙනි. සියලුදෙනා කටයුතු කළ යුත්තේ ඒ අරමුණෙනි.

අනෙක් අතට ධනවාදයේ අර්බුදයත් එහි ප්‍රතිවිරෝධයත් තිබෙනතාක් හා අධිරාජ්‍යවාදීන් මෙවැනි සංවිධානවලට අවශ්‍ය වටපිටාව හැදීම නතර නොකරනතාක් මේවා අවසන් වශයෙන් පැරදවිය නොහැක. එබැවින් මෙම ම්ලේච්ඡ අන්තවාදයන්ට එරෙහිව කරන අරගලයත්, අධිරාජ්‍යවාදය හා ධනවාදයට එරෙහිව කරන අරගලයත් එකක් බවට පත් කළ යුතුය. මානව වර්ගයාට බයෙන් සැකෙන් තොරව, සහෝදරත්වයෙන් හා සමගියෙන් ජීවත් විය හැකි වන්නේ ධනවාදයත් අධිරාජ්‍යවාදයත් පරාජය කරනු ලැබූ සමාජවාදී සමාජයක වන නිසා, එවැනි සමාජයක් නිර්මාණය කිරීම සඳහා සියලු බලවේග පෙළගැස්වීම කළ යුතුය. නැතිනම් ම්ලේච්ඡත්වයේ ප්‍රහාර පිටුපස ප්‍රජාතන්ත්‍රවාදය අහිමිකරන ෆැසිස්ට්වාදී පාලනයක් පැමිණීම වැළැක්විය නොහැකි වනු ඇත. උමතු ආගමික අන්තවාදයේ ම්ලේච්ඡත්වය පැරදවීම කළ යුත්තේ ඒ වෙනුවට ඒකාධිපති ෆැසිස්ට් පන්නයේ පාලනයන් කැඳවා ගැනීමෙන් හෝ ජාතිවාදය, ආගමික අන්තවාදය පෝෂණය කිරීමෙන් නොවේ. අද ලොව පුරාම වමේ හා ප්‍රගතිශීලී ජනතාව ඉදිරිපිට ඇති අභියෝගය එයයි.

09 පිටුවෙන්

## කෘත්‍රිම වැසි ඇති කරන්න...



පුනරුත්ථාපනයට යොමු කර තිබෙන්නේ 295යි. මත් කුඩු විශාල වශයෙන් අත්අඩංගුවට ගන්නවාට සමගාමීව ඊටත් වඩා වේගයෙන් පුනරුත්ථාපන ක්‍රියාවලිය වේගවත් කළ යුතුයි. පුනරුත්ථාපනය කරන්නේ මෙතරම් කුඩා සංඛ්‍යාවක් නම් එහි බරපතළ ප්‍රශ්නයක් තිබෙනවා. මොකද මෙහි ආදීනව නැවතත් සමාජයීය ප්‍රශ්නයක් හැටි මතු වෙනවා. ඔබතුමියගේ අවධානය ඒ සම්බන්ධයෙන් යොමු කරනවා.

## ජ්‍යෙෂ්ඨ පුරවැසියන්ගේ...



ශල්‍යාගාරයක් තිබෙනවා. දන්ත ශල්‍යාගාර එකක් තිබෙනවා; laboratory එකක් තිබෙනවා. මෙම ආයතන තුනේ කිසිදු වෛද්‍ය උපකරණයක් හෝ භෞතික උපකරණයක් ඇත්තේම නැහැ. නිකම්ම නිකම් හිස් ගොඩනැගිලි විතරයි තිබෙන්නේ. ඒ වාගේම වෛද්‍යවරු දෙදෙනෙක් ඉන්නවා. නමුත් වෛද්‍යවරු හතරදෙනෙක් අවශ්‍ය වෙනවා. හෙද නිලධාරීන් දෙදෙනෙක් ඉන්නවා. තව දසදෙනෙක් ඇවශ්‍ය වෙනවා. ඖෂධ සංයෝජකවරුන් දෙදෙනෙක් ඉන්නවා. දන්ත වෛද්‍යවරු එක්කෙනෙක්වත් නැහැ. දන්ත වෛද්‍යවරු නැති නිසා දත් රෝගවලට අවශ්‍ය ප්‍රතිකාර ලබා ගන්න මේ සිරකරුවන් එක්කෝ තංගල්ල රෝහලට යන්න ඕනෑ. එහෙම නැත්නම් අඟුණකොළපැලැස්ස රෝහලට යන්න ඕනෑ. දැනට වෛද්‍යවරු විසින් හඳුනාගත් රෝගීන් 150ක් ඉන්නවා. මේ අය අද වනතුරු රෝහලකට ගෙන ගොස් නැහැ. අවශ්‍ය guard එක ආරක්ෂාව නැහැ කියලා.

සමාජයෙන් බැහැර වෙලා ඉන්න මේ අය සමාජගත කිරීම තමයි අපි කළ යුතු වන්නේ. නමුත් මෙහි තිබෙන දරදඬු පාලනයේ ප්‍රතිඵලයක් විධියට පහළ නිලධාරීනුත්, සිරකරුවනුත් දැඩි ග්‍රහණයකට, දඬු අඬුවකට හසුවෙලා තිබෙනවා. ඒ නිසා ඒ ගොල්ලන්ගෙන් සහන බලාපොරොත්තු වෙන්න බැහැ. අද ඒ ජනතාව මානසික අසහනයට පත්වෙලා ඉන්නවා.

අද අධිකරණ ක්ෂේත්‍රයේ නීතියේ විධාන සහ ආධිපත්‍යය මුළුමනින්ම බිඳවැටී තිබෙනවා. නඩු පැවරීමට අදාළ නීතිමය ක්‍රියා සිදු වන්නේ නීතිපතිතුමාගෙන් සහ නීතිපති දෙපාර්තමේන්තුවෙන්ය කියා මා විශ්වාස කරනවා. මේ තුළ තිබෙන අකාර්යක්ෂමතාව, ඒ කඹ ඇදීම නිසා අද බරපතළ ගැටලුවක් මතු වෙලා තිබෙනවා. අධිකරණවල ගොඩ ගැසී තිබෙන නඩු ප්‍රමාණය දිහා බැලුවාම, නීතිය ක්‍රියාත්මක වෙන්නේ කොහොමද කියා බලාගන්න පුළුවන්.

# නියමුවා

ජනතා විමුක්ති පෙරමුණේ මධ්‍යම පුවත්පත

464/20. පන්නිපිටිය පාර පැලවත්ත. බත්තරමුල්ල දුර. 0112-785612 Email: niyamuwanews@gmail.com











**48වැනි අප්‍රේල් විරු සමරුව - දෙස් විදෙස් සමරු අවස්ථා...**




**කැනඩා ජ.වි.පෙ. කමිටුවේ සම්මන්ත්‍රණ මාලාවෙන්...**



**පරිසරය රැකගැනීමට මැදිහත් වී...**



**ජ.වි.පෙ. ජපාන කමිටුවේ හමුවකදී ...**

# 71 විරු සගයන්ගේ අත්දැකීම් මතින් නව සමාජයක් වෙනුවෙන් පෙරට යමු

## ජනතා විමුක්ති පෙරමුණේ ප්‍රධාන ලේකම් ටිල්වින් සිල්වා සහෝදරයා



71 සගයන්ගේ විශ්වාසය, අත්දැකීම්, කැපකිරීම, ධෛර්යය, සටන්කාමිත්වය, සමාජ සාධාරණත්වය අරමුණු කරගනිමින් සටන් වදින්නටත් රට තුළ සැදිය හැකි දැවැන්තම පොදුජන ව්‍යාපාරය ගොඩනගන්නටත් කැපවන ලෙස ඉල්ලා සිටි ජනතා විමුක්ති පෙරමුණේ ප්‍රධාන ලේකම් ටිල්වින් සිල්වා සහෝදරයා නව සමාජයක් නිර්මාණය කරන ජයග්‍රහණය දක්වා නොනැවතී පෙරට යමු යැයි ඉල්ලා සිටියේය.

ඔහු මෙසේ පැවසුවේ පසුගිය 05වැනිදා අනුරාධපුරදී පැවති අප්‍රේල් විරු සමරු වැඩසටහනේදීය. මෙහිදී වැඩිදුරටත් අදහස් දැක්වූ ටිල්වින් සහෝදරයා මෙසේද පැවසීය.

"1971 අරගලය අපේ රටේ පළමු වතාවට ධනපති ආණ්ඩුවට එරෙහිව සිදු වුණු පළමු අවිගත් නැගිටීමයි. ඒ වගේම මෙය අපේ පංතියට දේශපාලනය කිරීමේ අයිතිය වෙනුවෙන් කරපු අරගලයක්. දුෂ්කරතා මැද ජීවත් වන නිර්ධන පන්තියට, වැඩ කරන ජනතාවට දේශපාලනය කිරීමේ නිදහස දීල තිබුණේ නැහැ. අපේ පන්තිය ධනේශ්වර දේශපාලනයේ අතකොලු බවට පත්කරල තිබුණේ. අපේ පන්තියට දේශපාලනය කිරීමට ශුද්ධ වූ අයිතියක් තියෙනවාය, එය උල්ලංඝනය කරන්න එනවා නම් එයට එරෙහිව සටන් වැද දිවි පුදන්න වුණත් සූදානම් බව කියන පණිවුඩය පළමුවරට දුන්නේ 1971. අද අපි සටන් වදින්නේ ආයුදවලින් නොවෙයි අදහස්වලින්. අපි ලැහැස්තියි අදහස්වලින් සටන් වදින්න.

ප්‍රජාතන්ත්‍රවාදය, මානවහිමිකම්, ජාතික සමගිය සඳහා සතුටින් සිටින සමාජයක් ගොඩනැගීමට කැපවෙමු. 71 සගයන්ගේ විශ්වාසය, අත්දැකීම්, කැපකිරීම, ධෛර්යය, සටන්කාමිත්වය, සමාජ සාධාරණත්වය අරමුණු කරගෙන උසස් යහපත් නව සමාජයක් නිර්මාණය කරන තුරු සටන් වදින්නට කැප වෙමු. රට හදන්න පුළුවන් දැවැන්තම පොදුජන ව්‍යාපාරය ගොඩනගන්න කැපවෙමු. ජයග්‍රහණය දක්වා නොනැවතී පෙරට යමු."

# මේ පරිච්ඡේදය අපි අවසන් කරන්නේ සමාජවාදී සමාජයකිනුයි

## ජනතා විමුක්ති පෙරමුණේ මධ්‍යම කාරක සභික සමන්ත විද්‍යාරත්න සහෝදරයා

71 වසරක් රට කළ පාලකයින් විසින් වංචාව, දූෂණය, ගණිකා වෘත්තිය, සූදුව, කුඩු, කර්මාන්ත දියුණු කර ඇති බවත් එමගින් රටට බිහිකරන්නේ අනුවණ, හැඟීම් විරහිත, ආත්මාර්ථකාමී තරුණ පරම්පරාවක් බවත් එබැවින් පවතින තත්වය වෙනස් කළ යුතු බවත් ඒ සඳහා ශක්තිය 71 විරුවන්ගෙන් උකහා ගත යුතු බවත් පෙන්වා දුන් ජ.වි.පෙ. මධ්‍යම කාරක සභික සමන්ත විද්‍යාරත්න සහෝදරයා ඉතිහාසයේ වත්මන් පරිච්ඡේදය අවසන් කළ යුත්තේ සමාජවාදී සමාජයක් ස්ථාපිත කිරීමෙන් බව අවධාරණය කළේය.

ඔහු මෙසේ පැවසුවේ පසුගිය 05වැනිදා මාතරදී පැවති අප්‍රේල් විරු සමරු වැඩසටහනේදීය. මෙහිදී වැඩිදුරටත් අදහස් දැක්වූ සමන්ත සහෝදරයා මෙසේද පැවසීය.

"මීට වසර 48කට පෙරාතුව අපේ මාතෘ භූමියේ උසස්ම මිනිස්සු, තමන් ගැන නොහිතා අනෙකා ගැන හිතපු මිනිස්සු, අසාධාරණය වෙනුවට සාධාරණය හිතපු මිනිස්සු, අයුක්තිය වෙනුවට යුක්තිය ප්‍රාර්ථනා කරපු මිනිස්සු මේ මිහිතලය සිප ගත්තා. ඒ සමාජයේ උසස්ම මිනිස්සු. ඔවුන් උත්තුංග කාර්යයක නියැලුනේ. මේ රටේ කුරිරු, අලුගෝසු පාලකයන් විසින් වට දෙකකදී මේ රටේ වටිනා මිනිස්සු ලක්ෂයකට එහා උදුරගන තියෙනවා. අපි සමරන්නේ ඒ මිනිස්සු. මේ මිනිස්සු සටනට ගියේ පඩි දීල නොවේ. තානාන්තර දීල, නිලතල දීල සටනට යැව්වා නොවේ. ඔවුන් මේ මාතෘ භූමියට ආදරේ කළා. සිංහල දෙමළ මුස්ලිම් ජනතාව වෙනුවෙන් ජාතික සමගිය ගොඩනගල සමාජවාදී රාජ්‍යයක් ඉතා දියුණු මනුසත් ගුණදම් සහිත යහපත් රටක් බවට මේක පත් කරන්න. ඔවුන් අපෙන් බලාපොරොත්තු වෙන්නෙ ඔවුන්



ජීවිත පරිත්‍යාග කරපු අරමුණ යථාර්ථයක් කරපල්ලා කියල. ඔවුන්ට පවත්වන්න පුළුවන් ඉහළම උත්තමාචාරය වෙන්නේ, ඔවුන් ප්‍රාර්ථනා කරපු සමාජවාදී සමාජයක් මේ රටේ ස්ථාපිත කිරීමෙන් බව අපි තේරුම් ගත යුතුව තිබෙනවා.

71 අත්දැකීම්, 88-89 අත්දැකීම් අපි ගන්න ඕනැ. මොකටද නැවත මර්දනයක් කැඳවා ගන්න නොවෙයි. මේක ගිනියම් වෙච්ච සමාජයක්. ආර්ථික කඩා වැටීමෙන් ගිනියම් වෙලා. සමාජ 11 වැනි පිටුවට

# 21වැනි සියවසට නව වමේ ව්‍යාපාරයක් අවශ්‍යයි

## ජනතා විමුක්ති පෙරමුණේ දේශපාලන මණ්ඩල සභික කේ.ඩී. ලාල්කාන්ත සහෝදරයා



ධනපති ක්‍රමයේ අර්බුද වැඩි වී තිබෙන නමුත් වමේ ව්‍යාපාරවලට බලය ලබා ගැනීමට නොහැකි වී තිබෙන බව පෙන්වා දුන් ජනතා විමුක්ති පෙරමුණේ දේශපාලන මණ්ඩල සභික කේ.ඩී. ලාල්කාන්ත සහෝදරයා සමාජවාදය වර්තමානයටත් වලංගු බවත් 21වන සියවසට නව වමේ ව්‍යාපාරයක් අවශ්‍ය බවත් මතුවෙන අනෙකුත් විමුක්ති අරගල වමේ ව්‍යාපාරයේ අරගල බවට පත්කරගත යුතුව තිබෙන බවත් අවධාරණය කළේය.

ඔහු මෙසේ පැවසුවේ පසුගිය 05වැනිදා මහනුවරදී පැවති අප්‍රේල් විරු සමරු වැඩසටහනේදීය. මෙහිදී වැඩිදුරටත් අදහස් දැක්වූ ලාල්කාන්ත සහෝදරයා මෙසේද පැවසීය.

"1965 ජ.වි.පෙ. බිහිකරන්නේ අරමුණක් ඇතිව. අපේ අරමුණ වුණේ සමාජවාදී රාජ්‍යයක් ගොඩනැගීම. ඒ සඳහා අපේ ඉලක්කයක් තිබුණා රාජ්‍ය බලය ලබා ගැනීම. 71 අරගලයට මුහුණ දෙන්නේ ඒ ගමනේදියි. අපේ පංතියට රාජ්‍ය බලය දෙන්න අකමැති පාලක පන්තිය ඒ ජීවිත විනාශ කළා. මේ ජීවිත උදුරා ගත්තා. අභීතව දණගහන්නේ නැතිව ශක්තිමත්ව ඒකට මුහුණ දීපු සහෝදරයෝ අපි අගය කරනවා මෙහෙම. පාවා දෙන්නෝත් ඕනෑ තරම් හිටියා. 71 පාවාදීම් කරපු අය පිළිබඳවත් සාකච්ඡාවක් තියෙනවා. දේශපාලන අරමුණක් වෙනුවෙන් මුහුණ දීපු කණ්ඩායම් දෙකක් හමුවෙනවා. දහදාහයි. 60 දාහයි. 30 දාහයි. නිදහස ලබා අවුරුදු 71 යි. ඒ කාලය තුළ වෙනම රාජ්‍යයක් අරමුණු කරගෙන 30කුයි, සමාජවාදය උදෙසා 70 දාහයි. එක් ආචාර්යතුමියක් ප්‍රකාශ කළා, අපි මේ පදිංචි වෙලා ඉන්නේ ශ්‍රී ලංකාව නමැති සොහොන් පිට්ටනයක් මත කියලා. තරුණ ලේවලින් පෙඟිච්ච මහපොළවක.

1965 ජනතා විමුක්ති පෙරමුණේ ආරම්භක පදනම වන්නේ ගම්බද උගත් තරුණ කොටස්. මේ උගත් තරුණ පිරිස් පැරණි වමේ ව්‍යාපාර අතහැර මේ අලුත් හැඩේ ව්‍යාපාරයත් සමග එක්වෙනවා. සමාජ වෙනසක් පිළිබඳ නැවුම් අදහස් තිබූ අය මේ ව්‍යාපාරයට එකතු වුණා. මේ මියගිය දහදාහ කියන්නේ හැදීගෙන ආ ව්‍යාපාරය. ඒ හැදීගෙන ආ පැළ දල්ලෙන් කඩල දැම්ම වගේ. ධනේශ්වර පාලකයෝ මේ තරුණ ජීවිත උදුරා ගත්තා. මේ 71 දහදාහත්, 88 -89 අවධියේ 60 දාහත්, වෙනම රාජ්‍යයක් ඉල්ලා සටන් කළ 30 දාහත් ගියාට පස්සේ මේක කාන්තාරයක්. මානව සම්පත් පැත්තෙන් බැලුවොත් ලාංකේය සමාජයේ සමාජීය වෙනස්කම් පිළිබඳ හැඟීමක් තිබුණ අලුත් සමාජයක් පිළිබඳ හැඟීමක් තිබ්බ, ඒ වෙනුවෙන් කැපකිරීම් කිරීමට සූදානමින් හිටපු, ඒ පිළිබඳ බලාපොරොත්තු තැබූ බලවේග. පවතින ක්‍රමය පවත්වාගෙන යාමට උවමනා අය, මේ පිරිසට දඬුවම් දුන්නා. මේ බලවේගයට ආකර්ෂණීය බලවේගයක් වුණා. කියුබානු විප්ලවය සහ සන්නද්ධ අරගලය. 75 වියට්නාම් විප්ලවය ජයග්‍රහණයෙන් ඉවර වෙනවා. අවසාන වතාවට සමාජවාදී රජයක් පිහිටුවනු ලබන්නේ නිකරගුවාවේ. 1979න් පස්සේ වසර 40ක කාලයට තුළ සමාජවාදී රාජ්‍ය බලයක් අලුතින් ගොඩනගලා නැහැ. 1989 බර්ලින් තාප්පය බිඳ දානවා. ඒ සමගම ලෝකයේ සමාජවාදී රටවල සමාජවාදය බිඳ වැටෙන්න පටන් ගන්නවා. අවසානයට 1991 සෝවියට් දේශය බිඳ වැටෙනවා. මේ කාලයෙන් පස්සේ සමාජවාදී රාජ්‍යයක් බිහි වුණේ නැහැ. දැන් ලෝකය පුරාම ගෝලීය ආර්ථිකය පැතිරිලා ගිහින් තියෙනවා.

65 සමාජය ඇතුළේ ආර්ථිකය, කෑම ප්‍රශ්නය, නිවාස ප්‍රශ්නය මූලික අවශ්‍යතාවයන් තමයි ජනතාවගේ ප්‍රශ්න වුණේ. 60 ගණන්වල 70 ගණන්වල සමාජය ඇතුලේ විවිධ විමුක්තීන් ගැන කතා තිබුණා. පුරුෂාධිපත්‍යය ගැන කතාවක් තිබුණා. නමුත් අපේ පක්ෂය ඇතුළේ එහෙම එකක් තිබුණේ නැහැ. අපේ අරමුණ වුණේ සමාජවාදය. මීට අවුරුදු 3කට කලින් පරිසරවේදීන් ප්‍රකාශ කළා 2030 වෙනකොට සෙන්ටිග්‍රේඩ් අංශක 1.5කින් උෂ්ණත්වය ඉහළ දමා නොගැනීමේ වගකීමක් තියෙනවා. එය පංති ප්‍රශ්නයක් නොවේ. ඒක වැඩකරන 11 වැනි පිටුවට


බත්තරමුල්ල, පැලවත්ත, පන්නිපිටිය පාරේ 464/20 හි පදිංචි එම්.ටිල්වින් සිල්වා වන මා විසින් අංක 43/20, නුගගහ පෙදෙස, පිළියන්දල පාර, මහරගම පිහිටි නියමුවා ප්‍රකාශන ආයතනයේ මුද්‍රණය කරවා ප්‍රසිද්ධ කරන ලදී.